# THE WHITE HACKLE

## JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY



OCTOBER 1997

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව



1997-09-02 දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේ පැවති ආධුනික සෙබල සෙබලියන්ගේ විසිරයාමේ පෙළපාලිය සඳහා ආරාධිත අමුත්තා වශයෙන් පැමිණි බ්‍රිගේඩියර් **TTR** ද සිල්වා **RWP RSP psc** විසින් සම්මාන මුරය පරීක්ෂා කරන අයුරු



1997-09-10 දින රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රීලපාහ හි පැවති සම්මාන පෙළපාලිය රෙජිමේන්තු සේනාධිනායක ශ්‍රීලපාහ විසින් පරීක්ෂා කිරීමට පැමිණි අවස්ථාව



ආධුනික විසිර යාමේ උත්සවයට සහභාගී වූ ආරාධිත අමුත්තා ආධුනිකයන් හා උපදේශක මඩුල්ල වෙත පවත්වන ලද ස්තුති කථාව



1997-09-10 දින රෙජිමේන්තු සේනාධිනායක ශ්‍රීලපාහ සම්මාන පෙළපාලිය පරීක්ෂා කරන අයුරු



1997-09-02 දින ආධුනික සෙබල/සෙබලියන්ගේ තෑගි ලැබූවන් වෙත ප්‍රධාන අමුත්තා විසින් තිලිණ ප්‍රධානය කරන අවස්ථාව

# THE WHITE HACKLE

OCTOBER 1997, VOLUME 04 NO. 04



ස්වයං නිවාස තැනීමේ ව්‍යාපෘතිය

පිටුව 08



ජයසිකුරු ප්‍රතිප්‍රහාර 10 ශ්‍රීලපාහ

පිටුව 28



2(සෙව්) ශ්‍රීලපාහ විකට ඇඳුම් තරගය

පිටුව 37

## Headlines


| | |
|---|---|
| ඉන්දු ලංකා ගිවිසුමේ බලපෑම (1997 ජූලි) | 4 |
| මනෝ විද්‍යාත්මක යුධ ශිල්ප හා වර්තමාන යුධ පසුබිම | 13 |
| **Important Events** | 19 |
| තල් අරඹ | 22 |
| බළඇණි දින 07 වන සමරුව - 6 ශ්‍රීලපාහ | 27 |
| ජයසිකුරු ක්‍රියාත්විතය කනකරායන්කුලම් ප්‍රහාරය | 32 |
| 2 (සෙව්) ශ්‍රීලපාහ 116 වන සංවත්සරය සැමරූ වගයි | 37 |


PRINT WELL (PVT) LTD.

# Feedback

## අදහස් උදහස් හා විවේචන

# Readers Please Write in

THE WHITE HACKLE
**SRI LANKA**
**LIGHT INFANTRY MAGAZINE**

**Col of the Regt.**
Major General AK Jayawardhana, RWP, RSP, rcds, psc

**Oftg. Centre Commandant**
Lieut. Col. JS Masakkara SLLI

*The White Hackle*, Staff

**Editor-in Chief** - Lieut. Col JS Masakkara SLLI

**Associate Editor** - Major KJ Jayaweera SLLI
Major IGRG Bogodawatte
Major DM Wijeratne

**Chief Consultants** - Maj. Gen. AK Jayawardhana, RWP, RSP, rcds, psc

**Honorary Consultants** - Maj. Gen. HV Athukorale VSV, psc - FBIM (Rtd) (Reg force)
Brigadier AER Abeysinghe KSV (Rtd) (vol force)

**Publisher** - Regimental Centre
Sri Lanka Light Infantry.

*The White Hackle* - is published quarterly under the Supervision of the Regimental Commander to provide the Regiment with information on people, policies, Operations, technical developments, views, opinions and ideas about the SriLanka Light Infantry. ◆ Manuscripts of interest to the Regiment are invited. ◆ Direct Communication is authorized to Editor, or Asst Editor The White Hackle, Regimental Centre, Army Cantonment Panagoda, Homagama, Phone 855204 or 437073 - 4 Extn 4340 or 4341. ◆ Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. ◆ Publication of this periodical is authorized by the Dte of PA, Army HQ CBO by letter No. A/275/27 of 16 Mar '94 ◆ Use of Funds for printing this publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conferance held at Welioya.

The WHITE HACKLE, the Voice of the Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the seventh issue.

We should not rest on our laurels. Targets have to be set. Greater goals achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome. What is valued is our making the attempt, then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through "The White Hackle" the journal of the oldest and proudest Regiment of them all' If you have much to say about your Battalion's experience go ahead and write in to the "WHITE HACKLE'. We are willing to accept and use what is of a standard, like sketches, stories and poems, whatever comes from your thoughts and your pen.

Our Motto is "Ich Dien", I Serve"/ Let "WHITE HACKLE" be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all a happy New Year '96 and Compliments of the Season.

*Editor in Chief*

### හිතවත් පාඨකය, කරුණාකර ඔබගේ අදහස් අප වෙත එවන්න

ශ්‍රී ලංකා පාබල හමුදවේ හඩ ඉතා උසස් ලෙස නංවන 'වයිට් හැකල් සහරාවේ' තෙවන කලාපයත් සමග එහි ළදරු අවධිය අවසන්කල අප ඉතා විශ්වාස වන්තව ඉදිරියට පිය ඔසවමින් පරිනත භාවයට පත් වෙමින් සිටින්නෙමු. රෝම අධිරාජ්‍යය ඉතා කෙටි කලකින් ගොඩ නැගුවක් නොවන අතර අපි ද පියවරින් පියවර ඉතා විශ්වාසවන්තව ස්ථිර අඩිතාලමක් සඳහා ඉදිරියට ගමන් කරමින් සිටින්නෙමු.

එනමුත් අප දැනට ලබා ඇති ප්‍රගතියෙන් සෑහීමකට පත්විය නොහැක, තව ඉදිරියට යා යුතු මග බොහෝ ය. එය දුෂ්කර ද නැතහොත් බාධාවකින් තොර වන්නේ දැයි තීරණය වන්නේ ඔබගෙන් ලැබෙන මහඟු සහයෝගය මතය. 'වයිට් හැකල් සහරාවේ' ප්‍රගතිය සඳහා අප සියලු දෙනාටම ඉටු කිරීමට ඇති කාර්යභාරය ඉමහත් ය. ඔබගෙන් සුළුවෙන් හෝ අප වෙත ලැබෙන සහයෝගය සෑම අවස්ථාවකම අපි අගයමු. අවශ්‍ය වන්නේ ඔබගේ උත්සාහයයි. එයින් අප වඩාත් ධෛර්යමත් වන අතර අපගේ කාර්යය නිසි අයුරු ඉටු කිරීමට අවශ්‍ය පන්නරය ලබන්නෙමු.

මෙම සහරාව පිළිබඳ හා එහි ලිපි රචනා පිළිබඳ ඔබගේ අවංක අදහස් හා විවේචන අප වෙත එවන්න. එය වයිට් හැකල් සහරාවේ ඉදිරි ගමනට මහඟු අත්වැලකි. 'වයිට් හැකල් සහරාව' ශ්‍රී ලංකා යුධ හමුදවේ අභිමානවත් ඉතිහාසයට හිමිකම් කියන පෞඪ තම රෙජිමේන්තුවක් වන ශ්‍රී ලංකා පාබල හමුදව මගින් ත්‍රෛයි මාසිකව පල කරනු ලබයි.

මෙම පෞඪ රෙජිමේන්තුවේ සාමාජිකයෙකු හා සාමාජිකයෙකු වී සිටීම ගැන ඔබ ඔබ ගැනම ආඩම්බර විය යුතු ය. මෙම රෙජිමේන්තුව අනාධිමත් කලක් රැකගත් විලසට අප විසින් එය ඉදිරියට ද සුරැකිය යුතුය.

ඔබ බලඇණිවල යම් විශේෂ සිදුවීම් හා අවස්ථා පිළිබඳ ඔබ හට පැවසීමට ඇත්නම් 'වයිට් හැකල් සහරාව' වෙත ලියන්න. ඔබගේ ලිපි ඉතා උසස් තත්වයක ඇතැයි අප විශ්වාස කරන අතර එම ලිපි 'වයිට් හැකල් සහරාවේ' පල කිරීමට අප පුල පුලා බලා සිටින්නෙමු. එමෙන්ම ඔබගේ උසස් කවි සංකල්පනා හා සිතුවම් සඳහා ද මෙම සහරාවේ ඉඩ ප්‍රස්ථාව ඇත.

අපගේ ආදර්ශ පාඨය යන 'සේවය කරමි' මත පිහිටා අප එකිනෙකාට, රෙජිමේන්තුවට, හමුදවට හා රටට සේවය කරමු. අපගේ පාබල හමුද ධජය ඉතා විශ්වාසවන්තව, අභිමානයෙන්, ඉතා ඉහලින් ලෙලදුන් විලසටම, තව දුරටත් ලෙලදීමට අවස්ථාව උද කර දෙමු.

ප්‍රධාන කර්තෘ

**THE WHITE HACKLE** is for Members of the SLLI, their Families, Ex-Servicemen of SLLI and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We invite readers' views. Under 150 words - a post card will do - and include your name, rank and address. We'll withhold your name if you so desire and may condense your views because of space. We can't publish or answer every one, but we'll use representative views. Send your letters to:

**Feedback,**
The White Hackle,
RHQ SLLI, Army Cantonment,
Panagoda, Homagama

# උතුරු නැගෙනහිර ඒකාබද්ධ මෙහෙයුම් ආඥපති මේජර් ජෙනරාල් ඒකේ ජයවර්ධන, ආර්ඩබ්පී, ආර්එස්පී, විසින් රාජකාරි නිමා වීමට ප්‍රථම නිකුත් කරනු ලබන පණිවිඩය

1996 නොවැම්බර් මස 01 දින මා ඒකාබද්ධ මෙහෙයුම් ආඥපති වශයෙන් රාජකාරි භාර ගැනීමෙන් පසු 1997 නොවැම්බර් මස 02 දින නව ඒකාබද්ධ මෙහෙයුම් ආඥපති වන මේජර් ජෙනරාල් සීඑස් වීරසූරිය, ආර්එස්පී, යූඑස්පී හට භාර දීමට නියමිත ය.

මෙම වසර තුළ විවිධ ක්‍රියාන්විතයන්ට සහභාගි වෙමින් යුධ හමුද ඉතිහාසයේ විශාල කාල පරිච්ඡේදයක් පසු කරමින් යන අවස්ථාවේ සෑම විටම අප ජයග්‍රහණයන් ලබා ඇති අතර, ත්‍රස්ථවාදීන් කොතෙකුත් නැත් කළ ද, ඔවුන්ගේ ඉලක්ක සපුරා ගැනීමට ඉඩ නොදුන් අතර, අප අපගේ ඉලක්ක කරා ලඟා වෙමින් ඔවුන් පරාජය කරමින් තව දුරටත් ජයග්‍රහණය කරා යන ගමනේ දී, උතුරු නැගෙනහිර හා 'ජයසිකුරු' මෙහෙයුමේ නිරත ව සිටින සියළුම නිලධාරීන් / සෙනින්ට ද/ සිවිල් සේවක මහතුන්ට ද, මා සමග ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානයේ සේවය කළ නිලධාරී සෙනින්ට ද/ සිවිල් සේවක මහතුන්ට ද මාගේ කෘතඥතාවය මෙයින් පුද කරමි.

ප්‍රථමයෙන් යාපනය අර්ධද්වීපය, නැගෙනහිර ප්‍රදේශය සහ මන්නාරම ප්‍රදේශයේ රාජකාරි කරමින් සාර්ථකව මහ ජනතාවගේ සිත් දිනා ගනිමින් සිටින අප හමුදව මෙම කාලය තුළ දී විශේෂ ක්‍රියාන්විත කීපයක් සිදු කරන ලදී. එමගින් යාපනය වලිකාමම් බටහිර ප්‍රදේශය ත්‍රස්ථ ග්‍රහණයෙන් මුද ගැනීමත් සමහ යාපනය අර්ධද්වීපයේ ත්‍රස්ථවාදීන් යටතේ ඉතිරිව සිටි ජනතාවටත් හමුද සහාය ඇතිව තම ජන ජීවිතය සකසා ගැනීමට ඉඩ සැලසින.

වසර ගණනාවක් වසා දමා තිබූ වව්නියාව මන්නාරම් මාර්ගය 'එඩිබල' මෙහෙයුමෙන් පසු හමුද ආධිපත්‍යයට අත්පත් කර ගැනීමත් සමහ වසර ගණනාවක් තනිව පැවැති ප්‍රදේශයක් වන තල්ලඩි මන්නාරම් ප්‍රදේශය වෙත වව්නියාවේ සිට ගොඩබිමින් ගමන් කිරීමට අවකාශ ලැබීමත් එම ප්‍රදේශය තුළ සාමාන්‍ය ජන ජීවිතය නහා සිටුවීමට හැකිවීමත් පුත්තලම - විල්පත්තු ප්‍රදේශයේ ආරක්ෂාව තහවුරු කිරීමත් මේ යන ගමනේ මේ වසර තුල අප ලැබූ විශාල ජයග්‍රහණයකි.

වසර ගණනාවක සිටම වව්නියාව සිට කිලිනොච්චිය වෙත ගොඩබිම් මාර්ගයක් සකසා ගැනීමට රජයට අවශ්‍යව තිබූ අතර. කි.මී. 80 ක් පමණ දුරැති මෙම මාර්ගය විවෘත කිරීම සඳහා 1997 මැයි මස 'ජයසිකුරු' මෙහෙයුම දියත් කරන ලදී. මේ අවස්ථාව වන විට ත්‍රස්ථවාදීන්ගේ බලය විනාශ කරමින් එම මාර්ගයේ 2/3 ක් පමණ හමුද පාලනය යටතට ගැනීමත් සමහ මෙම මෙහෙයුමෙන් දනටමත් ඉමහත් ජයග්‍රහණයක් ලබා ඇති බැව් මහත් අභිමානයෙන් යුක්තව ප්‍රකාශ කරමි.

'ජයසිකුරු' මෙහෙයුමේ සේනාංක වව්නියාව ප්‍රදේශයේ සිටත්, වැලිඔය ප්‍රදේශයේ සිටත් සතුරාගේ තදබල ප්‍රතිප්‍රහාරයන්ට අභීතව මුහුණ දෙමින් ප්‍රථම අධියර වශයෙන් පුලියන්කුලම හා නැදුන්කර්නි ප්‍රදේශය අත්පත් කර ගන්නා ලදී. මේ සමහ වව්නියාව උතුරු ප්‍රදේශයේ සහ වැලිඔය ප්‍රදේශයේ විශාල භූමි ප්‍රමාණයක බලය අප හමුදව තහවුරු කිරීමෙන් එම මායිම් ගම්මානවල වෙසෙන ගැමි ජනතාවට බියකින් තොරව වාසය කිරීමට අවස්ථාව උද කෙරින. දෙවන අධියර ආරම්භ කරමින් පුලියන්කුලම සිට මාන්කුලම්, මුලතිව් මාර්ගය හරස්වන පරිදි මෙහෙයුම නිම කිරීමෙන් මෙතෙක් ත්‍රස්තවාදීන් අත පැවතුන ඔවුන්ගේ ඉතිරිව තිබූ ප්‍රධාන සැපයුම් මාර්ගය ද ඔවුන් අතින් ගිලිහින. මෙමගින් අපගේ ජයග්‍රහණය තව දුරටත් තහවුරු කෙරින.

'ජයසිකුරු' මෙහෙයුම දියත් කිරීමත් සමහම ආරම්භයේ දී ත්‍රස්ථවාදීන් 8000 ක් හා මුහුදු ත්‍රස්ථවාදී බලකායට අයත්ව සිටින ත්‍රස්ථවාදීන් 2000 ක් පමණ පිරිසෙන් මේ වන විටත්, ත්‍රස්ථවාදීන් 3000 කට අධික පිරිසක් මරුමුවට පත් කිරීමටත්, 1300 කට අධික පිරිසකගේ අත්පා අහිමි කර හා එකතුව 3000 කට වැඩි පිරිසක් සඳහටම අබ්බගාතයන් කර යුධ පිරිසෙන් පලවා හැරීමටත්, හැකිවී ඇති බැව් ඔවුන්ගේ පණිවිඩ හුවමාරු, ඇසින් දුටු සාක්ෂි හා බුද්ධි තොරතුරු මගින් තහවුරු වී ඇත. මෙයින් ඔවුන් ලද පරාජය හේතුකොට ගෙන ඔවුන්ගේ සගයන් බොහෝ දෙනෙක් දන් දන් අප හමුදව වෙත භාරවීමට පටන් ගෙන ඇත. කොටි ත්‍රස්ථවාදීන් අප හමුදව සමහ යුධ වැදීම ආරම්භ කළ දින සිටම කිසියම් මෙහෙයුමකින් හෝ කිසියම් කාල පරිච්ඡේදයක මෙතරම් ගණනක් මැරුම් කා නොමැති අතර මෙවැනි ප්‍රමාණයක් තුවාල ලබා යුධ පිටියෙන් සදකාලිකවම ඉවත් කර නොමැත. ත්‍රස්ථවාදීන් මීට ප්‍රථම ඉතිහාසයේ කිසිම අවස්ථාවක මෙවැනි අන්දමින් පරාජය වී මෙවැනි තත්වයකට මුහුණ පා නොමැත.

මේ අනුව තවදුරටත් ත්‍රස්ථවාදීන් මැඩලමින් 'ජයසිකුරු' ක්‍රියාන්විතය නිම කිරීම සඳහා අපහට තවත් ඇත්තේ කි.මී. 20 ක පමණ දුර ප්‍රමාණයක් වන අතර, මෙම වසර අවසන් වීමට පෙර මෙය නිමකල හැකි බවට පොරොන්දු වී සිටියෙමි. මේ සඳහා නව ඒකාබද්ධ මෙහෙයුම් ආඥපතිට සහ මෙහෙයමේ යෙදී සිටින සියළු නිලධාරී/සෙනින්ට ඒ සඳහා ශක්තිය හා ධෛර්ය ලැබේවායි මාගේ එකම ප්‍රාර්ථනයයි.

අවසන් වශයෙන් 'ජයසිකුරු' මෙහෙයුම ඇතුළු අනිකුත් සියළුම ක්‍රියාන්විතයන්හි දී රට දය වෙනුවෙන් දිවි පිදූ සියළු රණවිරුවන් ද ඔවුන්ගේ ඥතීන් ද සිහිපත් කරන අතර, එම රණවිරුවන්ගේ නාමය සද අමරණීය ලෙස ඉතිහාස ගතවනු ඇත. එසේම තුවාල ලබා සිටින රණවිරුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන අතර, මෙම මෙහෙයුම සඳහා සහාය දක්වූ නාවික, ගුවන් හා පොලිස් හමුදවන්හි නිලධාරී/සෙනින්ගෙන් ලැබූ නොමසුරු සහාය ද, රාජ්‍ය/රාජ්‍ය නොවෙන සිවිල් නිලධාරීන්ගෙන් ද මේ සඳහා ලද සහායට මාගේ භක්ති ප්‍රණාමය පුද කරනු කැමැත්තෙමි.

'අනාගතයේ දී මේ සියළු රාජකාරීන් ඉටු කිරීම සඳහා ඔබහට ශක්තිය ධෛර්ය ලැබේවායි එක සිතින් ප්‍රාර්ථනා කරමි.'

'ඔබට තෙරුවන් සරණයි'

**එකේ ජයවර්ධන, ආර්ඩබ්පී, ආර්එස්පී**
මේජර් ජෙනරාල්
ඒකාබද්ධ මෙහෙයුම් ආඥපති
අත්සන් කලේ -
1997 ඔක්තෝබර් 31 දින

# ඉන්දු ලංකා ගිවිසුමේ බලපෑම (1997 ජූලි)

ඉන්දියාව දකුණු ආසියාතික කලාපයේ තිබෙන යුධ ශක්තියෙන් හා ආර්ථික ශක්තියෙන් හෙබි වෙනත් කලාපීය රටවලට පැහැදිලි බලපෑමක් එල්ල කළ හැකි උප මහාද්වීපයකි. සාමාන්‍ය වශයෙන් ඉන්දියාව තමා වටා සිටින සියලුම රටවල්වලට යුද්ධමය හා සංස්කෘතිකමය බලපෑම්. එල්ල කිරීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධියක් උසුලති. උදා: ඉන්දු චීන අර්බුදය, ඉන්දු පාකිස්ථාන් දේශසීමා අර්බුදය හා වක්‍ර වශයෙන් පැන නැගී ඇති ඉන්දු ලංකා ප්‍රශ්ණය පෙන්විය හැක.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර, ඇති අනෝන්‍ය සහයෝගය මෙන්ම සීතල යුද්ධය ද හේතු කොට ගෙන බොහෝ මත භේදයන්ට තුඩු දුන් හා ශ්‍රී ලංකාවේ ජන වාර්ගික ප්‍රශ්ණය හා සන්නද්ධ අරගලය නවතම අතකට යොමු කරමින් ඉන්දු ලංකා ගිවිසුම 1987 ජූලියේ දී අත්සන් කරනු ලැබිණි. නිදහසේ සිට, ඉන්දියානු සම්බන්ධය නිසා ශ්‍රී ලංකාව මුහුණ දුන් ප්‍රධාන ප්‍රශ්ණ තුනකි.

1. ඉන්දියානු සම්භවයක් සහිත විශාල ජනගහනයක් ශ්‍රී ලංකාවේ සිටීම හා ඔවුන්ගේ අපහැදිලි හා අක්‍රමවත් ඉන්දියානු සංක්‍රමණය.
2. ඉන්දියාව සමග ශ්‍රී ලංකාවේ පැවැති අසමතුලිත වෙළඳම
3. ද්‍රවිඩ බෙදුම්වාදී සංවිධාන හා ඒවායේ අයහපත් ප්‍රතිඵල

ඉහත ප්‍රශ්ණවලට දීර්ඝ කාලීනව සෙවූ විසඳුම්වල තාවකාලික අතුරු ඵලයකි ඉන්දු ලංකා ගිවිසුම.

ශ්‍රී ලංකාවේ නැසීගිය ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන සහ ඉන්දියාවේ ඝාතනයට ලක් වූ අගමැති රජීව් ගාන්ධි විසින් එම ගිවිසුම 1987 ජූලි 29 වනද කොළඹ දී අත්සන් කරනු ලැබිණි. මෙම ගිවිසුම් කෙටුම්පත සකස් කිරීමේ දී ඉන්දියානු අගමැතිට ඉතා දක්ෂ හා පළපුරුදු දේශපාලඥයින් රැසකගේ උපදෙස් ලැබුණු අතර, ශ්‍රී ලංකාව වෙනුවෙන් අත්සන් කළ ජනාධිපති ජයවර්ධන තම දේශපාලන උපදේශකයින්ගේ හෝ අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් අපේක්ෂා නොකරමින් ගිවිසුමේ වගකීම දරීය. එහි ප්‍රතිඵලය වූයේ ඉන්දියානු ජනතාව කිසිම විරෝධයක් නොදක්වමින් ගිවිසුමට ප්‍රතිචාර දක්වීම හා ශ්‍රී ලංකාවේ තදබල ජන විරෝධය, පෙළපාලි, අලාභහානිවීම් හා ඇඳිරිනීතිය මධ්‍යයේ ගිවිසුම පිළිගැනීමයි.

ගිවිසුම අත්සන් කර පැය කිහිපයකදී දෙදහසකට අධික (2000) ඉන්දියානු හමුදවක් යාපනයේ පලාලි වෙත ගොඩ බැස්ස වූ අතර, එය ක්‍රමයෙන් 80000 ක් දක්වා වර්ධනය විය.

ප්‍රධාන කොටස් 03 කින් සමන්විත ඉන්දු ලංකා ගිවිසුමේ දෙවන කොටසේ වගන්ති 18 කින් යුතු ය. එහි සැලකෙන වැදගත් කරුණු මෙසේ ය.

ඉන්දියානු හමුදව දෙමළ බෙදුම්වාදීන්ව පැය 48 ක් තුළ නිරායුධ කළ යුතුය (උප වගන්ති නො. 02.09)

ශ්‍රී ලංකා සිර අඩස්සියේ සිටින සියලුම ද්‍රවිඩ ත්‍රස්තවාදීන් නිදහස් කළ යුතුය. උතුරු නැගෙනහිර පලාත් සම්ප්‍රදායික ද්‍රවිඩ නිජබිම ලෙස පිළිගත යුතුය.

මේ සම්බන්ධයෙන් අවශ්‍ය වෙනත් ඕනෑම මොහොතක ඉන්දියාව යුධමය වශයෙන් ශ්‍රී ලංකාවට උදව් කළ යුතුය.

නමුත් ලංකාවේ ද්‍රවිඩ ත්‍රස්ථවාදීන් ඉතා සුළු කොට තකමින් හා ශ්‍රී ලංකා යුධ හමුදව මෙතෙක් ද්‍රවිඩ ත්‍රස්ථවාදීන්ට විරුද්ධව මෙහෙය වූ සටන් සුළු කොට තකමින් පැය 48 ක් තුළ නිරායුධ කිරීමට බලාපොරොත්තු වූ ඉන්දියන් හමුදවට 80,000 ක හමුදවක් සමග වසර දෙකක් තුලදී වත් සපුරාගත හැකි නොවුණු මිදුණු සිහිනයක් පමණක් විය. නමුත් මෙම ගිවිසුම නිසා ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය යම් ප්‍රමාණයකින් ඉන්දියාවට නතුවීමක් සිදු වූ අතර, ශ්‍රී ලංකාවට, ඉන්දියාවට එරෙහිව සුළු හෝ බලපෑමක් නොකල හැකි තරමට බැඳී තිබීම විශේෂයි. උදා:- ශ්‍රී ලංකාවට ඉන්දියාවේ පූර්ව අනුමැතියකින් තොරව හෝ අකමැතිව ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලය හෝ වෙනත් ඕනෑම වරායක් වෙනත් විදේශික බළයකට යොදගැනීමට දීම නොකළ හැකිය.

බලය බෙදීම සම්බන්ධව සෙසු අතුරු ඵලය වූයේ පළාත් සභා ක්‍රමයයි. මෙම පළාත් සභා මැතිවරණ (උතුරු ප්‍රදේශ) ප්‍රධාන ලෙස පැවැත්වූයේ ඉන්දියානු හමුද අධීක්ෂණය යටතේය. එය ඒකීය නිදහස් පළාත් සභාවක් ලෙස ස්ථාපිත වූ අතර, පළාත් සභා ඉලක්කය සපුරා ගැනීම අතින් සම්පූර්ණයෙන් අසාර්ථක විය. එහි ප්‍රතිඵලයක් වූයේ මෙම ස්වාධීන ඒකකය නිළ නොළත් ඊලාම් රාජ්‍යයක් බවට පත් වීමයි.

නැගෙනහිර පළාත් සභාව සම්ප්‍රදයික ද්‍රවිඩ භාෂාව කතා කරන ජනතාවගේ ස්වාධීන ඒකකයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම මගින් දෙරවේම රාජ්‍ය නායකයින් විසින් නැගෙනහිර ජීවත් වන සිංහල හා මුස්ලිම් ජනතාව පිළිබඳව හා ඔවුන්ගේ සංස්කෘතික උරුමයන් සම්බන්ධව සැලකීමක් දක්වා නොමැත. මුළු ද්‍රවිඩ ජනගහනයෙන් දෙකෙන් එකක් පමණ ජනගහනයක් ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල විසිරී ජීවත් වන අතර, ද්‍රවිඩ නිජ භූමිය ලෙස පිළිගෙන ඇති උතුරු නැගෙනහිර ජනගහනය කෙරෙහි පමණක් මෙමගින් වැඩි අවධානයක් යොමු කර ඇත.

ජාත්‍යන්තර පිළිගැනීම අතින් සලකා බලන විට ලෝකයේ ඉදිරියේ ඉන්දු ලංකා ගිවිසුමට නීතිමය පිළිගැනීමක් නොමැත. ඉන්දීය පාර්ලිමේන්තුවට මෙම ගිවිසුම ඉදිරිපත් කර සම්මත කර ඇති නමුත්, එය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කිසිදු සම්මතයක් සඳහා ඉදිරිපත් වූවක් නොවේ. ලෝකයේ සම්මත පිළිගැනීමක් ඇති ගිවිසුමක් වීමට නම් එය එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 102 වන වගන්තිය යටතේ නිව්යෝක් නුවර එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ ලියා පදිංචි කළ යුතුය. නමුත් ඉන්දු ලංකා ගිවිසුමට එසේ ජාත්‍යන්තර දෛනික බලයක් ලබාගෙන නොමැත. මෙම නිසා කිසියම් හෝ රටක් එය කඩකිරීම සම්බන්ධයෙන් අනෙක් රටට ජාත්‍යන්තර උසාවියේ (අයිසිජේ) වෙත යා නොහැක.

ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතා ඉන්දියානු සාම සාධක හමුදව නැවත තම රටට ගෙන්වා ගන්නා ලෙස ඉන්දියාවෙන් ප්‍රසිද්ධ ආයාචනයක් කළේ 1989 ජූනි 01 වන ද බත්තරමුල්ල විවේකාශ්‍රාමයේ දී කරන ලද කථාවක දීය. නමුත් සම්පූර්ණයෙන් ඉන්දියානු හමුදව ඉවත් කර තව දුරටත් එල්ටීටීඊ

ත්‍රස්තවාදීන් පෝෂණය වීම වැළැක්වීම වෙනුවට ඒකාබද්ධ හමුද මෙහෙයුම් මගින් මර්ධනය කිරීම වඩා සුදුසු පිළිතුර වුවත් එය ක්‍රියාත්මක නොවුණි.

සමස්ථයක් ලෙස ගිවිසුම කෙරෙහි ශ්‍රී ලංකාවේ බැඳීම් හරියාකාරව ඉටු කෙරුනු අතර, ඉන්දියාවේ බැඳීම් සාර්ථක නොවිණි. එම නිසා ගිවිසුමේ වටිනාකම පහත වැටිණි. ඉන්දියන් හමුදව පැමිණීමට පෙර හා පැමිණ ආපසු ගිය පසු ද සෑම දෙනාම ශ්‍රී ලංකා හමුදවේ කාර්යක්‍ෂමතාවය පිළිබඳ බැලූවේ සැකමුසු ඇසිනි. නමුත් ශ්‍රී ලංකා හමුද මේ කාර්යක්‍ෂමතාවය හා කැපවීම හමුවේ ඉන්දිය හමුදවේ පිරිස් බලය තැකිය නොහැකි බව මෑත කාළයේ ඔප්පුවෙමින් පවතී.

ගිවිසුම් ප්‍රකාරව ඉන්දියන් හමුදව ලංකාවට එවීමෙන් සිදුවූ බලපෑම් දෙකකි.

1. රජීව් ගාන්ධි ඝාතනය කිරීමට එල්ටීටීඊ සංවිධානය ක්‍රියාත්මක වීම

2. රජීව් ඝාතනයත් සමග ඉන්දියානු රහස් ඔත්තු සේවාවල උකුසු ඇසට එල්ටීටී සංවිධානය ඉලක්ක වීම.

ඉහත කරුණු දෙක නිසා ඉන්දියාවෙන් ගිවිසුම අත්සන් කිරීමට පෙර ත්‍රස්තවාදීන්ට තිබූ හොඳ හිත හා ස්හයෝගය ගිලිහිනි. එය ශ්‍රී ලංකා හමුදවන්ට වෙස්වලාගෙන පැමිණි ආශිර්වාදයක් විය. එය මෙරට පමනක් නොව එල්ටීටීඊ ය හමුදමය නොවන ආකාරයෙන් ක්‍රියාත්මක වූ අනිකුත් රටවල සංවිධානයන්ටද තම කටයුතු ඉටු කිරීමේ දී තර්ජනයක් විය.

ගිවිසුම් නිර්මාතෘ ජේ. ආර්. ජයවර්ධන මහතා තමා විසින් ම ප්‍රකාශයක් කරමින් ඉන්දු ලංකා ගිවිසුමේ තිළ වටිනාකම බිඳ වැටී ඇති බව පිළිගත්තේය. (92.09.20 සන්ඩේ ඔබ්සවර්) නමුත් ඉන්දියානු නිලධාරීන් තවමත් පිළිගන්නේ ශ්‍රී ලංකාවේ බෙදුම්වාදී ප්‍රශ්නයට හොඳම පිලිතුර ගිවිසුම ක්‍රියාත්මක කිරීම බවයි. එය වාසිදයක වෙතත් අතුරු ඵල නිසා වේ. නමුත් එසේ වුවහොත් තවමත් ඉන්දියානු යුධ සහය ලබාගැනීමේ හැකියාව ඇති විය හැක.

කෙසේ වුවත් ශ්‍රී ලංකා හමුදව දනටමත් ඉන්දියානු හමුදවට හා ශ්‍රී ලංකා හමුදව කෙරෙහි මූලික විශ්වාසය නොතැබූ ශ්‍රී ලාංකීක දේශපාලන නායකත්වයට අවශ්‍ය පිළිතුරු සපයමින් සිටී.

**පී. ඩී ජේ සී ප්‍රේමතිලක, ශ්‍රීලපාහ**
**ලුතිතන්**
**බුද්ධි නිළධාරී - 1 ශ්‍රීලපාහ**

# මතක පොතෙන් එක් පිටුවක්

1. රිවිරැස ක්‍රියාන්විතයෙන් පසු යාපනය කෝපායි ප්‍රදේශයේ ස්ථානගතව සිටි 7 වන ශ්‍රී ලංකා පාබල හමුදව මාස 05 ක මණ කාලසීමාවකින් පසු යාපනය අරියාලය ප්‍රදේශයට පැමිණ ස්ථානගත වන ලදී. ඉතා ජනාකීර්ණ ප්‍රදේශයක් වන එහි දී අප 'සී' කණ්ඩායම ස්ථානගතවීම සඳහා කොලොම්බුතුරෙයි එවකට අණදෙන නිලදරීව සිටි ලූතිතන් කර්නල් කේඒඩීජ් කරුණාසේකර ආර්එස්පී ශ්‍රීලපාහ විසින් තෝරා ගනු ලැබිණි. එතැන් පටන් අප කණ්ඩායම කොලොම්බුතුරෙයි ප්‍රදේශයේ රාජකාරි කරන ලදී.
2. සිවිල් පරිපාලනයට යටත් වූ ප්‍රදේශයක් බැවින්, මෙම ප්‍රදේශයේ සිවිල් පුද්ගලයන් හා සම්බන්ධව ද කටයුතු කිරීමට අවස්ථාවක් අපහට ලැබුණි. එමෙන්ම වරින් වර අපගේ මාර්ග බාධක කීපයකටම ත්‍රස්තවාදීන් සැඟවී සිට අත් බෝම්බ ප්‍රහාරයන් එල්ල කරන ලදී. එහෙත් ඔවුන් අල්ලා ගැනීමට නොහැකි වූ ප්‍රධානම හේතුව වූයේ විශාල සිවිල් ජන කොටසක් එම ප්‍රදේශයේ පැතිරී සිටීමයි. එනමුදු ඉතාමත් කෙටි කාල සීමාවක් තුලදී ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ විශ්වාසය දිනා ගැනීමට අප කණ්ඩායමට හැකිවිය.
3. දිනක් සිවිල් පුද්ගලයකුගෙන් ලද තොරතුරක් අනුව එවකට නිලධාරී අණදෙන සිටි කපිතන් එච්එල්එන් ජයවර්ධන ශ්‍රීලපාහ එම ප්‍රදේශය වටලා සෙවීම ක්‍රියාන්විතයක් සඳහා සූදනම් වීමට ඛණ්ඩ භාර නිළධාරීන්වූ අපහට උපදෙස් දෙන ලදී. 1996.07.13 දින රාත්‍රි ක්‍රියාන්විතයට අදල නියෝග ලබාදී පසුදින අලූයම ක්‍රියාන්විතය අරඹන ලදී. සියලූම අයවලූන්හට තම නිවෙස් වලින් පිටවී නොයන ලෙස ද්‍රවිඩ බසින් හා ඉංග්‍රීසි බසින් විකාශනය කරන ලදී.
4. ක්‍රියාන්විතය ආරම්භ වී පැය 04 කට පසු 2/ලූතිතන් ජීඒඩීකේජී ගනේගොඩ ශ්‍රීලපාහ ගේ දෙවනඛණ්ඩයේ සෙ/300360 කෝප්‍රල් ද සිල්වාගේ නායකත්වයෙන් යුතු දෙවන පෙළ විශාල පරිශ්‍රමයක් දරමින් අතහැර දමන ලද නිවෙසක වැසිකිලි වලක් හාරන අයුරු 2/ ලූතිතන් ගනේගොඩ ශ්‍රීලපාහ හට දනගැනීමට හැකිවිය. ටික වේලාවක් ගිය පසු ඉතාම අමිහිරි දුහඳක් සමග පෙට්ටියක් වැනි යමක් එය තුළින් ඉහළට ඔසවා ගනු ලැබිණි. තවත් සෙනින් කීප දෙනෙක් ඉක්මනින් එය පිරිසිදු කර විවෘත කරන තෙක් නිලධාරී අණදෙන ඇතුලූව අපහට නොඉවසිලිමත් විය. ක්‍රමයෙන් එම පෙට්ටිය විවෘත කරන ලදී. එය තුලින් අත් බෝම්බ විශාල සංඛ්‍යාවක් හා ආරුල් බෝම්බ කීපයක් තිබෙනු අප සියලූ දෙනාට දක ගත හැකිවිය.
5. සැමගේ මුහුණුවල බලාපොරොත්තු සඵල හසරැලි කීපයක් නැගුණි. එද මෙද තුර කළ ක්‍රියාන්විතයන්ගෙන් බිඳක් මේ අයුරින් මතකයට නැගුණි.

**ලූතිතන් සීරෙක් රත්නායක ශ්‍රීලපාහ**
**"සී" කණ්ඩායම 7 ශ්‍රීලපාහ**

# ආදර අම්මාට

ආදර අම්මේ මම යුධ බිමේ සිටිනවිට
ඔබ මට නිතර නිතර සිහිවෙනවා එහෙත් නෑ මගේ සිත දුක්වෙන්නේ
ඒකයි අම්මේ අපේ ජීවිතේ
රට වෙනුවෙන් ඇප කැපවී සේවය කිරීම
මගේ පරම යුතුකමකි
මෙවන් පුතෙක් බිහිකල ඔබ මතු ජාති ජාතින්
සංසාරයේ අපි එකට හමුවේවා

**සෙ/308622 සාසෙ හේරත් බංඩාර එච්එම්ජී**
**"ඒ" කණ්ඩායම 7 ශ්‍රීලපාහ**

# ප්‍රීතිමත් ජීවිතයකට මාර්ගය

## 5 වන කොටස

**මානසික පසුබිම**

ප්‍රීතිමත් ජීවිතයක් ගක කිරීමට අදහස් කරනු ලබන පුද්ගලයා ඒ සඳහා යම් මානසික ශික්ෂණයක් ඇති කර ගත යුතු බව මින් ඉහත ඡේදයකදීද සඳහන් කර ඇත. මක්නිසාද යත් සතුට යනු මනසේම ඇතිවන තත්වයක් නිසාය. සියළුම සිතුවිලි සහ ක්‍රියාවන් මනස මුල්කරගෙනම ඇතිවන බව ඉතා පැහැදිලි කරුණකි. තව ද මනස වනාහි මිනිසාගේ තර්ක බුද්ධිය විසින් අවබෝධ කරගනු ලබන කරුණු ගබඩා කර තබන ස්ථානයයි. එබැවින් තර්ක බුද්ධියට, මනසේ විවිධ ස්වභාවයන් වෙනස් කිරීමට හැකිය. එම නිසා ශුභවාදී මානසික තත්වයක් මගින් ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීමට අදහස් කරනු ලබන්නා, ලෝකය පිළිබඳව යථා ස්වභාවය තර්ක බුද්ධියෙන් අවබෝධ කර ගැනීමත්, එමගින් ඇතිවන මානසික ශික්ෂණය තුලින් සහණශීලී මානසිකත්වයක් ගොඩනගා ගැනීමත් අවශ්‍යය.

ලෝකය පිළිබඳව යථාවබෝධයක් ඇතිකර ගැනීම සඳහා පදනම් වන විවිධ කරුණු සහ මතවාද සෑහෙන පමණින් මින් ඉහත පරිච්ඡේද වල දී විස්තර කර ඇත. ඒවායින් අවබෝධ කරගත යුතු කරුණු දෙකකි. එනම් අප ජීවත්වන මේ විශ්ව පද්ධතිය තුල සිදුවන සංසිද්ධීන් කොටස් දෙකක් යටතට වර්ග කළ හැක. ඒවා නම්:

අ. අපට වෙනස් කිරීමට නොහැකි විශ්ව සංසිද්ධීන්. (උපත, මරණය, මහළුවීම, රෝගී වීම ඇතුළු පුද්ගල කේන්ද්‍රීය සිදුවීම් සහ ජලගැලූම්, භූමි කම්පා, මහා වසංගත ආදි විශ්ව පද්ධතියටම පොදු සිදුවීම්)

ආ. අපට වෙනස් කළහැකි සංසිද්ධීන්

මෙහිදී අප විසින් අවබෝධ කර ගත යුත්තේ මින් පළමු කොටසට අයත් සිදුවීම් වලදී සංසුන් සිතින් ඒවාට මුහුණදීමත්, දෙවන කොටසට අයත් සිදුවීම් වලදී එම සංසිද්ධීන් අප ඇතුළු සමස්ථ විශ්ව පද්ධතියේ යහපත සඳහා වෙනස් කිරීමත් ය.

මිනිසුන් වැඩි පිරිසකට වැරදි ඇත්තේ මෙතැනය. එනම් ලෝක තත්වය අවබෝධ නොකර ගැනීම නිසා දුක්වීමත්, එමෙන්ම මුළු ලෝකයේ ඇති සියළුම දේවල් තම පුද්ගලික අවශ්‍යතාවයන් සඳහා යොද ගැනීමට තැත් කිරීම නිසා ඇතිවන දුක්මුසු තත්වයන් ය. අප උපන්ද සිට මියයන දිනය තෙක් සිදුවන සියල්ල අප කැමති පරිදි, අපගේ සුවය පිණිස සිදුවන්නේ නම් අපට දුක් වීමට දෙයක් නැත. එහෙත් එය එසේ සිදු නොවේ. අපට අවශ්‍ය පරිදි සිදු නොවන දේවල් වලින් වැඩි ප්‍රමාණයක් අපට වෙනස් කිරීමට නොහැකි ලෝක ධර්මතාවයන්ය. ඉපදීම, මියයාම, රෝගීවීම, ආදිය ඉන් සමහරකි. ඒවා ලෝක ධර්මතාවන්ට අනුව සිදුවේ. එසේනම් අප කළ යුත්තේ කුමක් ද? එවැනි සිදුවීම් හමුවේ හඬා වැලපීම ද? නැත. ලෝක තත්වයන් අවබෝධ කර ගැනීම තුළින් උපේක්ෂා සහගත වීමයි.

එමෙන්ම අපට බොහෝ වෙනස් කළහැකි දේවල් ඇත්නම් දැඩි කැපවීමකින්, වෙහෙස වී ක්‍රියා කරමින් එම තත්වය අපගේ යහපත වෙනුවෙන් වෙනස් කළ යුතුය. එසේ වෙනස් කළහැකි දේවල් අතර, දුප්පත්කම. විරැකියාව ඇතුළු ප්‍රශ්ණ විශාල සංඛ්‍යාවක් ඇත. එහෙත් එවැනි ප්‍රශ්ණ විසඳීමේදී පවා අප සිතන ක්‍රමයේ වෙනස්කම් ඇතිකරගත යුතුය. මක්නිසාද ක්‍රියාවක් වන්නේ සිතුවිල්ලක් බැවිනි. ඔබ යම් ආකාරයක පුද්ගලයෙකු වී සිටින්නේ ඔබ ඒ ආකාරයෙන් සිතන නිසාය. එබැවින් ඔබට වෙනස් ආකාරයක මිනිසකු වීමට අවශ්‍ය නම් ඔබ සිතන ආකරයද වෙනස් කළ යුතුමය. මෙම තත්වය තනි තනි පුද්ගලයන්ට මෙන්ම පොදුවේ මුළු සමාජයටම ක්‍රියාත්මක කළ හැකි ධර්මතාවයකි. එනම් චින්තන විප්ලවයක් තුලින් වෙනස් වී ඇති ජාතීන්, රටවල් ආදිය පිළිබඳව අනන්ත උදහරණ මිනිස් ශිෂ්ඨාචාරයේ අතීතයෙන් පෙන්වා දිය හැක.

එමෙන්ම තමන්ට උපතින්ම උරුම වූ ඉරණම සිතන ක්‍රමය වෙනස් කිරීම මගින් වෙනස් කරගත් තනි පුද්ගලයන් පිළිබඳව අනන්ත අපමණ උදහරණ ද දිය හැක. අපට වෙනස් නොකල හැකි දෙවල් වලට දුක්වන පුද්ගලයාත්, වෙනස් කළ හැකි දේවල් වෙනස් කිරීමට උත්සාහ නොකරන පුද්ගලයාත් යන දෙදෙනාම අඥණයින් ය.

එබැවින් අපගේ මනස ඉහත සඳහන් කරුණු අවබෝධකර ගැනීම සඳහා විවරව තබා ගත යුතුය. යථාවබෝධය ප්‍රීතිමත් මානසික තත්වයක් සඳහා අවශ්‍ය වන වැදගත්ම අංගයයි. එහෙත් ප්‍රීතිමත් ජීවිතයක් සඳහා නම් අප සිතන තරම් ද්‍රව්‍යමය දේවල් හෝ තත්වයන් අවශ්‍ය නොවේ. වැඩි වැඩියෙන් දේවල් හෝ තත්වයන් බලාපොරොත්තු වන තරමටම වැඩි වැඩියෙන් සතුට අපගෙන් ඈත් වනු ඇත. මක්නිසාද අප බලාපොරොත්තු වන සියල්ල අද අපට ලැබුණත්, හෙට වෙනත් අවශ්‍යතාවයක් අපගේ සිතට ඇතුළුවන බැවිනි. අපට සිතන්නට හැකි තරම් දේවල් සියල්ල අපට අවශ්‍ය වේ. එහෙත් ඒ සියල්ල ලැබීමෙන් පසුත් අප පූර්ණ තෘප්තියට නොපැමිනේ අපට සිතන්නට තවත් බොහෝ දේවල් ඇති බැවිනි. සිතෙහි සීමාවන් නැති තරමටම සිතට ඇතුළුවන අපේක්ෂා සංඛ්‍යාව විශාලය. එබැවින් අපට අවශ්‍ය වනුයේ තෘප්තිමත් සැනසිලිදයක ජීවිතයක් නම් අප අනිවාර්යෙන්ම සිතට ඇතුළුවන අවශ්‍යතාවයන් සීමා කරගත යුතුය. අවශ්‍යතා අඩුවන තරමටම ඒවා සම්පූර්ණ කර ගැනීමට පහසුය. එවිට ඔබ තෘප්තිමත්ය. අවශ්‍යතා වැඩි තරමටම ඒවා සපුරා ගැනීමට අපහසුවීම නිසා ඔබ නිතරම අතෘප්තිමත් දුක්මුසු පුද්ගලයෙකු වන්නේය.

සැනසිලිදයක ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍යතා හඳුනාගැනීම සහ ඒවාට ප්‍රමුඛතාවක් අනුව සකසා ගැනීම අවශ්‍ය වේ. මක්නිසාද යත් යම් පුද්ගලයෙකු හට සිය ජීවිත කාලය මුළුල්ලෙහිම මහන්සි වුවත් ලබාගත නොහැකි එමෙන්ම ලබා ගැනීමට අවශ්‍ය නොවන දේවල් ද ඇති හෙයිනි. ඇතැම් අය මුළු ජීවිත කාලයක් තුලම මහන්සි වී ලබාගැනීමට උත්සාහ දරණුයේ සැනසිලිදයක ජීවිතයකට අත්‍යවශ්‍ය නොවන යම් යම් දේවල්ය. උදහරණ වශයෙන් විශාල ධන සම්භාරයක්, අවශ්‍ය ප්‍රමාණයට වඩා විශාල අති සුඛෝපභෝගී නිවාස, එවැනි වාහන, ඇතැම් විට යම් යම් සමාජ තත්වයන් ප්‍රසිද්ධිය වැනි දේවල්ය. මෙවැනි දේ ලබා ගැනීම සඳහා ඇතැම් විට අයථා මාර්ග ද පාවිච්චි කරති. පොදු ධනය සිය අවශ්‍යතා සඳහා යොද ගැනීම, වංචනික ව්‍යාපාර

ආදියෙහිද යෙදෙති. එහෙත් එවැනි මාර්ග වලින් ලබා ගන්නා සුපෝබභෝගී දේවල් වලින් ලැබෙන සතුට කුමක්ද? ඇතැම් විට එවැනි මාර්ග වලින් සතුට ලබා ගැනීමට ගොස් අත් විඳින්නට සිදුවනුයේ විශාල පාඩුවකි. නොඑසේ නම් සිර දඬුවමක් වැනි විශාල නින්දවකි. එබැවින් අප ජීවිතයේ දී යම් යම් දේවල් හෝ සමාජ තත්වයන් බලාපොරොත්තු වීමේදී ඒවා ලබා ගැනීම සඳහා සාධාරණ ක්‍රම පමණක් පාවිච්චි කළ යුතුය.

සමාජ තත්වයන් ලබා ගැනීමට උත්සාහ කිරීමේදී, එම තත්වය බලාපොරොත්තු වන්නා වූ වෙනත් අයවළුන් මැඩ පැවැත්වීම සඳහා ඇතැම් පුද්ගලයන් පාවිච්චි කරනුයේ ඉතා නින්ද සහගත ක්‍රමයි. ඇතැම් විට තමන් හා තරග කරන පුද්ගලයා විනාශ කර මරා දමා හෝ තමන්ට අවශ්‍ය තත්වය ලබාගැනීමට ඇතැමුන් ක්‍රියා කරයි තමන්ගේ සතුට වෙනුවෙන් වෙනත් අයෙකුගේ සතුට විනාශ කරන පුද්ගලයාට ස්වභාව ධර්මයේ රීතිය අනුව සතුටක් ලබාගත නොහැකිය. එබැවින් සතුටින් ජීවත්වීමට අදහස් කරන පුද්ගලයා කිසි විටෙකත් අන් අයගේ සතුට විනාශ කර නොදැමිය යුතුය. ඕනෑම පුද්ගලයෙකුට ජීවිතයේ යම් යම් අවශ්‍යතා සහ අපේක්ෂා ඇත. එහෙත් ඒවා හඹා යාමට පෙර එම අවශ්‍යතාවයන් ප්‍රමුඛතාවයන් අනුව පෙළ ගැස්විය යුතු ය. ඒ අනුව ජීවිතයේ මූලික අවශ්‍යතාවයන් සඳහා වැඩි ප්‍රමුඛතාවයකුත්, ඉන් ඔබ්බෙහි ඇති අවශ්‍යතාවයන් සඳහා අඩු ප්‍රමුඛතාවයකුත් ලබාදිය යුතුය. එවිට ඔබගේ අවශ්‍යතා අඩුවන අතර, විවේකය වැඩිවේ. අවශ්‍යතා වැඩි වන තරමටම විවේකය සහ සැනසීම අපට අහිමි වේ. නිවාස, ආහාර, රැකියා ආදිය වත්මන් මිනිස් ශිෂ්ටාචාරයේ අත්‍යවශ්‍යම අංග වේ. ඒවා නොමැතිව කිසිවෙකුට සිය ජීවිතය ගෙන යා නොහැක. එහෙත් අප දුක් විඳින්නේ බොහෝ විට අපට කිසි දිනක කිසිම ප්‍රයෝජනයක් අත් නොවන දේවල් වලට ආශා කිරීමෙනි. බුදු දහමට අනුවත් ආශාවන් සහ අවශ්‍යතා අධික වූ තරමටම අපගේ සිත්වල සැනසීම අප වෙතින් පලායාම සිදුවේ. ජීවිතයක මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා අප අනිවාර්යයෙන්ම වෙහෙස විය යුතුය. එහි කිසිම වරදක් නැත.

එමෙන්ම ඔබගේ සිතැඟි අනුව, හැකියාවන් අනුව ලබාගත හැකි වෙනත් යමක් ඇත්නම් අන් අයට පාඩුවක් හෝ අසාධාරණයක් සිදු නොවන පරිදි එය ලබාගැනීමේ දී වරදක් නොමැත.

එහෙත් අප අතර සිටින බොහෝ දෙනෙකු සිය සෞඛ්‍යය සහ විවේකය ආදිය ගැන කිසිදු සැලකීමක් නොමැතිව අතිරික්ත ධනය සෙවීමට හෝ සමාජයේ උසස් තැන් ලබාගැනීමට හෝ වෙහෙසීම ඉතා කණගාටුදායකයි. ඔබගේ නුවන සහ හැකියාවන් යොදගෙන ධනය රැස් කිරීමට ඔබට හැකිනම් එහි කිසිදු වරදක් මම නොදකිමි. මක්නිසාද එසේ රැස් කරන ධනයෙන් ඔබට මෙන්ම ඔබ තරම් වාසනාවන්ත නොවූ අප සමාජයේ වෙනත් අයවළුන් හට ද උදව් කළහැකි බැවිනි. එහෙත් ඔබගේ සෞඛ්‍යය සහ සිතේ සැනසිල්ල නැති කර ගනිමින් උපයන ධනය වැඩි දෙනෙකු විසින් කිසිවෙකුගේ ප්‍රයෝජනයට නොගෙන ගොඩගසා තබයි. අවසානයේ එසේ ධනය රැස්කළ තැනැත්තා සෞඛ්‍යය පිරිහීමෙන් ලෙඩ වීම හෝ සිතේ සැනසිල්ල අහිමි වීමෙන් උන්මත්තක වීමද සිදුවිය හැකිය. බුදුන් වහන්සේ විසින් ආරෝග්‍යා පරමා ලාභා යනුවෙන් දේශණා කරන ලද්දේ නීරෝගී භාවය උතුම්ම ධනය වන බැවිනි. එබැවින් ධනයටත් වඩා අප විසින් ප්‍රමුඛතාවය දියයුත්තේ සෞඛ්‍යයටයි. සිතේ ස්වභාවය ගතේ ලෙඩ වලට ඉඳුරාම බලපාන බැවින් අප ඒ ගැන සැලකිලිමත් විය යුතුය. එබැවින් සෞඛ්‍යය සම්පන්න ජීවිතයකට අවශ්‍ය පළමුවන අංගය නම් සැනසිලිදායක තෘප්තිමත් චිත්ත ස්වභාවයයි. අධික අවශ්‍යතා සහ ආශාවන් ඇති අයවළුන් හට එවැනි චිත්ත ස්වභාවයක් ඇති කරගත නොහැකිය. මෙහිදී අප විසින් මධ්‍යම ප්‍රතිපදාව පිළිබඳව අවබෝධයක් ලබාගත යුතුය. බුදුන් වහන්සේ විසින් ද යහපත් ජීවිතයක් සඳහා දේශණා කර ඇත්තේ හැම දෙයක්ම මධ්‍යස්ථව උපේක්ෂාවෙන් ඉවසා සිටීම අප විසින් ප්‍රගුණ කළ යුතුය. එමෙන්ම එදිනෙද ජීවිතයේ දී ද අධික සැප මෙන්ම අන්ත දුක ද බලාපොරොත්තු නොවී මැදුම් පිළිවෙතට හුරු වීමෙන් ජීවිතය වඩාත් පහසුවෙයි. අවශ්‍යතාවයන් වඩාත් සරළ වෙයි. එවිට ඔබට වැඩි වැඩියෙන් වෙහෙස වීමට සිදු නොවේ. එමෙන්ම අන්ත දුක් විඳීමට ද සිදු නොවේ. වැඩියෙන් සැප ලැබීම සඳහා අන්ත දුක් විඳීම මෝඩයන්ගේ ගති ලක්ෂණයකි. ලද දෙයින් සතුටු වීමත්, හැම දෙයකදීම මැදුම් පිළිවෙතත්, සතුටට හේතු වන ඥානවන්ත සත් පුරුෂයන්ගේ ගති ලක්ෂණ වේ.

**එස්සී කරුණාරත්න ආර්එස්පී - ශ්‍රීලපාහ**
**ලුතිතන් කර්නල්**
**අණදෙන නිලධාරී 4 ශ්‍රීලපාහ**

# වසර දහය පිරෙන වගයි

අද්‍ය හතේ පහයි පහ - බිහි වූ මේ හතර ලපාහ
බිහිසුනු යුද්ධය හමුවේ - නැග ආ මේ හතර ලපාහ
පාබල ඒකක වලට - සොයුරෙකු වූ හතර ලපාහ
ලක් මැණිගේ සාමය රකින - ඒකකයයි හතර ලපාහ
වසරින් වසර ගත වී - දහවෙනි වසරට ආවා
පියගැට පෙළ දහය හමුවේ - රන් අකුරෙන් ලියවුවා
එඩිතර විරුවන් බිහිකල - නමගිය ඒකකයක් වූවා
ඉතිහාසයේ රන් අකුරින් - ඔබගේ නම ලියවෙනවා
එඩිතර ලෙස දස්ම් පා - බළඇණි නම රැක ගත්තු
විරු සෙබලුන් පිරිසක් ඇති - දස දෙස නම පිළිගත්තු
මෙහෙයුම්වල යෙදී හොඳට - ඒකකය රැකගත්තු
සාමයේ මල් පුබුදන්නට - ජීවිතයත් වෙර ගත්තු
අපි මිලිනව ගියත් දිනක - තව අය විත් ඒකකයට
ලස්සන නම ඉදිරියටත් - ගෙනයයි බළ ඇණියේ යසට
ඉදිරියටත් මේ හොඳ නම - බැඳි සිටිමු රැක ගන්ට
දහවෙනි සංවත්සරය - සමරමු ලස්සන විලසට

**කයිතඩි ප්‍රදේශයේ දී 1996.09.25 දින ත්‍රස්තවාදීන් විසින් පුපුරුවා හරින ලද බෝම්බයකට හසුවීමෙන් මියගිය**
**සෙ/303996 ලාකෝ සුහසිංහ එස්එච්එස්සක්**

# ආබාධිත සෙබලුන්ට හා මිය ගිය රණවිරුවන්ගේ ළඟම ඥතීන්ට ස්වයං නිවාස තනාගැනීම සඳහා රු 150000/- ක් ලබාදීමේ ව්‍යාපෘතිය



මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ රෙම ශ්‍රීලපාහි කාර්‍ය්‍ය නියුක්ත සේනාවිධායක ලුතිනන් කර්නල් ජේඑස් මාසක්කාර ශ්‍රීලපාහ විසින් 97-08-24 දින 0840 පැයට යෙදුනු ශුභ මොහොතින් පීත්ත පටිය කපා නව නිවස විවෘත කරන අයුරුයි රෙපීආබ ශ්‍රීලපාහි නිළධාරී අණදෙන මේජර් අයිපීආර්පී බොගොඩවත්ත ශ්‍රීලපාහ සහ රණවිරු සෙ/11485 බනි 11 කරුණාරත්න පී පසෙකින් සිටී



මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ රෙම ශ්‍රීලපාහගි කාර්‍ය්‍ය නියුක්ත සේනාවිධායක ලුතිනන් කර්නල් ජේඑස් මාසක්කාර ශ්‍රීලපාහ විසින් චාරිත්‍රානුකූලව පොල්තෙල් පහන දල්වන අයුරුයි



මෙම ඡායාරූපයෙන් දක්වෙනුයේ රෙම ශ්‍රීලපාහ ගි මාණ්ඩලික නිළධාරී 1 (සෙවි) ලුතිනන් කර්නල් එස්අයිබී තෙන්නකෝන් ශ්‍රීලපාහ විසින් 0947 පැයට යෙදුනු ශුභ මොහොතින් පීත්ත පටිය කපා නව නිවස විවෘත කරන අයුරුයි



මෙම ඡායාරූපයෙන් දක්වෙනුයේ රෙම ශ්‍රීලපාහ ගි මාණ්ඩලික නිළධාරී 1 (සෙවි) ලුතිනන් කර්නල් එස්අයිබී තෙන්නකෝන් ශ්‍රීලපාහ විසින් 1057 පැයට යෙදුනු ශුභ මොහොතින් පීත්ත පටිය කපා නව නිවස විවෘත කරන අයුරුයි 4 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිළධාරී ලුතිනන් කර්නල් එස්සී කරුණාරත්න ආර්ඩබ්පී ශ්‍රීලපාහ (එවකට මේජර්) සහ රණවිරු සෙ/12927 සාසෙ මාරසිංහ එම්එම්එල් සහ ඔහුගේ බිරිඳ පසෙකින් සිටී

# What's New

## තොරතුරු බිඳක්....

Compiled by
Major K J Jayaweera

### උසස් කිරීම් නිලධාරී

<u>කර්නල් සිට බ්‍රිගේඩියර් නිලයට උසස් කිරීම්</u>

කර්නල් ටීටීආර් ද සිල්වා, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
කර්නල් ජීඑම් රොක්වුට්, ආර්එස්පී. පීඑස්සී

<u>ලුතිනන් කර්නල් සිට කර්නල් නිලයට උසස් කිරීම</u>

ලුතිනන් කර්නල් එන්ජ් ජයසූරිය, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලුතිනන් කර්නල් ඩබ්එම්ආර් විජේසුන්දර, ආර්ඩබ්පී, පීඑස්සී
ලුතිනන් කර්නල් ආර්එම්ඩී රත්නායක, ආර්ඩබ්පී, ආර්එස්පී

<u>මේජර් නිලයේ සිට ලුතිනන කර්නල් නිලයට උසස් කිරීම</u>

මේජර් පීපී ද සිල්වා, ආර්ඩබ්පී, ආර්එස්පී
මේජර් සී විමලසිරි, ශ්‍රීලපාහ
මේජර් එස්සී කරුණාරත්න, ආර්එස්පී
මේජර් එච්එම්බී හේරත්, ශ්‍රීලපාහ
මේජර් ඩීජ් අමුණුගම, ආර්එස්පී
මේජර් ජේආර් කුලතුංග, ශ්‍රීලපාහ
මේජර් ඩීයූ ද ලැනරෝල්, ආර්ඩබ්පී, ආර්එස්පී

<u>කපිතන් සිට මේජර් නිලයට උසස් කිරීම</u>

කපිතන් ඩබ්ඩීඑච් මංචනායක, ශ්‍රීලපාහ
කපිතන් ඒඑම්යූ ඒකනායක, ශ්‍රීලපාහ
කපිතන් ජීඩීසීසී ආයුපාල, ශ්‍රීලපාහ
කපිතන් ඩීඑම්ආර්ජේජ් කුමාර ශ්‍රීලපාහ

<u>ලුතිනන් සිට කපිතන් දක්වා උසස්</u>

ලුතිනන් එච්කේආර්එච් කරුණාරත්න ශ්‍රීලපාහ - 97.03.22 4 ශ්‍රීලපාහ
ලුතිනන් ආර්ආර්බීජ් බණ්ඩාර ශ්‍රීලපාහ - 97.03.22 8 ශ්‍රීලපාහ
ලුතිනන් ආර්පීඑස්කේ උඩුගොඩ ශ්‍රීලපාහ - 97.03.22 0 ශ්‍රීලපාහ
ලුතිනන් ඕඑස් පත්මශාන්ත ශ්‍රීලපාහ - 97.03.22 8 ශ්‍රීලපාහ
ලුතිනන් ඒඑම්ජ් අබේසිංහ ශ්‍රීලපාහ - 97.07.09 8 ශ්‍රීලපාහ
ලුතිනන් ආර්එන්එස් පොන්සේකා ශ්‍රීලපාහ 97.07.09 6 ශ්‍රීලපාහ
ලුතිනන් කේජ්එස්ජ් කොලොන්නගේ ශ්‍රීලපාහ 97.07.09 6 ශ්‍රීලපාහ
ලුතිනන් ආර්පී හෙට්ටිආරච්චි ශ්‍රීලපාහ 97.07.09 6 ශ්‍රීලපාහ

### විවාහවීම් නිලධාරී / සෙසු නිල

නි/61850 කපිතන් සීඩී රඹුක්කන ශ්‍රීලපාහ හේමාගම අතිරේකදිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී කන්දබඩගේ දේන මනෝශා සෙව්වන්දි විජේනායක මනෙවිය සමග 1997.06.25 දින විවාහ වන ලදී.
මේජර් ඩබ්පීකේ පියරත්න, ශ්‍රීලපාහ 1997.06.19 දින දිගන විලේජ් රිවෝයි හෝටලයේ දී විවාහ විය.
කපිතන් එන්ජීඑන්බී මහතුවක්කාර, ශ්‍රීලපාහ 1997.08.04 දින මහනුවර ඩෙයෝන් හෝටලයේ දී විවාහ විය.
2/ ලුතිනන් පීආර් සිල්වා, ශ්‍රීලපාහ 1997.05.23 දින වාද්දුව යුධහමුද නිවාඩු නිකේතනයේ දී විවාහ විය.
2/ ලුතිනන් ජේකේඑස්ජේකේඩී ජයකොඩි, ශ්‍රීලපාහ 1997.08.04 දින බංඩාරවෙල සංචාරක නිවාඩු නිකේතනයේ දී විවාහ විය.
සෙ/13387 සරයන් ආනන්ද ජේජ් 97/07/02 වන දින කැස්බෑව අඹේගොඩ ලියනගේ දෙත් කුමුදුනී නිල්මිනිකා මෙනවිය සමග විවාහ විය.
සෙ/13639 කෝප්‍රල් දසනායක ඩීඑම් 97/04/03 වන දින මැදිරිගිරිය විවාහ ලේකම් කාර්යාලයේ දී වීරක්කොඩිගේ නිල්මිණී රුක්මක් විරක්කොඩි මෙනවිය සමග විවාහ විය.
සෙ/15979 කෝප්‍රල් ගමආරච්චි පීජ්එල්කේ 97/07/30 වන දින මැදකැකිල විවාහ ලේකම් කාර්යාලයේදී ගලප්පත්ති ගුරුගේ ගංගා පුෂ්පකුමාරි මෙනවිය සමග විවාහ විය.
සෙ/300025 කෝ්ල් වන්නිනායක ටීඑම් 97/04/10 වන දින කුරුණෑගල ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී හේරත් මුදියන්සේලාගේ නිල්මිණී හේරත් මෙනවිය සමග විවාහ විය.
සෙ/300768 කෝප්‍රල් ආරච්චිගේ ජීආර් 97/06/25 වනදින මාලිම්බඩ විවාහ රෙජිස්ටාර් කාර්යාලයේදී කංකානම් පතිරණගේ තනුජා නිල්මිණී මෙනවිය සමග විවාහ විය.
සෙ/301913 කෝප්‍රල් රජිත කේ 97/05/23 වන දින මතුගම දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී සීතා දමයන්ති ප්‍රනාන්දු මෙනවිය සමග විවාහ විය.
සෙ/301479 ලාකෝ සිරිවර්ධන එච්එම් 97/05/09 වන දින රත්පත්විල විවාහ ලේකම් කාර්යාලයෙ 'දී පියසේනගේ පද්මා දිසානායක මෙනවිය සමග විවාහ විය.

### පාඨමාලා නිලධාරී (එතෙර)

නි/60162 ලුතිනන් කර්නල් එච්එම්එන්බී හේරත් ශ්‍රීලපාහ ඇමරිකා එක්සත් ජනපදයේ පැවැත්වීමට නියමිත ජ්‍යෙෂ්ඨ බුද්ධි නිලධාරී පාඨමාලාව හැදෑරීම සඳහා 97.08.26 දින ඒකකයෙන් පිටත්ව යන ලදී.
කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව - ඉන්දියාව
මේජර් පී. එච්. වී. වර්ණකුලසූරිය, ශ්‍රීලපාහ

තරුණ නිලධාරී පාඨමාලාව ඉන්දියාව 97.08.04 සිට 97.12.24 දක්වා
කපිතන් පීපී නිරාජ්, ශ්‍රීලපාහ
කපිතන් ඩබ්එස්ජ්පී පෙරේරා, ශ්‍රීලාපහ
තරුණ නිලධාරී පාඨමාලාව - ඉන්දියාව 97.08.04 සිට 97.09.10 දින දක්වා
කපිතන් ජීඑම්කේබී ඒකනායක, ශ්‍රීලපාහ

## විවාහ වීම් නිලධාරී / සෙසු නිල

ලාකෝ සෙනසරත් එම්ඩබ්ජ්ආර් 9405/05 වන දින කුරුණෑගල විවාහ රෙජිස්ටාර් කාර්යාලයේ දී මිල්ලගහවත්තේ ගෙදර ශ්‍රියානි අබේසේකර මෙනවිය සමග විවාහ විය.

සෙ/300167 ලාකෝ ප්‍රියංකර එච්ඩීඑල් 94/09/07 වන දින දෙඩම්ගොඩ විවාහ රෙජිස්ටාර් කාර්යාලයේ දී නාහල්ලගේ දෙන් රංජිනී මෙනවිය සමග විවාහ විය.

සෙ/302647 ලාකෝ ජයතිස්ස ඩබ්ජී 96/10/23 වන දින ඉහළ මුල්ල විවාහ ලේකම් කාර්යාලයේ දී උඩගෙදර ධම්මිකා ශ්‍රියානි මෙනවිය සමග විවාහ විය.

සෙ/301896 සාසෙ රත්වල එස්ඩබ්කේඑම් 97/06/13 වන දින ශාන්ත ලුසියා වීදියේ කොළඹ 03 විවාහ රෙජිස්ටාර් කාර්යාලයේ දී මහා හේවගේ ආශා මනෝරි මීගම්පොල මෙනවිය සමග විවාහ විය.

සෙ/303007 සාසෙ සමන් පීඩබ් 97/06/06 වන දින රාජාංගනය විවාහ රෙජිස්ටාර් කාර්යාලයෙ 'දී කරුණා ජේඩිගේ සුමිත්‍රා දමයන්ති මෙනවිය සමග විවාහ විය.

සෙ/301942 සාසේ නවරත්න පීජීඑස් 97/06/06 වන දින අලපලාවල පිටවලගේ නිල්මිණී සමරසිංහ මෙනවිය සමග විවාහ විය.

සෙ/301929 සාසෙ දිසානායක ඩීජ්මේජේ 93/09/08 වන දින කොහොන විවාහ රෙජිස්ටාර් කාර්යාලයේ දී බුලත්සිංහල ආරච්චිගේ දෙන් වයලට් හාමිනේ මෙනවිය සමග විවාහ විය.

සෙ/12268 කෝප්‍රල් මුතුබංඩා ඒඑම්ජේ 1997.05.23 දින හඟුරන්කෙත විවාහ ලේකම් කාර්යාලයේ දී සන්ධ්‍යා ශ්‍රීමතී මෙනවිය සමග විවාහ විය.

සෙ/2ඩී01215 ලාකෝ නිශ්ශංක ජීඩී 1997.04.23 වන දින වීරපුර විවාහ ලේකම් කාර්යාලයේදී කරුණාපේඩිගේ ශ්‍රීයානි සමන්තා කරුණානායක මෙනවිය සමග විවාහ විය.

සෙ/2ඩී01520 සාසෙ සුනිල් ශාන්ත ඩබ්ඩීජ් 1987.01.22 වන දින ගාල්ල දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී සිටිනාමලූව නානායක්කාර මාලා පත්මිණී මෙනවියසමග විවාහ විය.

සෙ/2ඩී01935 සාසෙ බාලසූරිය බීජ්ජ්එස් 1997.06.25 වන දින අතිරේක දිස්ත්‍රික් රෙජිස්ටාර්තුමාගේ අවසරය පිට බානගල දූනැමුල්ල මනාලියගේ නිවසේදී රසිකා නිල්මිණී මෙනවිය සමග විවාහ විය.

සෙ/23695 ආසෙ කුලසිංහ අයිඩීඩබ් 196.08.01 දින අතිරේක දිස්ත්‍රික් කැන්දන්ගමුව විවාහ රෙජිස්ටාර් කාර්යාලයේ දී මාගම්මනලාගේ විජය කාන්ත කුමාරි මෙනවිය සමග විවාහ විය.

සෙ/22197 ආසෙ රංජිත් එස්එස් 1993.08.30 වන දින කැදව ලේකම් කාර්යාලයේදී ජයරත්නගේ ශ්‍රියාණි මලා මෙනවිය සමග විවාහ විය.

සෙ/21270 සාසෙ වීරසිද සිල්වා එල් 1984.07.21 වනදින කතර දිස්ත්‍රික් ලේඛම් කාර්යාලයේ දී රංමුතු ප්‍රියාණි මෙනවිය සමග විවාහ විය.

සෙ/23485 සාසෙ ධර්මදස ඒඑම් 1997.04.07 වන දින හිඟුරක්ගොඩ විවාහ ලේකම් කාර්යාලයේ දී රත්නායක මුදියන්සේලාගේ චම්පා මල්කාන්ති රත්නායක මෙනවිය සමග විවාහ විය.

සෙ/22138 ආසෙ අතුල තුෂාර එම්ඩී 1993.04.22 වන දින හැලැඹවැව විවාහ ලේකම් කාර්යාලයේදී ඇතැවුද ආරච්චිලාගේ මංගලලතා පොඩිමැණිකේ මෙනවිය සමග විවාහ විය.

## දරු උපත් නිලධාරී / සෙසු නිල

නි/60162 ලූතිතන් කර්නල් එච්එම්එන්බී හේරත් ශ්‍රීලපාහ ගේ බිරිඳට 1997 ජූනි මස 18 වනදින කළුතර දිස්ත්‍රික්කයේ පානදුර පීසීඑච් දියෙස් අනුස්මරණ කාන්තා රෝහලේ දී දූවකු උනි. දියණියගේ නම තරනි සත්මා කුමාරි හේරත්

නි/60593 කපිතන් ඒආර්කේ විජේවික්‍රම ශ්‍රීලපාහ ගේ බිරිඳට 1996.12.13 වන දින ගාල්ල සීමාසහිත සමූකාර ආරෝග්‍ය ශාලාවේදී පුතකු උනි. දරුවගේ නම බෝෂිත ජයේන්ද්‍ර විජේවික්‍රම

සෙ/13169 සැරයන් චන්ද්‍රසිරි ඒජ්එල්ගේ බිරිඳට 1997.07.06 දින යුධහමුද රෝහලේ දී දුවකු උපනි නම - දෙව්නි රශ්මිසාරා

සෙ/14514 කෝප්‍රල් වසන්ත වීරතුංග ඩබ්ජ් ගේ බිරිඳට 1997.06.13 දින ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ දී දුවකු උපනි නම - පියුමි එරන්දිකා වීරතුංග

සෙ/13943 කෝප්‍රල් සුමනදස යූජී ගේ බිරිඳට 1997.06.06 දින දඹුල්ල රෝහලේ දී පුතකු උනි නම යූජී පැතුම් දිල්ෂාන් කුමාර

සෙ/15233 ලාකෝ මහින්ද කුමාර එම්ජීජ් ගේ බිරිඳට 1996.07.30 දින පේරාදෙණිය රෝහලේ දී දුවකු උපනි.

නම - ක්‍රිෂාන්ති දිල්කි මදූෂානි

සෙ/12692 සැරයන් රණසිංහ ඩීජ්ගේ බිරිඳට 1997.06.01 දින යුහ රෝහලේ දී පුතෙකු උපනි. නම - දෙන් චාරුක තරිඳු අබිලාශ රණසිංහ

සෙ/12907 කෝප්‍රල් සුමිත් එම්ජ් ගේ බිරිඳට 96/02/10 වන දින වතුපිටිවල මූලික රෝහලේ දී පුතෙකු උපනි නම එම් ලහිරු ගිත්‍ය

සෙ/14620 කෝප්‍රල් චන්ද්‍රසේන එන්ජීගේ බිරිඳට 97/03/18 වන දින අනුරාධපුරය මහ රෝහලේ දී දුවකු උපනි නම එන්. ජී. ශානි සඳකැලූම් චන්ද්‍රසේන

සෙ/300362 කෝප්‍රල් බංඩාර එල්ආර්එස් ගේ බිරිඳට 97/02/28 වනදින මහනුවර මහරෝග්‍ය ශාලාවේදී දුවෙකු උපනි: නම ලේකම් රාලලාගේ හසිතා මධුවන්ති බංඩාර

සෙ/302973 කෝප්‍රල් බාලසූරිය පීබීජී ගේ බිරිඳට 97/02/13 වන දින මහනුවර මහාරෝග්‍ය ශාලාවේ දී පුතෙකු උපනි. නම : බී. එම්.උදිත මංගල බාලසූරිය

සෙ/302991 කෝප්‍රල් සෝමසිරි අයිපීඑස් ගේ බිරිඳට 96/11/11 වනදින මාතලේ මූලික රෝහලේ දී පුතෙකු උනි. එම්. ලහිරු දිල්ශාන් සෝමසිරි

සෙ/300167 ලාකෝ ප්‍රියංකර එච්ඩීඑල් ගේබිරිඳට 95/09/28 වන දින හොරණ මහ රෝහලේ දී දුවෙකු උපනි. නම එස්ඩී. බවන්ති වත්සලා

සෙ/300847 ලාකෝ චන්ද්‍රසේන ජේඑම් ගේ බිරිඳට 97/03/07 වන දින නාවලපිටිය මූලික රෝහලේ දී පුතෙකු උපනි. නම ජේ. එම්. කවීෂ නිෂාන් ජයසිංහ

සෙ/301135 සාසෙ සායක්කාර එස්එම්එස් ගේ බිරිඳට 96/11/11 වන දින අවිස්සාවේල්ල මූලික රෝහලේ දී දුවෙකු උපනි නම සඳුනි ඩිලූක්ෂි අනුෂ්කා.

සෙ/15253 කෝප්‍රල් ජයතුංග කේඑම් ගේ බිරිඳට 97/07/02 වාරියපොල රජයේ රෝහලේ දී දුවෙකු උනි. දියණියගේ නම ජයංගනී මධුශිකා කුරුප්පු

සෙ/301374 කෝප්‍රල් රණවීර එච්සීඑන් ගේ බිරිඳට 97/07/24 දින යුධ හමුද රෝහලේ දී පුතෙකු උපනි. නම මධුෂ මල්ෂාන් රණවීර

සෙ/21354 කෝප්‍රල් විජේරත්න බීපීජීගේ බිරිඳට 1997/08/05 දින යු. හ. රෝහලේ දී පුතකු උපනි. මුදිත දර්ශන බංඩාර විජේරත්න

## මියයෑම්

1 ශ්‍රීලපාහ
සෙ/122507 ආසෙ නිමල් ජේඑම් 97.07.06 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/143017 කෝප්‍රල් ජයරත්න එස්පී 97.07.06 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/116816 ආසෙ ජයසිංහ එම්ඩීසී 97.07.06 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/301318 කෝප්‍රල් ද සිල්වා ඩබ්ආර්එස් 97.07.18 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/306557 සාසෙ වික්‍රමසිංහ ඩබ්ජ්ටී 97.07.23 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/307159 සාසෙ උඩුගම යුකේඩීඑල්එච් 97.0724 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/300854 කෝප්‍රල් අලුත්ගෙදර අයිජ්කේ 97.08.01 මඩකලපුව (1විබ ඇතුලත)
සෙ/13950 කෝප්‍රල් රත්නායක ආර්එම්ජී. 97.08.07 මඩකලපුව

3 ශ්‍රීලපාහ
සෙ/125291 ආසෙ පියරත්න බීජ් 97.06.12 ජයසිකුරු ක්‍රියාත්මිතුයේ දී
සෙ/300517 කෝප්‍රල් අනුර කුමාර එම්එච් 97.09.10 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/303146 සාසෙ කමක් කුමාර එන්එස් 97.09.10 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/303437 සාසෙ සිල්වා ඩබ්ජ්ජී 97.09.10 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/308432 සාසෙ ඒකනායක පීඑන්ජේ 97.09.10 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/305091 සාසෙ ජනක කුමාරු එස්ආර් 97.09.10 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/303750 සාසෙ දසනායක ආර්පීඩබ් 97.09.10 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/302312 සාසෙ බන්දුල කුමාර එච්කේ 97.09.10 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/14491 සාසෙ කරුණාරත්න එම් 97.09.13 ජයසිකුරු ක්‍රියාත්මිතයේදී
සෙ/302307 සාසෙ රත්නසිරි යූඑම් 97.09.13 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/303920 සාසෙ සරත් බංඩාර ටීඑම්ඩබ්එම් 97.09.13 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/125227 ආසෙ ජීවකරත්න ඩබ්එම් 97.09.13 ජයසිකුරු ක්‍රියාත්මිතයේදී

4ශ්‍රීලපාහ
සෙ/301420 සාසෙ සමරවීර පීඩබ්වී 97.09.19 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/122820 ආසෙ ගනේගොඩ ඩබ්පී 97.08.19 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
නි/61958 කපිතන් එම්ජීඑස්ජේ ගුණතිලක, ශ්‍රීලපාහ 97.08.22 ජයසිකුරු ක්‍රියාත්මිතයේදී
සෙ/14900 ලාකෝ රණසිංහ පීජීඑස් 97.08.22 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/115061 ආසෙ ලක්ෂ්මන් ඩබ්ජ් 97.08.22 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/116277 ආසෙ පුංචිඅප්පුහාමි ආර්එම් 97.08.22 ජයසිකුරු ක්‍රියාත්මිතයේදී

6 ශ්‍රීලපාහ
සෙ/301601 සාසෙ දයාරත්නබංඩා ඩීඑම් 97.07.29 වාලච්චේන (සංඥ බලකාය ඇතුළත)
සෙ/307585 සාසෙ දිසානායක ඩීඑම්ජ් 97.08.08 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/112695 ආසෙ සකලසූරිය පීඑම් 97.08.20 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/125822 ආසෙ විජේසූරිය කෙඑස්එම් 97.08.20 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී

7 ශ්‍රීලපාහ
සෙ/309175 සාසෙ මාරසිංහ ඒජේ 97.08.11 කිලිනොච්චි

8 ශ්‍රීලපාහ
සෙ/301110 කෝප්‍රල් චන්ද්‍රසිරි එච්එම් 97.06.13 වාවකච්චේරි
සෙ/111150 ආසෙ ජයලත් ඒඩීජ්එස් 97.07.08 ජයසිකුරු
සෙ/119413 ආසෙ බන්දුල පීඩබ්ජේ 97.08.19 ජයසිකුරු
සෙ/113221 ආසෙ විජේසිරි ඩබ්එම් 97.09.10 ජයසිකුරු

10 ශ්‍රීලපාහ
සෙ/13449 සැරයන් වසන්ත කුමාර කේඑල්ඒඑන් 97.06.24 ජයසිකුරු ක්‍රියාත්මිතයේදී
සෙ/300105 කෝප්‍රල් අධිකාරි ඒඅයිජ් 97.06.24 ජයසිකුරු ක්‍රියාත්මිතයේදී
සෙ/301869 කෝප්‍රල් රංජිත් කේවයි 97.06.24 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/302365 කෝප්‍රල් සූරවීර එස්ජ්එස් 97.06.24 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/306217 ලාකෝ පුෂ්පකුමාර එච්එල් 97.06.24 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/13622 සාසෙ රත්නායක ඩීඑස්කේ 97.06.24 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/301568 සාසෙ රණසිංහ ඒකේකේ 97.06.24 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/305757 සාසෙ උපනන්ද බීකේඑස් 97.06.24 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/307015 සාසෙ රාජක්‍ෂ ටීඑන් 97.06.24 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/308527 සාසෙ නවරත්න ඒඑම්එන් 97.07.08 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/300816 කෝප්‍රල් රත්නායක එස්එම් 97.08.07 ජයසිකුරු ක්‍රියාත්මිතයේදී
සෙ/305879 සාසෙ සමන්ත සිල්වා එම්පී 97.08.07 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/99604 ආසෙ නන්දන එස්පී 97.08.07 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/119391 ආසෙ ගීත් කුමාර එම්පී 97.08.07 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/308528 සාසෙ අතත්තු ඒඑම්එස් 97.09.15 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/308537 සාසෙ ජයසේකර ආර්එම් 97.09.15 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/50685 ආසෙ ජයවර්ධන වයිඅයි 97.09.15 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/306516 සාසෙ ගුණසිංහ අයිඩබ්ජ් 97.09.15 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී
සෙ/227706 ආසෙ ගුණසිංහ වීජීජ් 97.09.15 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී

12 ශ්‍රීලපාහ
සෙ/113205 ආසෙ සෙනවිරත්න එස්එම් 97.09.15 ජයසිකුරු ක්‍රියාත්මිතයේ දී

5(සෙව) ශ්‍රීලපාහ
සෙ/5ඩී00924 සාසෙ සරත් ප්‍රේමකුමාර ඒඑම් 97.08.09 මොරවැව ත්‍ර/ප්‍රහාරයෙන්
සෙ/5ඩී22277 සාසෙ චමින්ද ඒකනායක එච්ආර් 97.08.09 මොරවැව ත්‍ර/ ප්‍රහාරයෙන්
සෙ/97එන්ජී0326 ආසෙ අනිල් කුමාර රණසිංහ පීජී 97.08.09 මොරවැව ත්‍ර/ප්‍රහාරයෙන්
සෙ/97එන්ජී0291 ආසෙ ජයන්ත යාපාරත්න 97.08.09 මොරවැව ත්‍ර/ප්‍රහාරයෙන්
සෙ/97එන්ජී0111 ආසෙ සුනිල්ශාන්ත වයිපීජී 97.09.01 ත්‍රි/මලය ත්‍රස්ථප්‍රහාරයෙන්
සෙ/96වීඑප්ආර්21793 ආසෙ රත්නපාල එච්වීඑස්කේ 97.09.01 ත්‍රි/මලය ත්‍රස්ථප්‍රහාරයෙන්
සෙ/5ඩී002127 සාසෙ සම්පත් පීඩී 97.09.01 ත්‍රි/මලය ත්‍රස්ථප්‍රහාරයෙන්
සෙ/01963 සාසෙ විරාජ් ධම්මික කේඩබ් 97.09.08 නිලාවෙලි ත්‍ර/ප්‍රහාරයෙන්

# විවිධ පිරිනැමීම් ප්‍රදානය කරන අවස්ථාවන්



යාපනය අච්චුවැලි ප්‍රදේශයේ අවරංගල් හි පිහිටි නඩරාජා රාමලිංගම් විද්‍යාලයේ පැවති වාර්ෂික ක්‍රීඩා උත්සවයේදී 9 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිළධාරී තුමා පාසැල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජය සංකේත ප්‍රධානය කරන ලදී ඉන් එක් අවස්ථාවක් කැමරාවට ලක්වූ අයුරු



මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ සීකේටි ආයතනයේ සුභසාධක සංගමයේ ලේකම් විසින් අදල රණවිරුවා හට කෘත්‍රිම පාදය පිරිනමන අයුරුයි මෙම උත්සවය සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහහි සේනාවිධායක ලූතිනන් කර්නල් ජේඑස් මාසක්කාර ශ්‍රීලපාහ සහ රෙජිමේන්තු ආධාරක බළඇණිය ශ්‍රීලපාහහි නිළධාරී අණදෙන මේජර් අයිපීආර්පී බෝගොඩවත්ත ශ්‍රීලපාහ යන නිලධාරීහු සහභාගි වන ලදී



මෙම ඡායාරූපයෙන් දක්වෙනුයේ 4 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිළධාරී ලූතිනන් කර්නල් එස්සී කරුණාරත්න ආර්ඩබ්පී ශ්‍රීලපාහ (එවකට මේජර්) විසින් රණවිරු සෙ/12927 සාසෙ මාරසිංහ එම්එම්එල් සහ ඔහුගේ බිරිදට විශේෂ පරිත්‍යාගයක් පිරිනමන අයුරුයි රෙම ශ්‍රීලපාහ මාණ්ඩලික නිළධාරී 1 (සෙවි) ලූතිනන් කර්නල් එස්අයිබී තෙන්නකෝන් ශ්‍රීලපාහ සහ රෙපීආබ ශ්‍රීලපාහහි උපානි කපිතාන් (උපා) සීඑච් බිලොක් ශ්‍රීලපාහ පසෙකින් සිටී




මෙම ඡායාරූපයෙන් දක්වෙනුයේ චිත්‍රා ගලප්පත්ති විජේනායක මහත්මිය·හා ඇයගේ දියණිය සහ ඇයගේ සොහොයුරු වන ඩිලාන් අබේවර්ධන මහතා රණවිරු සැරයන් සිරිසෝම එම්පීආර් සමග සුහද පිළිසඳරක යෙදී සිටින අයුරුයි

# මනෝ විද්‍යාත්මක යුද ශිල්පය (Psycological war fare) හා වර්තමාන යුද පසුබිම

## (2 කොටස)

### ම වි ක්‍රියාවන්හි ක්‍රියාදමය (Psy ops cycle)

පැහැදිලි සාර්ථකත්වයක් සඳහා ඕනෑම ම වි ක්‍රියාවන් යම්කිසි ක්‍රියාදමයක් මත සිදුවිය යුතුය. ශක්තිමත් සැලැස්මක් මත ගොඩනැංවෙන ගොඩනැගිල්ලක ස්ථිරභාවය හා සමාන මෙම ක්‍රියාදාමය මගින් තම අවශ්‍යතාවයට අනුව තම සතුරාගේ හැඟීම් වෙනස් කිරීම (Change of perception) සාර්ථක ලෙස කරගත හැක. (රූපය - 2 බලන්න)



2 වැනි රූපය

### හැඟීම් හා එහි උත්තේජනයෙහි ප්‍රතිඵලය

ලොව ඕනෑම ජනකොට්ඨාශයකට පොදු සාධක ඇත. එනම්,

1. ආගම
2. ජාතිය
3. සංස්කෘතිය
4. අධ්‍යාපනය
5. සිරිත් විරිත් හා පිළිවෙත්

මෙම ඕනෑම සාධකයන් මගින් එම ජන කොට්ඨාශයේ හැඟීම් වෙනස්කළ හැක. එක් ජන කොට්ඨාශයක හැඟීම් තවත් ජන කොට්ඨාශයකට තේරුම් ගැනීමට අපහසු වේ. ඊට හේතුව නම් ඉහතකී සාධක මත එම ජන කොට්ඨාශය පරම්පරා ගණනක් ජීවත්වී තිබීමයි. යම් ජන කොට්ඨාශයක හැඟීම් උත්තේජනය කිරීමෙන් සාර්ථක ම වි ක්‍රියා ප්‍රතිඵලය ලබාගත හැක. වෙනත් වචනයෙන් කිවහොත් ම වි ක්‍රියා නිෂ්පාදනයක සාර්ථකත්වය රඳ පවතිනුයේ, එමගින් කොතෙක් දුරට ඉලක්ක ප්‍රේක්ෂක ජන කොට්ඨාශයේ හැඟීම් වෙනස්කල හැකිද යන්න මතයි. උදාහරණයක් වශයෙන් ජාතිවාදී අරගලයක පක්‍ෂ අතර හැඟීම් උත්තේජනය කළ හැක්කේ ඒ ඒ පාක්ෂිකයින්ගේ ජාතිය අතර ඇති වෙනස්කම්, විරෝධිකම්, ද්‍රෝහිකම් හෝ අඩුපාඩු එම ම වි ක්‍රියා පත්‍රිකාවේ සාර්ථක ලෙස ගැබ්වී ඇත්නම් පමණි. තව ද, යම් ජන කොට්ඨාශයක හැඟීම් වෙනස් කළ හැකි තවත් අපූර්වතම හා ප්‍රබලම සාධකයක් වනුයේ 'අතීත අත්දැකීම්' ය. තම අතිත අත් දැකීම් ඉතා කටුක එසේම පීඩාකාරී වූයේ නම් එම අතීතයේ නැවත මතක් කර දීමෙන් එම ජන කොට්ඨාශයේ හැඟීම් උත්තේජනය කළ හැක.


### හැඟීම් උත්තේජන රටාව

උදහරණ රූපය 3 මගින් පෙන්නුම් කර ඇත්තේ එකම සමාජ තන්ත්‍රයක ජීවත් වන ඒ. බී හා සී නමැති ජන කොට්ඨාශ 3 කි. මෙම ජන කොට්ඨාශ තුන දිගු කාලයක් එම සමාජ තන්ත්‍රය තුළ සමාදනයෙන් සාමූහිකව ජීවත් විය. එසේ වුව ද එම සමාජ තන්ත්‍රය තුළ ගැබ්වී ඇත යම් යම් හැඟීම් උත්තේජන සාධක මගින් ඕනෑම ජන කොට්ඨාශයක් අනෙක් ජන කොට්ඨාශය හා ගැටුම් ඇතිකරවිය හැක. මෙසේ කළ හැක්කේ එම ගැටුම් මගින් යම් වාසියක් ලබා ගැනීමේ අරමුණ ඇති තවත් ජන කොට්ඨාශයකට හෝ බාහිර රටක සාර්ථක ම වි ක්‍රියාදමයක් මගිනි. මෙය හුදෙක් දේශපාලනික ම වි ක්‍රියා ගණයට අයත් වේ.

### හමුදමය ම වි ක්‍රියා

හමුදමය ම වි ක්‍රියා මගින් හැඟීම් උත්තේජනය කළ යුතේතේ තම සතුරු පක්‍ෂය තුල පමණි. එම ම වි ක්‍රියා නිෂ්පාදනයන්ගේ 'තේමාව' මගින් සතුරු පාක්ෂිකයන් හා ඔවුන්ගේ ආධාර කරුවන්ගේ හැඟීම් වෙනස් කළ හැකි විය යුතුය. හමුදමය ම වි ක්‍රියා සඳහා තම සතුරු පක්‍ෂය පිළිබඳ යම් යම් තොරතුරු ලබා ගැනීම ඉතා වැදගත් වේ. මෙම තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් එම සතුරු සංවිධානය තුළ හැඟීම් උත්තේජනය කළ හැකි සාධක මොනවා ද යන්න සොයාගත හැක. පහත පෙන්නුම් කරනුයේ හමුද ම වි ක්‍රියා නිෂ්පාදනයක් සඳහා තම සතුරු සංවිධානය පිළිබඳ දැනගත යුතු තොරතුරු හා සාධක වලින් කියති.

| තොරතුරු | සාධකය |
|---|---|
| 1. නායකත්වය | ඒකාධිපතිවාදය |
| කෲර පාලනය | |
| | ආත්මාර්ථකාමීත්වය |
| | දක්‍ෂ අදක්‍ෂකම |
| 2. සංවිධානය | ස්ථිර අස්ථිර භාවය |
| | බහුතර ජන විශ්වාසය |
| | විදේශ ආධාර |



රූපය 03

| | |
|---|---|
| | විශ්වාසවන්ත භාවය |
| 3. පරමාර්ථය | පොදුහිතකාමීවීම හෝ නොවීම |
| | කලින් කලට වෙනස් කිරීම |
| | ස්ථිර අස්ථිර භාවය |
| | දිගු කාලීනවීම හෝ කෙටිකාලීන වීම |
| | ජාතික මමත්වය පිළිබිඹුවීම |
| 4. සාමාජිකත්වය | විවිධ මතධාරීන් සමානාත්මතාවය |
| | සුදුසුකම් |
| | අන්තෝන්‍ය බැඳීම |
| | විවිධ තරාතිරම් |

ඉහත දක්වූ සාධකයන් නිසි ලෙස විශ්ලේෂණය කිරීමෙන් සාර්ථක තේමාවක් ගොඩනගාගත හැක. එමගින් සාර්ථක ම වි ක්‍රියා නිෂ්පාදනයක් මගින් එම සතුරු සංවිධානය තුල හැඟීම් උත්තේජනය කර ගැටුම් ඇතිකළ හැක.

## හමුදමය ම වි ක්‍රියාවන්හි සාර්ථකත්වය

හමුදමය ම වි ක්‍රියා නිෂ්පාදනයන්ගේ සාර්ථකත්වය හුදෙක් රඳ පවත්වනුයේ එය ම වි ක්‍රියා දමය ඔස්සේ නිෂ්පාදනය වුවහොත් පමණි. ම වි ක්‍රියාදමය (රූපය -2) හි අංක 6,7 හා 8 යන අදියරයන් නොනවත්වා පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ. මෙම අදියරයන්හි දී ප්‍රථමයෙන් නිෂ්පාදනය කර බෙද හරිනු ලැබූ ම වි ක්‍රියා නිෂ්පාදනයේ සාර්ථකත්වය නොනවත්වා විශ්ලේෂණය කරනු ලබයි. එමගින් එම නිෂ්පාදනය සඳහා නවීකරණයන් අවශ්‍ය වන්නේ ද. ප්‍රචාරක මාධ්‍ය වෙනස්කළ යුතු ද හෝ තීරණය කළ හැක. උදාහරණ ලෙස ප්‍රථම නිෂ්පාදනයේ ඇති සාර්ථකත්වය විශ්ලේෂණය කිරීමේදී, එම නිෂ්පාදනයෙහි, භාෂාවෙහි යම් දෝෂයක් වේ නම් එය නැවත නවීකරණයකර ප්‍රචාරය කළ හැක. නොඑසේ නම්, ප්‍රථම නිෂ්පාදනය වැරදි මාධ්‍යයක් තුලින් ප්‍රචාරය කර ඇත්නම්, එය සුදුසු මාධ්‍යයක් කරා යොමුකර විය හැක. හමුදමය ම වි ක්‍රියාවන්හි අසාර්ථකත්වයට ප්‍රධාන වශයෙන් බලපාන හේතු සාධක පහත පරිදි දක්විය හැක.

1. ප්‍රේක්ෂක හෝ පාඨක ජන කොට්ඨාශයේ භාවිතාවන භාෂාවට වෙනස් භාෂාවකින් ම වි ක්‍රියා නිෂ්පාදනයකිරීම.
2. එම ජන කොට්ඨාශයේ හෝ සතුරු සංවිධානයේ සාමාජිකයින් ගේ අධ්‍යාත්මිකත්වය විශ්ලේෂණය නොකර ගැඹුරු අරුත්වලින්පිරී නිෂ්පාදන එලි දක්වීම.
3. ඉලක්ක ප්‍රේක්ෂකයින් හට නොමැති මාධ්‍යයක් තුලින් එම නිෂ්පාදනය ප්‍රචාරය කිරීම (උදා:- විදුලි බලය නොමැති ප්‍රදේශතුලට රූපවාහිනී මගින් ම වි ක්‍රියා නිෂ්පාදන ප්‍රචාරය කිරීම.
4. නිවැරදි වර්ණ රටාවල් යොද නොගැනීම
5. නියමිත ඉලක්ක ප්‍රේක්ෂක කොට්ඨාශය හඳුනා නොගැනීම
6. නියමිත තේමාව නිවැරදි තොරතුරු හා සාධක මගින් ගොනු නොකර ගැනීම

හමුදය ම වි ක්‍රියා නිෂ්පාදනය කිරීමේ දී ඉහත කරුණු ගැන දැඩි අවධානයක් යොමු කිරීම ඉතා වැදගත් වේ. එසේම, නියමිත තොරතුරු හා සාධක ගොඩ නැඟීම දිගුකාලීනව කරනු ලැබූ පර්යේෂණ හා අධ්‍යයනයන්ගෙන් විය යුතු ය. එම නිෂ්පාදනයේ සාර්ථකත්වය විශ්ලේෂණය කිරීම සඳහා බුද්ධි තොරතුරු රැස්කිරීමතවත් වැදගත් කාර්යයකි. මේ සඳහා විශේෂ නියෝජිතයින් හෝ බුද්ධි අංශය මගින් සිදුකළ හැක.

## ප්‍රතිවිරුද්ධ ම වි ක්‍රියා නිෂ්පාදනය (Counter - psy Op productions)

ම වි ක්‍රියා නිෂ්පාදන මිතුරු පක්ෂය මෙන්ම සතුරු පක්ෂය විසින් ද කරනු ලබයි. මෙය විශේෂයෙන්ම යුද වාතාවරණයක් තුළ සිදුවේ. මෙහි දී සතුරු ම වි ක්‍රියාවලට ප්‍රතිවිරුද්ධ ම වි ක්‍රියා සිදුකිරීම ඉතා වැදගත් වේ. මේ සඳහා පහත ක්‍රියා මාර්ග ගත යුතුය.

1. සතුරු ම වි ක්‍රියාවන්හි ප්‍රේක්ෂක ජන කොට්ඨාශය හඳුනා ගැනීම
2. සතුරු ම වි ක්‍රියා නිෂ්පාදනය විශ්ලේෂණයකිරීම
3. එමනිෂ්පාදනය කොතෙක් දුරට ජන කොට්ඨාශය තුළට කා වැදී ඇද්දැයි අධ්‍යයනය කිරීම
4. එම නිෂ්පාදනයේ තේමාව හා පණිවුඩය අසත්‍ය බව ඔප්පු කිරීමට සාධක එක් රැ ස් කිරීම
5. ප්‍රතිවිරුද්ධ ම වි ක්‍රියා නිෂ්පාදනය (මෙය ම වි ක්‍රියාදමය මත සිදුවිය යුතුය)

## සංක්ෂිප්තය

පාඨක ඔබ හට ම වි ක්‍රියා යනු කුමක්ද? එහි ඇති වැදගත්කම හා සාර්ථකත්වය ගැන ඉතා සරල ලෙස පැහැදිලි කිරීම මාගේ පරමාර්ථය විය. කෙසේ වුව ද, ම වි ක්‍රියා යන විෂය පිළිබඳ ව ගැඹුරින් අධ්‍යයනය කිරීම මගින් එහි ඇති වැදගත්කම තව තවත් තහවුරු වනු ඇත. අද ලෝකයේ බොහෝ දියුණු රටවල් පවා දේශපාලනික වශයෙන් හෝ හමුදමය වශයෙන් දීර්ඝකාලීනව සැලසුම් කළ ම වි ක්‍රියා ක්‍රියාත්මක කර ඇත. මේවායෙහි ප්‍රතිඵල අනාගතවෙය් දී අපහට දක ගත හැකිවනු ඇත.

'යුද්ධයකින් තොරව සතුරා පරාජය කිරීම මනෝ විඥානාත්මක ක්‍රියාවන් හි දක්ෂතාවයයි'

ලුතිනන් කර්නල් ජේආර් කුලතුංග පීඑස්සී ශ්‍රීලපාහ
(Dip in psy ops and Civ affairs USAJFKSWCS)

# චතුර කථිකත්වයේ සාර්ථක මග

තම සිතුවිලි ශබ්දයක් බවට පෙරලීමේ හැකියාව මනුෂ්‍ය වර්ගයාට පමණක් හිමි වූ අති උතුම් දයාදයකි. මෙයට අප කථා කිරීමේ හැකියාව යැයි කියමු. හමුද ජීවිතයේ දී සාර්ථක කථිකත්වය තුලින් අපට ලබා ගත හැකි දේවල් බොහෝ ය. සාර්ථක නායකයෙක් යනු තර්කානුකූලව සිතා තම අදහස් ඉතා ලිහිල්ව හා සාර්ථකව ප්‍රකාශ කිරීමේ හැකියාව හා ගුණාංග ඇති කෙනෙකි. සාර්ථකව කථා කිරීමේ හැකියාව හමුද ජීවිතයේදී සමාජමය හා වෘත්තිමය වශයෙන් අත්‍යවශ්‍ය ගුණාංගයකි.

ධෛර්යයෙන් යුතුව තම අසන්නන්ට මුහුණදීම එතරම් බැරුරුම් කර්තව්‍යයක් නොව එය මනුෂ්‍යයෙකුට පමණක් සමාජයෙන් හෝ දයාදයක් වශයෙන් හෝ ලැබී නොමැත. ලෝකයේ බිහි වූ ඉතා ශ්‍රේෂ්ඨ කථිකයින් පවා ආරම්භයේ ප්‍රේක්ෂක භීතිය ඉදිරියේ අසරණ තත්ත්වයන්ට පත් වූ අය වෙති. ඔබ සම්බන්ධයෙන් මෙය ඉතා අසාමාන්‍ය දෙයක් යැයි සිතින් මවා නොගන්න. ඔබ යම් දේශණයක් ආරම්භ කළ විට ඔබට වැටහේවි ඔබ මේ මහජන එහෙමත් නැත්නම් ප්‍රේක්ෂක භීතිය මොහොතකට පමණක් සීමා වන බව ආත්ම විශ්වාසය ලබා ගැනීම සඳහා ඔබට පුහුණුවීම් සහ වඩ වඩාත් දේශණ පැවැත්වීම තුලින් ලබාගත හැක.

**විශේෂ ගුණාංග**

කථිකයාට තම හදවතින් මරණය හා ඇඟ තුලින් සත්‍යය හා අව්‍යාජ යමක් ප්‍රකාශ කිරීමට තිබේ නම් බොහෝ විට එය ඉතා සාර්ථකව කළ හැක. නමුත් යම් අවධානයකින් පහත සඳහන් ගුණාංග අනුගමනය කිරීමෙන් සාර්ථකව කථිකයෙක් විය හැක.

I. සූදනම් වීම
ii. භාෂාව
iii. ඉදිරිපත් කිරීම
iv. ශෛලිය

**i. සූදනම් වීම:**

මොකක්ද මේ සූදනම් වීම? යාන්ත්‍රිකව කොළයක සටහන් කිරීමද එහෙත් නැතිනම් ඡේදයක් මතක් කිරීම ද නැත. සත්‍යයෙන්ම නියම සූදනම් වීම යනු ඔබ තුලින් කරුණු ගෙන සහ ඔබගේ සිතුවිලි එකතු කර පිළිවෙළකට සකස් කර ගැනීම වේ. එක තැන සිට ඔබගේ කථාව සැදීමට හෝ එය පිස ගැනීමට සූදනම් නොවියයුතු යි. කතාවේ වර්ධනයක් තිබිය යුතු අතර, ප්‍රථමයෙන් ඔබගේ මාතෘකාව තෝරා එය තුලින් සිතන්න. ඒ තුල සැහෙන්න සිහින දකින්න. ඔබගේ යහළුවන් සමග සාකච්ඡා කර එම මාතෘකාව සංවාදයක් ලෙස කරගෙන යන්න. ඉන් පසු ඔබගේ සිතුවිලි කොළයක ලියා තව තව කරුණු එක්රැස් කර ගන්න.

ඔබගේ ස්වාධීන සිතුවිලි තුලින් කරුණු එක්රැස්කළ පසු නැවත ඔබගේ මතකය තුළින් එය ස්පර්ශණය කරන්න. පුස්තකාලයකට ගොස් එම මාතෘකාව යටතේ ඇති පොත් කියවන්න. සරල හා අර්ථවත් කියමන් තෝරා ගන්න . තව ද ඔබට අවශ්‍ය ප්‍රමාණයට වඩා කරුණු එක්රැස් කිරීම රුකුලක් වේ. ඔබ අවශ්‍ය කරුණු එක්රැස් කර ගත් විට ඒවා තර්කානුකූලව පිළිවෙළකට සකස් කර ගන්න. නමුත් කථාව ගොඩ නැගීම සහ අදහස් හැසිරවීම සඳහා විශේෂ වූ නීති රීති නැත. හැම දේශණයකදීම අදල කරුණු පැහැදිලිව ඉදිරිපත් කරන්න. කෙසේ වෙතත් ඔබගේ කරුණු සකස් කිරීමේ දී පහත සඳහන් කරුණු සිතේ තබා ගත යුතුයි.

අ. ආරම්භය හා අවසානය එතරම් දිගු නොවිය යුතු යි.
ආ. තනි අදහසක් දිගටම විස්තර නොකළ යුතුයි.
ඇ. වැදගත් කරුණු වලට ප්‍රමුඛත්වයක් දිය යුතුයි.
ඈ. දේශණයේ එක් කොටසක් අනෙක් කොටසට ගැලපීමක් අනුව සම්බන්ධතාවය තිබිය යුතුය
ඉ. පැටළුණු හා ව්‍යාකූල අදහස් සම්බන්ධ නොවිය යුතුයි.

සම්පූර්ණ හා හොඳින් පෙර පුහුණු කරන තුරු කිසිම දේශණයක් සාර්ථක සූදනම් වීමක් දක ගත නොහැක. ඔබගේ සගයන් ඉදිරියේ පෙර පුහුණුවීම් කරන්න. එවිට ඔබට සභාවක් ඉදිරියේ ඇති භීතිය නැති කර ගත හැක. පෙළවල් හා ඡේද පාඩම් කරනවාට වඩා එය තුළ ඇති අදහස් හා ඒවා ප්‍රකාශ කළ යුතු ආකාරය දන ගන්න.

**ii. භාෂාව:**

කිසිදු දේශණයක භාෂාවට වැඩි බැරුරුම් බවක් හෝ දෙවැනි තැනක් නොදිය යුතුය. ඇත්ත වශයෙන්ම කථාවේ සංක්ෂිප්ත භාවය හා බලවත් භාවය රඳ පවතින්නේ එහි අදහස් මතට වඩා භාෂා මතය. මේ නිසා වාක්‍ය හා වචන භාවිතය ගොඩ නැගීමේ දී සම්පූර්ණ අවදනය යොමු විය යුතු ය. නරඹන්නන් සතුටු කිරීම සඳහා හෝ ඔබගේ නැතිවී ගිය ආත්ම ශක්තිය ලබා ගැනීමට අනවශ්‍ය වචන භාවිතා නොකරන්න. අපැහැදිලි අසභ්‍ය වචන දෙක තුනකින් ඔබගේ මුළු දේශණයම ශූන්‍ය හා නිසරු විය හැක.

**iii. ඉදිරිත් කිරීම**

අ. දේශකයාගේ හැකියාව දක්ෂ භාවය ඔහු ඒ ඉදිරිපත් කරන ආකාරය අනුව නිශ්චය කරනු ලැබේ. චතුරත්වය සමබරතාවය සහ හඬ පාලනය සහ කරුණු තුළ ඇති සම්බන්ධතාවය හොඳ දේශණයකට උදව්වක් වනු ඇත. මෙවැනි දේවල් ආත්ම ධෛර්යය සහ විෂය හා භාෂාවේ පෝෂණ බව අනුව තීරණය වේ.

**ආ. හඬේ ගුණාංග**

හොඳ කට හඬක විවිධත්වයක් හා පැහැදිලි බවත් තේරුම් ගැනීමේ හැකියාව හා ප්‍රසන්න භාවය ගැබ් විය යුතු ය. කථා කිරීමේ දී ආශ්වාස, ප්‍රාශ්වාස දෙක අතර, කාලය කෙටි විය යුතු ය. එවිට පෙණහළු වලට තබා ගත යුතු හුස්ම ප්‍රමාණය අඩු වනු ඇත.

නැතහොත් එයට අමතරව වෙහෙසක් ගැනීමට සිදුවෙනවා. සාර්ථක අත්දැකීම් ඇති දේශකයා තමාට කථා කිරීමට වේගය යෙදිය යුතු ශක්තිය හා පාලනය කළ යුතු ආකාරය දන සිටියි. පාලනය අඩු කම එක පැත්තකින් ගැස්සීමක් ඇති කිරීමට හෝ විසිල් හඩක් පිරීමක් ද වේ.

**ඈ. ආත්ම ධෛර්යය**

ආත්ම ධෛර්ය සූදනම් වීම තුලින් ඇතිවේ. උදාහරණයක් ලෙස ඔබගේ පන්තියේදී ඔබ නොදන්නා දෙයක් ගැන ප්‍රශ්ණයක් ඇසූ විට ඇති වන හැඟීම සමග ඔබ පිළිතුරු දන්නාවිට දී ඇති වන හැඟීම් ද සමග සංසන්ධනය කර බලන්න. ඔබට පිළිතුරු ලැබේවි. සමබරව කෙලින් සිට ගැනීමෙන් සහ සුව පහසු ඉරියව් දේශකයාගේ ආත්ම විශ්වාසය ගැන සාක්ෂි දරයි. ආත්ම විශ්වාසය ඇති දේශකයාට චලනය පහසුය. අනවශ්‍ය ගැස්සීම් සිදු නොවේ. ඕනෑම දේශකයෙක් දේශණ ආරම්භයේ දී පමණක් භීතියකින් පෙලිය හැක.

**ඈ. නෙත ගැටීම:**

දේශණය පැවැත්වීමේ දී දේශකයා ප්‍රථමයෙන් නෙත ගැටීම ගැන අවධානය යොමු කළ යුතු ය. තමා කතා කරන්නේ වහළයට නොව තමා ඉදිරියෙන් ඇති සභාවට ය. ඔබ ඔවුන්ට දකීමට සැලැස්විය යුතු ය. දේශකයාගේ ප්‍රධාන අරමුණ තම අදහස් ප්‍රකාශ කිරීමයි. මේ නිසා දේශකයාට රුකුලක් වනවා ප්‍රේක්ෂකයා තමාගේ අදහස් තේරුම් ගත්තා ද නැද්ද? කැමැත්තේ අසා සිටිනවා ද යන වග දන ගැනීම. එසේ නොවුවහොත් ඔහුට සිදුවෙනවා තමාගේ කතාව තවත් රසවත් කිරීම හෝ නිසරු කරුණු ඉවත් කිරීම හෝ අවදියක් හා සංවාදයක් ඇතිවන වචන භාවිතා කිරීම. අසන්නාට තවත් යමක් ඇසීමට තරම් මානසික තත්ත්වය හා තව වැඩිදුර ඇසීමට වුවමනා තරමට පොළඹවා නවත්වන්න.

**ඉ. හැසිරීම්:**

දේශකයාගේ හැසිරීම් ඉතා වැදගත් වේ. හොඳ හැසිරීම් දේශකයෙකුට දේශනයේ අලස භාවයෙන් මිදී ඉදිරියට පවත්වා ගත හැක. ඔහු කෙලින් සිටගෙන සිටිය යුතු ය. කෙටියෙන් කියනවා නම් හොඳ හැසිරීමකින් යුත් දේශකයා අවධානයකින් ඒ දෙය කරන බවත් ඔහු කියන දේ ඔහු දන්නා බවත් සභාවට දනීමට සැලැස්විය යුතු ය.

**ඊ කථා කිරීමේ වේගය හා නැවතීම:**

කථා කිරීම, වදන පිට කිරීමේ වේගය අසන්නාට තේරුම් ගැනීමේ හැකියාවට තරම් පහසු විය යුතුය. එවිට ප්‍රේක්ෂකයාට එය ඉතා හොඳින් අවධාරණය කර ගත හැකි . ඔහු කෙලින් සිටගෙන සිටිය යුතුය. වැදගත් හා බැරෑරුම් ප්‍රශ්න ඉතා සෙමින් ප්‍රකාශ කළ යුතුය. එවිට එය ප්‍රේක්ෂකයාට එය හොඳින් අවධාරණය කර ගත හැක. නැවතීමෙන් ප්‍රධාන වශයෙන් කථා කිරීමට ඇති සිතුවිලි පැහැදිලිව සරලව හා රිද්මානුකූලව ප්‍රකාශ කිරීමට හැකියාව ලැබෙනු ඇත. නමුත් නැවතීම සිතුවිලි අතර, සිදු නොවීමට වග බලා ගත යුතුය. එයින් අසන්නා ව්‍යාකූල තත්ත්වයට පත්වේ.

**iv. ශෛලිය:**

අ. අපි ප්‍රේක්ෂකයින්ට කතා කරන විට මිත්‍රශීලිත්වයෙන්, ප්‍රබෝධයෙන් හා උත්සාහයෙන් කථා කළ යුතුය. නමුත් අසාමාන්‍ය හා නම්‍ය අනුකරණයෙන් ඉදිරිපත් කිරීම අගය කළ යුතු නැත. අනවශ්‍ය අත් වැනීම් රඟපෑමකට යැමෙන් ඔබ කීමට ඇති දේ වෙනස් කර, තව ද වෙනත් තේරුමක් ලබා දීමට හැකියාව ඇති බැව් මතකයේ තබා ගත යුතු ය.

**විශේෂ කරුණු:**

අ. ප්‍රේක්ෂකයා පැමිණීමට පෙර පැමිණීමෙන් ඔබ එයට කැමැත්තක් ඇති බව වැටහීමක් ලබාදෙයි. තව ද ව්‍යාකූල තත්ත්වයට පත්වී ඇති බව නොපෙනේ.

ආ. හොඳින් සිත් ගන්නා සුළුව අඳින්න. හොඳින් ඇඳ පැළඳ ගැනීම කෙනෙකුගේ ආත්ම ධෛර්ය ආත්ම විශ්වාසය විදහා දක්වයි.

ඇ. ඔබට වෙනසක් ඇති විට කථා නොකරන්න. කුමක් නිසා ද යත් මිනිසුන් නිතරම ක්‍රියාශීලී නායකයින් වටා රොක් වෙයි.

ඈ. කථාව ආරම්භය ඉතා වැදගත් වෙයි. එවිට සභාව නැවුම් ප්‍රබෝධයකින් හා පිරිසිදු සිතකින් සිටින බැවිනි.

දේශණය අවසානයේ ඉතා වැදගත් වෙයි. ඔබ අවසානයට කියන ද ඉතා හොඳින් හා දිගු කාලයක් මතක තබා ගනී. කිසිම දවසක 'මට මෙච්චරයි කියන්න තියෙන්නේ' කියා අවසන් නොකරන්න. ඒ වාගේම හොඳ කථාවක් යනු සම්පූර්ණ සූදනම් වීමක්, ආශ්වාද ජනක ආරම්භයක්, තර්කානුකූල මැද භාගයක් හා සිතුවිලි ප්‍රබෝධය කිරීමේ අවසානයක් තිබිය යුතු ය.


නි/62705 2
ලුතිතන් එන්ජීඑස්පීකේ රණසිංහ
ශ්‍රීලපාභ
7 ශ්‍රීලපාභ

# යුධ බිමේ සිට ආදර බිරිඳ

1997.03.07 වන දිනට ජීවන මාවතේ පසුකර
නව වසරකට පා තබන මගේම ආදර අනුෂා
ඔබේ උපන් දින ද ඔබේ ළඟින් හිඳ
සුභපතන්නට තරම් මට වාසනාවක් නොමැති
ඒ අද මා උතුරුකරයේ තීරණාත්මක
මෙහෙයුමක සිටින බැවිනි
ඔබෙන් සමුගෙන සැතපුම් සිය ගණනක් දුර
ඇවිත් අවි අත දරා සතුරන් සමග
සටන් විදින්නේ අපේ මේ පුංචි රට රුදුරු
ත්‍රස්ථවාදීන්ගෙන් බේරා ගැනීමේ උදර
චේතනාවෙනි
ගතින් ඔබ ළඟ හිඳ සුභපතන්නට
නොහැකිවුනත්
යුධ බිමේ සිට පතන්නම් සුභ උපන්දිනයකට
ආසිරි පත්ඉරුවකින් මෙසේ
සාමය උදාවූ යම් දිනෙක ලබෙන සුලු
විරාමයකින්
ඔබ වෙත එන බලාපොරොත්තුවෙන් නිහඬ වන
අතර සාප නොකරන්න කුරිරු යුද්ධය මිස
අහිංසක මා හට

සෙ/300546
සාසෙ ප්‍රසංගඑස්එල්එල්
4 ශ්‍රීලපාභ ප්‍රවාහන අංශය

# "ඔබ ඇසුරු කල යුතු මිතුරන් සහ ඔබ ඇසුරු කරන මිතුරන් හඳුනාගන්න"

ඕනෑම අයෙකුගේ ජීවිතයෙහි දියුණුව ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකිය. ඉන් පළමු වැන්න 'ලෞකික' දියුණුව වන අතර, දෙවැන්න ආධ්‍යාත්මික දියුනුව වේ. 'ලෞකික' දියුණුව යනු මෙලොව ජීවිතය සාර්ථකව පවත්වාගෙන යාම පිණිස ලබා ගත යුතු දියුණුව වේ. මේ සඳහා ශිල්පීය ශාස්ත්‍ර ඉගෙනීම, රැකියාවක යෙදීම සහ ප්‍රමාණවත් ධනයක් උපයා ගැනීම යනාදී කරුණු මූලිකව බලපානු ඇත.

පුද්ගලයෙකුගේ චරිතය යහපත් ලෙස පවත්වාගෙන යෑම තමා 'ආධ්‍යාත්මික' දියුණුව වර්ධනය කර ගැනීමට මහෝපකාරී වේ. තම ජීවිතයෙහි මෙම අංශ දෙකෙහි දියුණුව කරා යාම පිණිස 'කල්‍යාණ මිත්‍ර ආශ්‍රය' අත්‍යවශ්‍ය වේ.

ඔබ ආශ්‍රය කරන මිතුරා 'කල්‍යාණ මිත්‍රයෙක්' නම් ඔහු පහත සඳහන් ගුණාංග වලින් යුක්ත අයෙකු වේ.

අ. තම මිතුරා ඉගෙන ගන්න අවස්ථාවේදී ඒ සඳහා උදව් කරයි

ආ. තමාගේ දුර්වල ද සොයා බලා ඉන් මුදවා ලීමට අවශ්‍ය උපදෙස් දෙයි.

ඇ. රැකියාවේ දී පැන නගින දුෂ්කරතා මග හරවා ගැනීමට සහාය වේ.

ඈ. තමන් උපයා ගන්නා ධනය අරපිරිමැස්මෙන් යුතුව පරිහරණය කරන ආකාරය පිළිබඳවත් එය රැකගැනීමටත් මග පෙන්වයි.

ඉ. තමා නොමග ගොස් දුසිරිත්වල යෙදෙයි නම් එයින් ඔබ මුදවා ගෙන සුචරිතවත් අයකු බවට පත් කිරීමට වෙහෙසෙයි.

ඉහත ලක්ෂණ වලින් පිරුණු පුද්ගලයින් ඇසුරු කරන අය කිසිදු විටෙක අසරණ තත්ත්වයට පත් නොවේ. මෙලොව වාසය කරන ඕනෑම පුද්ගලයෙකුට තම ජීවිත, කාලය තුළ දී නොයෙක් විදියේ බාධක කරදර මුහුණ පෑමට සිදුවන අතර, තනිවම මැඩපවත්වා ගෙන ජීවත්වීම ඉතා අපහසුවේ. මේ සඳහා බාහිර සහාය ද ඔහුට අවශ්‍ය වේ. මෙම බාහිර සහාය කල්‍යාණ මිත්‍ර ඇසුර ඇත්නම් තිබඳව ලැබෙනු ඇත. කල්‍යාණ මිත්‍රයා තම මිතුරාගේ විපතෙහි දී කිසිම විටක අතහැර නොයයි. විපතින් මුදවා ගෙන සැප ලඟාකර දීමට දිරි ගනියි. මේ නිසා කල්‍යාණ මිත්‍රයා ජීවිතේ දී ලැබෙන සම්පතක් ලෙස සලකනු ලැබේ.

බුදුරජාණන් වහන්සේගේ දේශනාවට අනුව කල්‍යාණ මිත්‍රයා කවුරුන්දැයි හඳුන්වා ඇත්තේ පහත ආකාරයට යි.

අ. ශ්‍රද්ධාව — තෙරුවන් ගුන ඇදහිම.

ආ. ශීලය — කය වචනය දෙකෙහි සංවරය

ඇ. ත්‍යාගය — පරිත්‍යාගශීලි වේ.

ඈ. ප්‍රඥව — මනා නුවනින් යුක්ත වීම

බුදුරජාන් වහන්සේ විසින් මිතුරන් ප්‍රධාන වශයෙන් කොටස් 08 කට බෙදා දක්වා ඇත. ඉන් හතර දෙනෙකු කල්‍යාණ මිතුරන් වන අතර, ඉතිරි සිව් දෙනා මිත්‍ර ප්‍රතිරූපයන් වේ. උන්වහන්සේගේ දේශනාවට අනුව කල්‍යාණ මිතුරන් සිව්දෙනා පහත පරිදි වේ.

1. **උපකාරක මිත්‍රයා** : ඔබ සිහි කල්පනාවෙන් තොරව නොමග ගොස් සිටින විට තිසි මගට හරවා ගෙන රැක ගනී. එවැනි අවස්ථාවක ඔබට අයත් දේ රැක දෙයි. සොර සතුරන් බිය පැමිණි විට ඔබට පිහිට වෙයි. ඔබට යම් අවශ්‍යතා ඇති වූ විට අවශ්‍ය ප්‍රමාණයට වඩා එය රැක දෙයි. මෙවැනි ගතිගුණවලින් හෙබි පුද්ගලයා උපකාරක මිත්‍රයා වේ.

2. **සමාන සුඛ දුක්ඛ මිත්‍රයා** කිසිවෙකුට නොකියන රහස් කරුණු ඔබට පවසයි. නම් ඔබේ රහස් දෙවල් අනුන්ට නොකියා රහසිගතව තබාගනියි නම් විපත් පැමිණ විට මොන අවස්ථාවකදීවත් ඔබඅතහැර නොයයිනම් ජීවිත පරිත්‍යාගයෙන් වුව ද ඔබට යහපතක් සැලසීමට ඉදිරිපත් වේ නම් ඔහු සමාන සුඛ දුක්ක (සැපදුක් දෙකෙහි සමාව පවත්නා) මිත්‍රයා වේ.

3. **අත්ථක්කායි මිත්‍රයා** : ඔබ වරදින් මුදවාගෙන යහපතෙහි යොදවා ඔබ නොදන්නා දහම් කරුණු ආදිය කියා දෙයි. තව ද දෙව් මිනිස් ආදී සුගතිගාමී පිළිවෙත් කියාදෙන මෙහු අත්ථක්කායි (දියුණුව කියාදෙන) මිත්‍රයා වේ.

4. **අනුකම්පක මිත්‍රයා** : ඔබ පරිහානියට වැටෙනු දුටු විට දුක්වෙයි නම්ඔබ දියුණු වන විට සතුටු වෙයි නම් ඔබට දෙස් නගලන වුන් එයින් වලකී නම්, ඔබේ ගුන කියන්නවුන්ට පසසයි නම් ඔහු අනුකම්පන (අනුකම්පාව දක්වන) මිත්‍රයා වේ.

ඉහත කී මිත්‍රයින් පමණක් ඔබගේ ජීවිතය කාලය තුළ ආශ්‍රය කිරිම පිණිස තෝරා ගත යුතු බව සඳහන් කරමි. එවැනි මිතුරන් ඇසුරු කරන ඔබ ද තව කෙනෙකුට කල්‍යාණ මිත්‍රයකු වියයුතු ය.

බුදුන් වහන්සේ දේශණාවට අනුව මිතුරන් ලෙසින් ඇසුරට වින් ඔබ විපතෙහි හෙලන්නෝද සමාජයෙහි ජීවත් වෙති. මොවුන් මිත්‍ර ප්‍රතිරූපයක් ලෙස හඳුන්වා ඇති අතර, ඔවුන් ද සිව් දෙනෙකි. ඔවුන්ගේ ගතිගුණ පහත සඳහන් පරිදි වේ.

1. **අඤ්ඤදත්ථහර (යමක් ලබා ගැනීම සඳහා ම ඇසුරට ආ තැනැත්තා) මිත්‍රයා**

අ. සෑම විටකම ඔබෙන් යමක් ලබා ගැනීමට උත්සාහ කරයි

7. **Regtl Publications**

Following books were published and distributed to all Bns with a view to protect important documents.

a. Offrs' Career Plan.
b. WO's/Sgts Seniority List
c. The List of SLLI Associate members
d. Loan Scheme.
e. Death Donations Scheme.
f. KIA/MIA List
g. The List of WIA pers.
h. Permanent Category List.
j. Seniority List - Other Ranks
I. History of the Sri Lanka Light Infantry (The Presentation Hand Out which was distributed to O/ Cdts')
m. Field Condemnation Board of Survey and Accounting of stores in Peace Time.
n. Reglt Council and Staff Officers.

8. **Musical Programme for the Disabled Soldiers.**



a. Music Composer Mr. Chandimal Fernando and the 2nd Connection musical night was held on 07 Sept 97 at the Regimental Centre for pleasure of the disabled Soldiers. Mrs. A. K. Jayawardhana participated as the chief guest.
b. "Sonduru Athithaya" - The First one man show of Mr. T. M. Jayaratne



The first one man show of Mr. T. M. Jayaratna was organised for joy of all disabled sldrs who are at the Regimental Centre on 24 Sept. 1997. Army Oriental Orchestra conducted the music. Brig TTR de Silva RWP RSP psc participated as chief guest.

9. **Army day Programme**

a. As per the direction of HQ - 11 Div a ceremonial guard turn out was presented to Maj Gen J Nammuni USP at the main entrance of 11 Div HQ on 10.10.97
b. Tree planting programme was conducted.
c. The children's orphanage at Dikhathama in Homagama was colour washed and special lunch was given to the children.
d. A special Bodhi Pooja was organized at the Regimental



Centre to invoke blessing on all Offrs and ORs who are performing the duties in North and East.

10. **Sports Activities**

The Disabled Sports Team of RHQ participated in under mentioned sports meet and following performances were reached.

a. **Escolympics Meet (v)**

| Name | Event | Place | Medal |
|---|---|---|---|
| S/30702 Pte Ranjith Seneviratne DM | 400 m | First | Gold |
| | 800m | First | Gold |
| S/304189 L /Cpl Priyadashana KVC | Free Style 100m | First | Gold |
| | Backward Stoke 100m | First | Gold |
| | Breast Stroke 50m | Second | Silver |
| S/301007 L/Cpl Rupasinghe SARD | 200m | First | Gold |
| | 100m | Second | Silver |
| S/15750 Cpl Sampath HACP | Putting the Weight | Third | Bronze |
| | Throwing the Javelin | Second | Silver |
| S/15461 L/Cpl Widyarthana DG | Wheel Chair 100m | Third | Bronze |

b. **Swimming Meet held in India at Banglore**

| Name | Event | Place | Medal |
|---|---|---|---|
| S/304189 L/Cpl Priyadashana KVC | Backward Stroke 200m | Second | Silver |
| | Backward Stroke 100m | Second | Silver |
| | Free Style 500 m | Second | Silver |
| | Free Style 4x 100 | Second | Silver |
| | Free Style 100m | Third | Bornze |
| | Medley 4 x 100 m | Third | Bronze |

c. **116th Anniversary Athletics Meet of SLAVF HQ**

| Name | Event | Place | Medal |
|---|---|---|---|
| S/21291 Cpl Weerawansa IDA | 100m | Second | Silver |
| S/21603L/Cpl Fernando VPK | 200m | First | Gold |
| S/01740 Pte Nishantha Fernando MS | 100m | First | Gold |
| S/00769 Pte Ghanapala HAK | 200m | Third | Bronze |

d. **Soft Ball Cricket Encounter 1997.**

This tournament was Organized by the Lion Club of Dehiwala and the Regtl Disabled Cricket Team participated and shown following performances.

Best Bowler - S/302627 L/Cpl Ranasinghe
Best Batsman - S/301757 L/Cpl Kumarasinghe
Best Fielder - S/304370 Pte Buddika VA
Man of the Match - S/301757 L/C Kumarasinghge

d. **Inter Regt Disabled Cricket Tournament 17 Oct 97.**

The Regtl disabled Cricket team won the Champion ship for year 1997.

11. **Visit of O/Cdt Intake 45 and L/O/Cdt Intake 06 on 17 Oct 97.**

105 x O/Cdts visited the Regtl Centre at the given date at 1600 hrs. The following events were organized to entertain them.

a. Presentation regarding History of the SLLI and Some of the Major Offensive Ops carried out by the SLLI Bns.
b. Visit to the Regtl Museum
c. A Wpns display including Platoon and Bn Supports Wpns.
d. Dinner at the Regl Offrs' Mess.

12. **Presentation of Memento the Regtl WO's and Sgts Mess on 18 Oct 97.**

The Memento were presented to the SNCOS' who have been Commissioned and retired after completing 22 years and 12 years of service.

In addition to that the families of KIA SNCOS and retired SNCOS were invited and given a special Tea Party and Lunch. A special Memento were presented to the NOK of the SNCOS Centre Comdt participated as the chief guest on this occasion.



# ජාතික නිදහස

සැමවිට බුදු ගුණ අදහන මිනිසුන් සිටිනා මණහර ලක් දෙරණේ
ජීවය ගෙවුමට ගොඩ මඩ සරුකර දෙන ලෙස දෙවියන් තම දින්නේ
මේ හැම දේටම පවුරක් බඳුවුන පැනයකි විසඳුම් නැහැ දෙන්නේ
ජාතික තිසදහස ඇති වුවොතින් කොතරම් වටී ද ලක් දෙරණේ

ශිෂ්‍ය සමාගම් බලා සිටිතීතේ අනාගතය සරු කර ගන්න
කිසිවෙක් නැහැ ඒ සජත සමාජමෙ අවනින්ද නම් පිළිගන්න
සමස්ථ ලක් වැසි සියළු දෙනාටම නිදහස් ජීවය ගෙනයන්න
ජාතික දනිදහස සලසා සැමගෙම පැතුමන් වෙනුවෙන් උර දෙන්න

එද මෙදතුර සිදු වූ දේවල් සියල්ල මනසෙහි තුරුළු කර
දුන්හිඳ ඇල්ලෙන් ගත දේවා මෙන් බියෙන් සැළුණි මිනිසුන් . නිතර
යන්නට මහතොට හැකියාවක් නැත ඕනෑකමකට දුර බැහැර
ජාතික නිදහස ඇත්නම් පමණක් මේ හැම දෙය යන්නේ පැහැර

මෙත්වා ලක්වැසි ලංකා තලයේ එක්වා නවසිය අසූ තුනේ
හටගත් කලබල හින්දලූ මෙතරම් ද්‍රවිඩ බලය අද කුපිත වුනේ
සිංහල මුස්ලිම් මිනිසුන් මරමින් ලංකා තලයට කරපු හෙනේ
ජාතික නිදහස නැති හින්දද දෙවියණි අපිටත් මෙහෙම උනේ

සිංහල දේසෙට සිංහල නිදහස පමණක් නොව උරුමව ඇත්තේ
සියළුම ආගම් කුලමල නෑකම් නොතකා නිදහස දිය යුත්තේ
මෙතරම් දේවල් වෙලා තියෙන්නේ කුමට ද නෙතු හැර බැලි යුත්තේ
ජාතික නිදහස සැමට ලැබෙනම් කියුදේ නොම වෙයි මතු මත්තේ

සාමය සමගිය අගය කරන්නට නත් අය කැමතිය පඩුරු දෙති
ඒ අස්සෙන් ගොස් වංචා විලසින් හිතවත් අයගෙන් බෙලි කපති
පනම් අටක්වී නොවටින දේවල් ගෙන නිවසුත් ගිණිබත් කරති
මේක ද 'ජාතික නිදහස' දෙවියනි බැලූවොත් සැම තැනකම පෙනෙති


සාර සදිසි නැත තීර ඩලය ඇත කෙත් වතු සාරව වැඩෙන විට
පැදි වසන්තය අත්විය යුතුමයි අස්වනු නෙලනා ගොවියන් ට
එනමුදු ඒ වෙනුවෙන් කීවොතින් පඩුරු තියන්න ද හතර වට
'ජාතික නිදහස ගැන පැවසුවොතින් කඳුළු සලන්නට වෙයි අපට

ආදී සිංහලේ වීරමුතුම්තුන් සිංහල නාමෙට සටන් කලා
සමගි දනයෙන් ඉන්නට සලසා ආගම දහමට නැඹුරු වෙලා
අසමගිකම් සහ ලෝ සන්තාපය ඇතිවෙන්නේ කෙලෙස ද මෙහිලා
'ජාතික නිදහස නැති හින්දනේ අද යන්නට බැරි පාරක බැහැලා

නෙත් කන් හනවා දුටු දේ නෑසුන, නොදකින. අයුරෙනි නෙර පෙන්නේ
කිසිදු අයෙකු නැහැ යමක් උණ ගමන් ඒ හට වග උත්තර දෙන්නේ
එපා දෙවියනේ මේවාට වෙන්නට ලක් දෙරණේ නම සුරකින්න
අවැඩ නවත්වා භීෂණ නැති කොට 'ජාතික නිදහස' ගෙන දෙන්නේ

කෙටියෙනි ඔවදන් ගෙනහැර පවේ මගෙ අදහස හා මුදු කරවා
සියළු දෙනා ලක් දරණි තලය තුල දිගුකල් සතුටින් වැජඹේවා
එලසෙම සැමගේ පැතුමන් ඉටු වී සියළු දෙනට සෙත සැල සේවා
කොටු පවුරක් ඉටු වූවා විලසින් 'ජාතික නිදහස' ගෙන දේවා

සෙ/304017, කෝප්‍රල් පියසේන සේනාධීර, ඒ ඩබ්,
11 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව
බළඇණි මූලස්ථානය, යුහ කඳවුර, අරියාලෙයි, යාපනය.




සැකසුම:

**මේජර් ඩීඑම් විජේරත්න ශ්‍රීලපාහ**

ගිතවත් පාඨකය !

උතුරේ හා නැගෙනහිර බංකරයේ රාජකාරියේ යෙදී සිටින ඔබ වෙත නිරතුරුවම ගලාඑන කවි සිතිවිලි හා සංකල්පනා සඳහා මෙම පිටු කිහිපය වෙන්ව ඇත.

ඔබගේ උසස් නිර්මාණයන් "තල් අරමේ සිට" වෙත ලැබීමට පහත සඳහන් ලිපිනයට තැපැල් කරන්න

සංස්කාරක, "තල් අරමේ සිට", වයිට් හැකල් සඟරාව, රෙම ශ්‍රීලපාහ, හමුද ජනපදය, පනාගොඩ

## MAY HE ATTAIN NIBBANA

CROWD WAS OVING, SUN WAS DYING  
STILL THERE MY EYES WERE ROAMING,  
WHITE BANNERS THAT SWAYING AROUND,  
SIGNIFIED THE SAME THAT EVERY BODY WISHED.

Ms. Devika Rajapaksha,  
Army Quarters,  
Panagoda,  
Homagama

## ලේ කිරි සුව

මස්පිඩු සිසාරා ලේ බිඳු දුවනා  
කකියන හදවතේ රිද්මය ඉකි බිඳුනා  
අම්මේ තුඹ මුහුණ මා නෙත ඉම මැවිනා  
ලේ කිරි සුවද මගේ යුධ කුටියට දූනුනා

සෙ/302334  
ලකෝ වීරවර්ධන පී  
3 ශ්‍රීලපාහ "ඩී" කණ්ඩායම  
වව්නියා

## මියැදුණ සෙනෙහස

යොවුන් ඉරක් යලි  
පායන හිමිදිරියේ  
හද මගේ පුබුදු වෙයි  
නැවුම් දවසක් සොයා....  
නිල ඇඳුම ගිනි අවිය  
ගතේ තනි මකාලයි  
නමුදු මිත තනි රකියි  
සෙනෙහසක් මියැදිලා...


2/ලුති ඩබ්ඩීආර් ගුණසේකර  
9 ශ්‍රීලපාහ - "ඩී" කණ්ඩායම  
මාදගල - පලාලි

## මව්නි, දයාබර පියාණෙනි

සිරුරේ වැඩුණු රතු ලේ රස කිර පෙරා  
දුක් කම්කටුල හාදක හදවතෙහි දරා  
වැගිරූ කඳුලු කැට සපුරක් ලෙසින් දරා  
බුදුවිය යුතුයි අම්මේ තුඹ පෙරුම් පුරා

වගුරා ඩා බිංදු අප ජීවත් කර වන්න  
තුඹ ගත් දිරිය ඇත අදමා මෙතනට එන්න  
පෙම්බර පියා දෙවියකි නිවසට උන්න  
උපදින බවේ දී තුඹ මගේ පියතුම වන්න

සෙ/302334 ලා/කෝ වීරවර්ධන පී  
ඩී කණ්ඩායම 3 ශ්‍රීලපාහ  
වව්නියා




## ජයගනිමු කෲර වූ යුද්ධය

සැඳෑ හිරුරැස් වැටෙන මොහොතේ
තල් වැටෙන් එහා ඉමේ
වැලිකඳු තිම්නතරින්
ගලා යයි රුහිරු ගංගා
වෙඩි හඬට අමතමින්
සවනකට වැටෙන්නේ
අපේ විරු දරුවන්ගේ
ඉහල චිත්ත ධෛර්යයෙන්
සතුරන් මැඩ එඩියෙන්
ජය ගනිමු කෲර වූ යුද්ධය
සැනෙන්....

2/ලුති ඩබ්ඩීආර් ගුණසේකර
9 ශ්‍රීලපාහ - "ඩී" කණ්ඩායම
මාදගල් - පලාලි

## සෙබල පෙම්වතියගෙන්

සිසුදු පිනිපොද මතින්
සෙනෙහසේ ගහ ගලයි
උණු කඳුලු කොපුල් තල
තෙමා චිත් ගෙල සිඹියි
කොතෙක් දුර සිටියත්
සිත නුඹේ ගාවමයි
කුමක් කරම් ද මෙමා
පූරුවේ පව් මගෙයි
යුධ බිමේ රුදුරු ඉම
නුඹ ගෙවයි ජීවිතය
ගම් පියසේ සිපිරි ගෙයි
ගෙවෙයි මගේ ජීවිතය
රත්තරන් ආරදය හැමදම දුක්බරය
මතු බවෙත් පතම් මම
නුඹ මගෙය - මම ඔබේ ය.///

සෙ/300992
ලාකෝ ප්‍රියන්ත කුමාර එම්
3 ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානය
ශ්‍රීලපාහ
යුද හමුද කඳවුර
හෝමාගම

## සත්ජය 03 මෙහෙයුමෙන් සඳහටම අපෙන් සමුගත් 3 ශ්‍රී ලංකා පාබල හමුදවේ හිටපු කෝප්‍රල් ගුණරත්න ආර් වෙනුවෙන් රණවිරු මල්ලී ලියූ කවි

මා හදව අයියෙ එඩිතර ලෙසින් ඔයා
විරුවෙකු විලස යුධ පෙර මුණට ගියා
රිවිරැස මෙහෙයුමෙන් නොමැකෙන මගක ගියා
සත්ජය කින් ඔබ අපගෙන් වෙන්ව ගියා

ඔබේ නිසල දේහය දුටුවිට මානෙත ට
වාවා ගනු බැරි ලෙස දූනුනා දුක සිත ට
ඔබේ නිසල දේහය ගෙන මා අත ට
හැඩුවේ කඳුළු ගංගාවක් ලෙස ට

ඉතින් අයියෙ ඔබ වෙනුවෙන් සලන් නට
තවත් කඳුළු නැහැ මසිතේ ඉතුරු කොට
ඔබේ නිහඩ ගතසිත දුටුව විට
දුවගියා මගෙ මතකය යළි අතීතය ට


ඉතින් අයියෙ ඔබ වෙනුවෙන් කියන් නට
මේ කඩදහිය මදි ඔබෙ ගුණලියන් නට
නගමින් ඔබට දෙවුලොව සැප ලබෙන් නට
නිහඩ වෙන්න අවසර සුදු අයියෙ මට

සෙ/306 387
සාසෙ වසන්ත අමරසිංහ එච්ජී.
3 ශ්‍රීලංකා පාබල හමුදව
පාලන කණ්ඩායම
4 බසේමු වව්නියාව

## සාමය ලැබෙන තුරු

විඩාබර වූ සෙබළ සොයුර
ගෙවී යයි නොමිනිසුන් මැද ජීවය
ජීවිතයක් නසන්නට රැඳුන ද අවිය අත
අහිංසකයි මම කියමි. මා අද
බුදුන් වරක් වැඩිය දහම් ද්වීපය
වී ඇත අද එකම සොහොන් බිමක්
මෙය ද, බුදු හිමියනි ඔබ දෙසූ ලෝක සාමය
අසමි, සොයුර ඔබ මෙන්ම මාද
කවරදක උදවේවි ද බුදු සම්දුන් දෙසූ ඒ සාමය

සෙ/303961
ලාකෝ දහම්සිරි ඩීඑම්
සංඥ අංශය - 4 ශ්‍රීලපාහ



# යුධබිමේ රාත්‍රිය

පිතිබිඳුවකි ජීවය තන මත බැඳුන
දුක් සෝසුසුම් ඇත තම සිත මැවුන
හඩනා සිතකි කොටි සටනින් තැවුන
අප පවි ගෙවමු සෙබලුන් වී මෙදින

තිල්වන් වලා ඉහිරියන අහස පුරා
බලමින් තැවී තනිවම හද සුසුම් දරා
ඇවිදිමි සදා සැහවී මහා වනය පුරා
සොම්නස අපේ හදවත් වෙත වඩින තුරා

ඉන්නා විටදී ගිනි අවියත් තුරුලු කරන්
කොටියන් එනවා මව් භූමිය යන්න කඩන්
තන්හා නිසා මව් භූමිය දෙකට කඩන්
තපුරු වෙලා ඇයි මේ ලෙස වෛර බැඳන්

වනයට වෙලා ගල් කුලයක් මුදුනෙ ඉඳන්
කඳුලැල් සලා නෙත කඳුලින් පුරව තියන්
සතුරන් එනතුරා වට පිට හොඳට බලන්
ඉන්නේ සඳ දුක් කඳුලැලි දෝත දරන්

කරුවල අඳුර ගලමින් එන වෙලාවේ
හිරු සඳු බැසලා සොම්කැන් ඇති වෙලාවේ
මදුරුවො ඇවිත් රඟ දෙන විට වෙලාවේ
අපි නිදි මරමු ලොවනිදියන වෙලවේ

**සෙ/306082**
**සාසෙ විමලරත්න ඩබ්එන්**
රෙජි ආබ බලඇණිය
ශ්‍රීලපාහඩ
පනාගොඩ

# දිදුලන තාරකාවක් මේ දිවිය ඔබේ

| | | |
|---|---|---|
| පු | න්සඳ ලෙසිනි ගුවනේ හිනහී | ඉන්න |
| ත | රු මුතු ලෙසින් දිස්නයදී | බබලන්න |
| ඔ | ල්වලරසන් නගා රණබිම ජය | ගන්න |
| බ | යගුළු නිවටයින් රැල වනසා | ලන්න |
| ස | සඳන්නට මෙදිය නැත ඔබ හා | කෙනෙකු |
| ද | ජය සිහදජය නංවාලනු | උතුරේ |
| කි | පුනු රුපුන සැම වනසාලනු | රිසිසේ |
| ර | ණබිම පුරා නංවනු හේෂා | රාවේ |
| ණ | ය නැති දිනූ බිමට එඩිතර කම | රැඳුනු |
| බි | ය නැත සතුරු කැල හමුවේ සිටින | නැගී |
| ම | දහස පාන සතුරන් හා ගැටෙමින් | නේ |
| එ | ඩිතර පුතුනි ඔබෙ ජය නියතයි නිති | නේ |
| ලි | යවෙයි මතුදිනක විරුනම | ඉතිහාසේ |
| ය | න්නට නොදී මැකිලා ඒ රන් | නාමේ |
| ක | එවර ගුවන් ගැබ අතරින් ඇඳුන | රුවන් |
| ල | ස්සන දිලෙන තරුවක් වේ දිවිය | උතුම් |

**සැරයන් චන්ද්‍රරත්න එච්ජීවීකේඩී**
**7 ශ්‍රීලපාහ**
**"බී" කණ්ඩායම**

# දයාබර දියණියේ


තුරුණුවිය කැපකර
රුදුරු යුද පිටියට
නුඹේ පියා අද දිනේ
ඇත පාළු වන පෙතේ
පියා හ නැති සොවින්
එපා ඉකි බිඳින්නට
සාමයෙන් ඉදිනන්නට
ලක් මවුන් එකතු කොට
ඔබ වෙතට පිය මනිම්
දයාබර දියණියේ

**බනි II තිලකසිරි පීපී**
**සී කණ්ඩායම - 4 ශ්‍රීලපාහ**

# උපන් රට

දියකර යොවුන් විය මරු කතරක උතුරුකරේ
අමතක කෙරුවෙමි දෙගුරුන් මගෙ මොහොතකට
මියැදුනත් සඳහටම ජීවය මොලොවින් මාගේ
නොහඩන් අම්මේ ලොකු පුතු මියැදුනට ඔබගේ....

**සෙ/12205 0**
**ආසෙ රංජුලසිරි ආර්ටීපී**
**8 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම -**
**අලිමංකඩ**




# යළි ඔබ එනතුරා මා

# ඉන්නේ කෙලෙසා

එකම එක සිතින් එක්වී එක බත්කරේක
සිටියා සියලු දෙන සතුටින් සැම දිනක
කොටියාගේ උණ්ඩයෙන් මියදුන පසුදිනක
එන්නට හිතකවා සිහිනෙන් ඔබට දුක

අදිටන් කරන් මේ යුද්ධය නවතන්න
කැපකර යෞවනය යුද්දෙට සැම දින
අමන ශෝද්‍රකක් අප හද තියා ගෙන
ඔබලා සැතපුනා මිහිකත බද ගෙන

එක්වී එද ඔබලා හා හැන්දවේ
බත්කරයේ ඉඳන් එක බත්පත කැවේ
බත්කරේ වෙත ත්‍රස්ත වෙඩි පාරක් ආවේ
ඔබලා මියගියා අද මගේ පපුව දැවේ

1997. 05.14 වන දින යාපනය - කයිට්ස් දූපතේ දී
ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් මියගිය 14(සෙව්) ශ්‍රීලපාහ
ඒකකයට අයත් සෙබලුන් 05 ට උපහාරයක් වශයෙනි

සෙ/01455 සාසෙ ජයතිස්ස එච්
14(සෙව්) ශ්‍රීලපාහ
යුධ හමුද කඳවුර කයිට්ස් - යාපනය

# මා දයාබරයි ඔබේ සිතට

අහිංසකයි ඔබ මා සිතුවාටත් වඩා
දයාබර ඔබ මට අවුරුදු දෙක තුනක් ගියද
මම ඔබව තේරුම් ගත්තේය. එදයි කවදද කියා
කිසිවිටකවත්
නැතත් මම එබට දයාබරයි
ඔයා මාගේ වෙන්නයි මා පැතුවේ
ඔයා ඔය හිත දඩබ්බරයි, අහංකාරයි
මම හැම එහෙකටම දයාබරයි

සෙ/306 132 ලාකෝ රත්නසිරි ඩබ්ජ්
යුධ හමුද කඳවුර
11 ශ්‍රීලපාහ - බී කණ්ඩායම
අරියාලය - යාපනය

# යුද බිමේදී ආදර සිඟිති

# දියණිය සිහිවී

මගේ රත්තරං දුව මට අනෙ සිහි වෙනවා
එන්නට බැරිව අද මම කඳුලැලි බොනවා
මොනවා කරන්න ද කළ පව් පල දෙනවා
නිවාඩු ලද විගස මම දුව ගම එනවා

මගෙ දුව වෙලා ඉපදුන මගෙ සිඟිති දුවේ
ඔබගේ පියා දුන් ඉන්නේ හමුදවේ
පැතුමක් පතමු සතුටින් අපි බවෙන් බවේ
උතුරේ දී මා මලත් සතුටින් ඉන්න දුවේ

සුරතල් දුවේ ඔබහට සිටි ඔබගෙ පියා
අවියක් අරන් යුද වදිනවා සතුරා සොයා
නිතරම මෙමග අත රැඳුනත් අවිය අයා
දූන් දූන් මෙමට සිහි වන්නේ දුවේ ඔයා

සෙ/3045 38 ලාකෝ අරුණශාන්ත බියු
ආධාරක කණ්ඩායම 12 ශ්‍රීලපාහ
යුද හමුද කඳවුර
අල්ලරායි - චාවකච්චේරි
යාපනය

# සෙබළ සිතුවිල්ලක්


යුද අවි දරාගෙන නිතරම දෙ අතර මගින්
මව්බිම රකිනවා ද මේ වැටුනු සිතින්
දිවි පුද කලත් උතුරේ ඇති සටන් වලින්
නොහඬනු සොඳුරියේ මා මේලොව නොමැති දුකින්

සෙබලෙකු ලෙසින් මා යනවිට උතුර බලන්
මාපිය දෙපල වැලපෙයි උනු කඳුලු සලන්
එනමුදු මා යා යුතුය යුද පෙරමුණම බලන්
රට රැක ගන්න රිදී දෙනු මැන සතුටු සිතින්

සෙ/307295
සාසෙ චන්ද්‍රතිලක යූජීඑන්
8 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම - අලිමංකඩ




# "අහිමි වුව ද මේ භවයේ ඔබ..."



මලක පෙති කොතරම් සුමුදු දැයි මට කියා දුන්නේ
ඔබය...
පරවී බිම වැටුනු එමල් පෙති රැගෙන
මම ඔබේ සොහොන සරසමි
මේ මල් පෙති අතර දැනෙන්නේ මට ඔබේ සුවඳමය...
මා මේවන,
තිවී යනු වෙසක් පොතක දුක්බර දසුන් පෙන්වමින්
ප්‍රේමය ද යම් දිනෙක.. මේලෙස
වියකී තිවී යනු ඇතැයි... මද සිනා නගමින්
මා කනට කොඳුරා... ඔබ කිව් සැටි මතකය
ඔබේ රත්වන් විරුර සැඟවුන සොහොන මත
මෙද යළිත් මම පහන් ලද්වන්නෙමි...
තිවී යනු ඇත. කිසියම් දිනෙක මේ පහන් සිලුව
ද.... එහෙත්
පෙම්වත....
අන්ධකාරයේ ගමන් කරන ඔබේ ආත්මයක් පාසා...
මගේ මේ මේ සිත පහනක්ව දිලෙනු ඇත.... ඔබේ
නති නොනතියට

මරණයේ කළු පැහැති තටු යට....
ඔබේ දෙනුවන වැසුන ද සිට.. අහිමිවිය මට මගේ
ලෝකය
ඔබේ සොහොනේහි හිස තබාගෙන
ප්‍රේමයේ ශෝක ගීතය ගයන්නෙමි.... මෙතැන් සිට
අසා සිටින්න සුමිවත... මගෙ සිතුවිලි
සුළඟේ ඇදී යන... ඉතා දුක් කමක් වනු ඇත.

සෙ/13254 කෝප්‍රල් ප්‍රියන්ත එච්පී
7 ශ්‍රීලපාහ "ඩී" කණ්ඩායම
නුවර පාර කිලිනොච්චිය

# අපි සැමද සවිය වෙමු

තල් කොළ ගැටෙන හඬ සවනට වැටෙන විට
කලුව අඳුර රජයන බව දැනෙයි මට
සිහියට නගා සතුරන් ගැන විටින් විට
දිගුකර දෙනත් බලනෙමි මම විටින් විට

සඳු සැහවී සිටිතියි අද අමා වකයි
තරු දිලිසි හිනැහෙයි සිත ගිමන් නිවයි
නෙත පිබිදී තිස් පැය නෙක නිදි වරතියි
මම හා මගේ සොයුරන් හැම නිති රකිතියි

පාබල බලය පෙන්නා අපි හෙළ දෙරනේ
නංවමු සිහ ධජය තිල්වන් උඩු ගුවනේ
රුපුනත් සැම නසා මේ සිංහල දෙරනෙව්
සවුදිය පුරමු ජය ටැඹ දැක හෙට දෙදිනේ

සෙ/302447 කෝප්‍රල් වීරසිංහ එස්
10 ශ්‍රීලපාබ 512 බසේමු - යාපනය

# කළු පාලම

අසරණ ජනතාවක් තනිවෙලා අද
බඩවියත රැක ගැනීමට වෙර දරනු මිස
නමුත් අද මොවුන් අසරණ වී ඇත
බල ලෝබය නිසා නොවේදෝ
කළුපාලමෙන් එහා වෙනත් ලොවක් ඇත
කවදද එහි නැවුම් සුවඳක් දෙනෙන්නේ
දේශය රකින සැම සෙබලුන් දිවා රැයේ
කළු පාලම නිරතුරුවම රකියි
මව් භාෂාව මිස වෙනත් බසක් නොදන්නා අප
කෙසේ අමතන්න ද අසරණ ජනතාව
කළුපාලම පසුකරගෙන යන එන සෝක බරිත
මුහුණු වලට
අගේ මද සිනහව රටක් වටතිවාලූ
අප නුඹ දුක් වදින්නේ මේ රට වෙනුවෙන් ය
එසේනම් රට වෙන් කරනු ද
කළු පාලම ඔබත් හැර අප නොයනු ඇත
එය අප සෙබලූ විශ්වාසයි
ජාතියට පණදෙන ඔබලා
වර්ගබේදයෙන් තොරව නිරතුරුවම රකිමි
මෙයයි ලොකු පොඩි අප සැමගේ පරමාර්ථය
අපි මියයන තුරු අප ඔබ සමගයි

සෙ/22213 ආසෙ හම්මිට ඒඑම්එම්කේ
ඒ කන්ඩායම - 2 ශ්‍රීලපාහ
කළුපාලම කඳවුර
චෙන්කල්අඩි - මඩකලපු

# යුධ බිමේ පුතුගෙන්

පුතේ කියා කතා කරන හඬ ඇසෙනවා අම්මේ
ඔබේ සෙනෙහස දැක ගන්නට ආසයි මම අම්මේ
මා ගැන කිසි විට දුක් නොවන්න අම්මේ
තිස්තුන් කෝටියක් දෙවි රැකවරණය අම්මේ

අම්මා පෙව් ලේ කිරිවල බලය අරන්
මව් බිම රකිනවා අවියක් අතට අරන්
සිටියත් යුධ බිමේ මම අවි අතට දරන්
එනතුරු හිනැහෙන්න ඔබ වෙතට ඉතින්

සෙ/306132 ලාකෝ රතනසාර ඩබ්ඒ
යුධ හමුද කඳවුර, 11 ශ්‍රීලපාහ - බී කණ්ඩායම
අරියාලය - යාපනය

# දිරිය ඔබයි අම්මේ

පාලුවේ කුරිරු යුධ පිටියේ අප තනිවම ඉන්නේ
මව්පිය නෑ සිය මිතුරන් නිතරම සිහි වෙන්නේ
අපගේ කෙලිලොල්මස මෙලෙසින් ලත වෙන්නේ
සාමයේ ඉරණම කොතන ද අප නැහැ දන්නේ

නිවාඩු ලද විගස කවදද මම ගෙදරට යන්නේ
ඉදිකඩ ලහට වී අම්මා මග බලමින් ඉන්නේ
මව්නි ඔබ සිහිකරමින් මම තව එඩිතර වෙන්නේ
ජයසිකුරුයි අපට කිසිද නැහැ වරදින්නේ

දුක්වී තිබෙන සිත් සනසා ලනු රිසිය
සාමයේ පරවියන් ඉගිලෙන දින ලහය
එක්සේසත් කරලා රට ජාතිය සමය
ලහදීම එන්නම් අම්මේ ඔසවත් සිංහල කොඩිය

සෙ/309174 සාසෙ වික්‍රමසිංහ ඩබ්ඒපී
15 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම
පලෙයි - යාපනය

# සිහල බිම ජය ගන්න

තුරුණු වියේ මල් ගොමුවේ
යෞවනයේ ප්‍රාර්ථනා
හදවතෙහි රුවා ගත් සොයුරණි
නුඹලාගේ සිත ශක්තිමත්ය
මම දනිමි....
ගම මෙන්ම එඩිතරවය සිතුවිලි
එනමුදු
නුඹලාගේ මුකුලිත සිනහව
කෙලි කවටම් අද කොයි ද?
කියන් සොයුරණි
නුඹලා එය ගිනි අවියටම බාර දුන්නා ද?
නුඹලාට මතක ද එද...
එකම පියෙකුගේ උණුහුම ලබමින්,
දයාබර මෑණියන්ගේ ඇකයෙහි තැලවෙමින්
සුරතල් වූ ඒ අතීතය
ඒත්.
අද ඔබට එක්කර දී ඇත්තේ කඳුළු
මතකයක් පමනි
රුදුරු බල බිඳ - සිහල බිම ජය ගන්න
යෞවනයේ මල් සුවඳ දසත විහිදුවන්න
උදවන හෙට දිනයේ
නිවහල්ව වෙසෙන්නට

කේ.ජ්. නිරෝෂා රණසිංහ.
කා/මි, ජනපදය, ලැගුම්දෙනිය
සෙන්විලතැන්න

# බලඇණි දින 07 වන සමරුව - 6 ශ්‍රීලපාහ

ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් පාන ශ්‍රීලපාහ රෙජිමේන්තුවට දව 90/06/08 දින උපත ලද 6 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව 97/06/08 දින 07 වන වියට පා තබන විට සමස්ථ යුධ හමුදව දෙස බැලීමේ දී එහි ලාබාලයෙකු වුව ද, මෙම කෙටි කාලය තුල දී ශ්‍රී ලංකා යුධ හමුදව වෙනුවෙන් ලක් මාතාව ආරක්‍ෂා කර ගැනීම තකා කර ඇති සේවය ඉමහත්ය.

වර්ගවාදී අර්බුද ඉතාමත් උත්සන්න අවධියක ස්ථාපිත කරන ලද මෙම ඒකකය එද මෙද තුල ශ්‍රී ලංකා යුධ හමුදව මගින් ක්‍රියාත්මක කළ පහත සඳහන් ප්‍රධාන සහ සීමිත මෙහෙයුම් වලට සහභාගි වෙමින් දේශයේ පරමාධිපත්‍ය සුරකීමට වී ඇති දයකත්වය මොනවට පැහැදිලි වේ.

1. වෙල්ලාවලි /. මන්ඩූර් මෙහෙයුම
2. තොප්පිගල මෙහෙයුම
3. බලවේගය 1 මෙහෙයුම
4. වන්නි වික්‍රම II මෙහෙයුම
5. හයේ පහර මෙහෙයුම
6. කළු නරියා මෙහෙයුම
7. සැඩ පහර මෙහෙයුම
8. කින්ග් පිෂර් මෙහෙයුම
9. යාල්දේවි මෙහෙයුම
10. ජයහඬ මෙහෙයුම
11. 'කිකි ඔිෆ්' මෙහෙයුම
12. වේක් අප් මෙහෙයුම
13. සේෆ් පැසේජ් මෙහෙයුම
14. විදුලි පහර 1 මෙහෙයුම
15. ඉදිරි පිම්ම මෙහෙයුම
16. හාර්ඩ් ක්නොක් මෙහෙයුම
17. විදුලි පහර II මෙහෙයුම
18. ෂේක් හැන්ඩ් I මෙහෙයුම
19. ඩ්‍රැගන් ෆයර් මෙයුම
20. බැරල් වෝමර් මෙහෙයුම
21. ෂේක් හැන්ඩ් II මෙහෙයුම
22. අකුණු පහර මෙහෙයුම
23. රිවිරැස I මෙහෙයුම
24. ෂේක් හැන්ඩ් IV මෙහෙයුම
25. රිවිරැස II මෙහෙයුම
26. රිවිරැස III මෙහෙයුම
27. ත්‍රිවිධ පහර මෙහෙයුම
28. ජය සිකුරු මෙහෙයුම

07 වන සංවත්සරය උද වන විට ඒකකය 'ජයසිකුරු' මෙහෙයුමට සහභාගී වෙමින් සිටි බැවින් මෙවර සංවත්සරය යුධ පිටියේ දීම සැමරීමට සිදුවිය. 'ජයසිකුරු' මෙහෙයුමේ යෙදී සිටිය දී ත්‍රස්ථවාදී ප්‍රහාරයන්ට ලක්ව අණදෙන නිළධාරී ලුතිං/කර්නල් ඩීයූ ද ලැනරෝල්, ආර්ඩබ්පී, ආර්එස්පී ඇතුළු නිලධාරීන් 04 දෙනකු හා සෙසු නිළයින් 79 දෙනෙකු තුවාල ලබා සිටි බැවින් ද, නිලධාරීන් 01 හා සෙසු නිළයින් 04 දෙනකු දේශය වෙනුවෙන් දිවි පුදකර, ඉක්ම ගොස් තිබුනේ දින කිහිපයක් බැවින්ද. සංවත්සරය චාම් අයුරින් සැමරිය යුතු බව වත්මන් අණදෙන නිලධාරී මේජර් එල්එම් මුදලිගේ ශ්‍රීලපාහ ගේ තීරණය විය.

මේ අනුව ආගමික වතාවත් වලට මුල් තැන දෙමින් ඒකකය වෙත සෙත්පතා අනුරාධපුරය ජය ශ්‍රී මහා බෝධිරාජයානන් වහන්සේ අභියස බෝධිපූජාවක් පවත්වා එමගින් ඒකකය සමග රාජකාරි කර මියගිය රණවිරුවන්ට පිං අනුමෝදන් කරවා නිවන් සුව ප්‍රාර්ථනා කර, තුවාල ලබා රෝහල්ගතව ප්‍රතිකාර ලබන අයවළුන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමට ද අවස්ථාව කර ගතී. ඉන් අනතුරුව 97/06/08 වන දින නිලධාරී නිවස්නයේ දී චාම් සාදයක් පැවැත්වූ අතර, මේ සඳහා රෙජිමේන්තු අධිපති හා ඒකාබද්ධ මෙහෙයුම් ආඥපති මේජර් ජෙනරාල් ඒකේ ජයවර්ධන, ආර්ඩබ්පී, ආර්එස්පී, ආර්සීඩීඑස්, පීඑස්සී, 55 සේනාංකාධිපති බ්‍රිගේඩියර් එච්එස් කෝට්ටේගොඩ, ආර්ඩබ්පී, ආර්එස්පී හා ජය සිකුරු මෙහෙයුමේ 55 සේනාංකය යටතේ වූ සියළුම බලසේනාවන්හි බලසේනාධිපතීන් මෙන්ම ඒ යටතේ වූ සියළුම ඒකක වල අණදෙන නිලධාරීන් ද එක්විය. එසේම 97/06/10 වන දින 552 බලසේනාවේ හා ඒ යටතේ වූ සියළුම ජ්‍යෙෂ්ඨ කොනොනිත් සහභාගීත්වයෙන් යුතුව බනිසැර නිවස්නයේ සාදයක් ද, 97/06/16 වනදින සියළුම නිළයින් උදෙසා වූ දිවා භෝජන සංග්‍රහයක් ද පැවැත්වූ අතර, 97/06/17 වන දින 552 බසේමු හා ඒ යටතේ වූ ඒකක වල කොනොනින්ගේ සහභාගිත්වයෙන් යුතුව කෝප්‍රල් සමාජ ශාලාවේ ඉතාමත් චාම් අයුරින් පැවැත්වූ සාදයක් ද විය.

6 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදවට සත්වන විය වනවිට ක්ෂේත්‍රයේ මහත් විස්කම් පා කීර්ති නාමය පතුරුවමින් ශ්‍රේෂ්ඨත්වයට පත්ව සිටීම, එහි සේවය කිරීමට භාග්‍යලත් අප සැමට අභිමානවත් කරුණකි. සත් වසක දිවි මගෙහි සාර්ථකත්වයට හේතු පාදක වූයේ එද මෙද තුර ඒකකයේ නියමුවන් වූ ඒකක අණදෙන නිලධාරීන්ගේ මග පෙන්වීම යටතේ සියළුම නිළයින්ගේ දැඩි කැපවීම, නොපසු බස්නා උත්සාහය හා චිත්ත ධෛර්යය බව අවිවාදයෙන් සඳහන් කළ යුතු ය. දේශයේ ස්වෛරී භාවය පතා දිවි පරදුවට තබා ක්‍රියා කරමින් පොදුවේ යුධ හමුදවට හා රෙජිමේන්තුවට කීර්ති නාමය දිනා දීමට දයක වූවන්ගෙන් 6 ශ්‍රීලපාහ නාමයට ප්‍රමුඛ ස්ථානයක් හිමිව තිබීම ක්ෂේත්‍රයේ නිරතවන කවුරුත් පිළිගන්නා සත්‍යයකි.

ඒකකයේ ආරම්භක නියමුවන්ගෙන් පන්නරය ලත් වත්මන් අණදෙන නිලධාරී සිටි ජ්‍යෙෂ්ඨ / කණිෂ්ඨ නිළධාරීන් හා සෙසු නිළයින් නිබඳ දරණ වෑයමේ විශිෂ්ඨ ප්‍රතිපළ අද අප අත් විඳිමු. 'සේවය කරමි' ශීර්ෂ පාඨය මත පිහිටා අනාදිමත් කාලයක පටන් ර. කගත් 'ලක් මාතාවගේ' ඒකීය භාවය මතු පරපුරටත් උරුමකර දීමේ පරම පවිත්‍ර චේතනාව සාක්ෂාත් කර ගැනීමට 6 ශ්‍රීලපාහ දයකත්වය නොමඳව ලබාදී ජය කෙහෙළි නැංවීමට අදිටන් කරගනිමු.

'6 ශ්‍රීලපාහ' නාමය සද දිනේවා!

**සෙ/13394**
**සැරයන් ප්‍රීතිකුමාර කේඑආර්**
**බුද්ධි අංශය - 6 ශ්‍රීලපාහ**

# ජයසිකුරු ප්‍රතිප්‍රහාරය - 10 ශ්‍රීලපාහ

එල්ටීටීඊ ත්‍රස්ථවාදීන්ගේ තෝතැන්නක් බඳු වව්නියාවේ සිට කිලිනොච්චිය දක්වා වූ ප්‍රදේශය අත්පත්කර ගැනීමේ අරමුණින් සහ උතුරු ප්‍රදේශයට ආහාර සහ අනිකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය රැගෙන යාම සඳහා සැපයුම් මාර්ගයක් ස්ථාපිත කිරීමේ අරමුණින් ආරම්භකරන ලද 'ජයසිකුරු' ක්‍රියාන්විතය ඉතා සාර්ථකව ඉදිරියට යමින් එල්ටීටීඊ ත්‍රස්ථවාදීන් වෙත දැවැන්ත පරාජයක් අත්කරදී ඇති බව ඔබ අප සැම දන්නා කරුණකි.

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ නිත්‍ය බලඇණි 07 ක් මෙම ක්‍රියාන්විතය සඳහා එක්වී තිබීමත් සේනාංක 02 ක් යටතේ ඉදිරියට ඇදෙන මෙම ක්‍රියාන්විතයේ 55 සේනාංකය අප රෙජිමේන්තුවේ නිලධාරියෙකු වන බ්‍රිගේඩියර් එච්එස්එච් කෝට්ටේගෙඩ, ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලපාහ විසින් මෙහෙයවීමත් සහ මෙම දැවැන්ත ක්‍රියාන්විතයට නායකත්වය දෙමින් අප රෙජිමේන්තුවේ නිලධාරියෙකු වන සහ රෙජිමේන්තු අධිපති වන මේජර් ජෙනරාල් ඒකේ ජයවර්ධන, ආර්ඩබ්පී, ආර්එස්පී, ආර්සීඩීඑස්, පීඑස්සී, ශ්‍රී ලංකා යුද හමුදාවේ ඒකාබද්ධ මෙහෙයුම් ආඥාපති වශයෙන් ක්‍රියා කිරීමත් අපට ඉතා ආඩම්බර විය හැකි කරුණක් වී ඇත.

'ජය සිකුරුයි' ක්‍රියාන්විතය සේනාංක 02 ක් වශයෙන් ආරම්භ වී එක් සේනාංකයක් එනම් 53 සේනාංකය වැලිඔය සිට නැදුන්කේනි හරහා පුලියම්කුලම දක්වා ද 55 සේනාංකය වව්නියාව සිට ඕමන්තය හරහා පුලියම්කුලම දක්වා ද ක්‍රියාන්විතය ආරම්භ කරන ලදී. 1997.06.10 දින වන විට 55 සේනාංකය යටතේ ඉදිරියට පැමිණි භට පිරිස් ඉතා සාර්ථකව සතුරු ආරක්ෂක වළලු බිඳ දමමින් වව්නියාවේ සිට කිලෝ මීටර් 15 ක් පමණ උතුරු දෙසින් පිහිටි ඉතා දැවැන්ත එල්ටීටීඊ බළකොටුවක් වූ 'පෙරියමඩු' ප්‍රදේශය අත්පත්කර ගන්නා ලදී.

55 සේනාංකය යටතේ, 551,552 සහ 553 වශයෙන් බලසේනා තුනක් ඇති අතර. එම බලසේනා තුනට ශ්‍රී ලංකා පාබල හමුද බලඇණි තුනක් එනම්, 4 වන බලඇණිය. 6 වන බලඇණිය සහ 10 වන බලඇණිය අයත්ව ඇත. මෙම සැම බලඇණියක්ම ඉතා සාර්ථකව තමන් අයත් බලසේනාව යටතේ රාජකාරී කරමින් දැවැන්ත සතුරු ප්‍රහාරයන් මධ්‍යයේ ජීවිත පරිත්‍යාගයෙන් යුතුව 55 සේනාංකය අරමණු කරා ගෙන යාමට මහත් කැපවීමකින් අනෙකුත් බලඇණි සමග ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් එල්ටීටීඊ ත්‍රස්තවාදීන් හට බරපතල හානි සිදු කිරීමටත් විශාල එල්ටීටීඊ සාමාජිකයින් ප්‍රමාණයක් විනාශ කර දැමීමටත් වසර ගණනාවක සිට එල්ටීටීඊ සංවිධානයේ බලලකාවු බවට පත්ව තිබූ 'ඕමන්තේ' 'පෙරියමඩු' ප්‍රදේශය අත්පත්කර ගැනීමටත් හැකිවුණි.

දිනපතා ලැබුණු බුද්ධි තොරතුරු වලින් එල්ටීටීඊ සංවිධානය යුධ හමුදාවට මුහුණ දීමට අපහසු තාවයකට පත්ව ඇති බැවින් ඔවුන්ගේ සාමාජිකයින් විශාල පිරිසක් මියගොස් සහ තුවාල සිදුවී ඇති බැවිනුත් ඉදිරියට පැමිණෙන භට පිරිස් වලට මුහුණ නොදී වෙනත් ආකාරයකින් ආරක්ෂක හමුදාවන් වෙත ප්‍රහාර එල්ල කිරීමට උත්සාහ කරන බව දැන ගන්නට ලැබුණි.

1997.06.10 දින වන විට අප බලඇණිය 'පෙරියමඩු' ඉදිරි ආරක්ෂක වලල්ලේ රාජකාරීන්හි නියැලෙමින් සිටි අතර, එදින අලුයම් කාලයේ ත්‍රස්ථවාදීන් විසින් බලඇණි ආරක්ෂක කලාපයට ප්‍රහාරයක් එල්ල කළ අතර, එයට ප්‍රතිප්‍රහාර එල්ල කරමින් සිටින විට දැවැන්ත සතුරු ප්‍රහාරයක් 'නොච්චිමොඩෙයි' ප්‍රදේශයත් දකුණු දිසාවට එනම් 'නොච්චිමොඩෙයි' 'පුදුකුලම්' සහ 'තාන්ඩිකුලම්' ද ප්‍රදේශයට එල්ල වෙමින් පවතින බව දැන ගන්නට ලැබුණි.

මෙම ප්‍රදේශය අපට ඉතා වැදගත් ප්‍රදේශයක් වූ අතර, එයට ප්‍රධාන හේතුව වූයේ 55 සේනාංක මූලස්ථානය 130 මිමි කාලතුවක්කු අනුකණ්ඩය, 22 මිමි කාලතුවක්කු අණුකණ්ඩය සහ නොච්චිමොඩෙයි පාලම එම ප්‍රදේශයේ පිහිටා තිබීමයි.


ගුවන්විදුලි පණිවුඩ හුවමාරු යන්ත්‍රයන්ට ඇහුම්කන් දීමේ දී 55 සේනාංක මූලස්ථානය පිහිටා තිබූ ස්ථානට ත්‍රස්තවාදීන්ගේ දැවැන්ත ප්‍රහාරයක් එල්ලවන බව දැනගත් අතර, ත්‍රස්ථවාදීන් දහසකට වැඩි ප්‍රමාණයක් බටහිර ආරක්ෂක වලල්ලට පහැරදී 55 සේනාංක මූලස්ථානය වෙත දැවැන්ත ප්‍රහාරක් එල්ල කරමින් එය අත්පත් කර ගැනීමටත්, ඒ අසල ස්ථානගත කර තිබූ 130 මිමි කාලතුවක්කු අණුකණ්ඩය අත්පත්කර ගැනීමටත් උත්සාහ කරන බව දැනගත් අතර, ඒ වන විට ප්‍රධාන සැපයුම් මාර්ගයත් 'නොච්චිමොඩෙයි' පාලමත් ත්‍රස්ථවාදීන් විසින් අත්පත්කර පුපුරවා හැර ඇති බවත්, එයට දකුනු දිසාවෙන් පිහිටි 25 මිමි කාලතුවක්කු අණුකණ්ඩය ද අත්පත්කර ගැනීමට උත්සාහ කරන බව දැනගන්නට ලැබුනි.

මේ වන විට 10 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ඉහත ප්‍රහාරය සිදුවන ස්ථානයට කිලෝ මීටර් 15 පමණ උතුරින් ස්ථානගත කර තිබුණි.

553 බලසේනාව යටතේ රාජකාරීන් කරමින් සිටි අප බලඇණියේ අණදෙන නිලධාරි මේජර් ඩීජ් අමුණුගම, ආර්එස්පී, ශ්‍රීලපාහ හට 553 බළසේනාධිපති විසින් පණිවුඩ හුවමාරු යන්ත්‍රය මගින් ඉහත ප්‍රහාරය පිළිබඳව දන්වා එය මැඩපැවැත්වීම සඳහා බලඇණිය ක්ෂණිකව සූදානම්කර ගන්නා ලෙස දුන් උපදෙස් මත අප බළඇණිය 1997.06.10 දින අලුයම ආරක්ෂක වලල්ලෙන් මිදී 55 සේනාංකයට සහ ඒ අවට ප්‍රදේශයට එල්ල වන සතුරු ප්‍රහාරය මැඩපැවැත්වීමටත් දැනටමත් සතුරන් විසින් අත්පත්කරගෙන ඇති බල ප්‍රදේශය නැවත අත්පත්කර ගැනීමටත් පිටත්විය.



ජයසිකුරුයි ප්‍රතිප්‍රහාරය ත්‍රස්තවාදීන්ගෙන් අත්පත් කරගත් අවිආයුධ සමග 10 ශ්‍රීලපාහ




(ඉහතින් දක්වා ඇති දළ රූප සටහන 1:50 000 අග්බෝපුර ක්‍රියාන්විත සිතියමට අනුව බැව් සලකන්න)

ආරක්ෂක වළල්ලේ ස්ථාන කීපයකටම සතුරු ප්‍රහාරයන් එල්ලවී ඇති බැවින් ගමන් ගන්නා මාර්ගය ද එතරම් ආරක්ෂා සහිත නොවූ අතර, ආරක්ෂක වලල්ලට නැගෙනහිර දිශාවෙන් 'නොච්චිමොඩෙයි' පිහිටා තිබූ නාවුක හමුද ආරක්ෂක වලල්ල වෙතට පමණක් කෙසේ හෝ අප බළඇණියට ගමන් ගැනීමට හැකිවිය. එම ස්ථානයට යන විට 'නොච්චිමොඩෙයි' පාලමේ සිට මීටර් 3000 ක් පමන උතුරු දිශාවට ද එනම් නාවික අණුකණ්ඩය ආසන්නටයම වාගේ ත්‍රස්ථවාදීන් විසින් අත්පත්කර ගෙන තිබුනි. 'නොච්චිමොඩෙයි' පාලමේ සිට දකුණු දිසාවට 55 සේනාංකය දක්වා ප්‍රදේශය සම්පූර්ණයෙන් ත්‍රස්ථවාදී ප්‍රහාරයකට ලක්ව තිබුණි.

නාවික හමුද අණුකණ්ඩයේ සිට ප්‍රධාන සැපයුම් මාර්ගය සහ දුම්රිය මාර්ගය ඔස්සේ 'නොච්චිමොඩෙයි' පාලම දක්වා ගමන් ගැනීමට උත්සාහ කළ විශේෂ බළකායට ද, සන්නද්ධ රථ වලට ද අනෙක් හටපිරිස් වලට ද ත්‍රස්ථවාදීන් විසින් දරුණු ප්‍රහාරයක් එල්ලකර තිබූ බැවින් එම මාර්ගයන් දෙක ඔස්සේ ගමන් කිරීම කළ නොහැකි බව තීරණය කළෙමු.

ඉහත තත්ත්වය මත දකුණු දිශාවට ගමන් කිරීමට සුදුසුම මාර්ගය ලෙස නැගෙනහිර ආරක්ෂක වලල්ලෙන් තව දුරටත් නැගෙනහිරට ගොස් 'නොච්චිමොඩෙයි' පාලමට නැගෙනහිර ප්‍රදේශයෙන් අගු ගංගාව තරණය කිරීම බව තීරණය කර ඒ මාර්ගය ඔස්සේ අප බලඇණිය දකුණට ගමන් කිරීම ආරම්භ කළෙමු.

මේ වන විට ත්‍රස්ථවාදීන්ගේ ප්‍රහාරයන් දිගින් දිගටම දැඩි වෙමින් පැවතුන අතර, ගුවන් විදුලි පනිවුඩ හුවමාරු යන්ත්‍ර මගින් 55 සේනාංකය වෙතට මේ වනවිට අතිරේක හට පිරිස් ඉතා අසන්නට පමණ ඇති බවත්, එබැවින් 55 සේනාංකය වෙත එල්ල වෙමින් තිබූ ත්‍රස්ථවාදී ප්‍රහාරය අඩු වෙමින් පවතින බවත්, දන ගන්නට ලැබුණි.

55 සේනාංකය වෙත එල්ල වෙමින් තිබූ සතුරු ප්‍රහාරය අඩු වෙමින් පැවතුන ද 'නොච්චිමොඩෙයි' ප්‍රදේශයේ තිබූ 25 මිමි කාලතුවක්කු අනුකණ්ඩය වෙත එල්ල වනප්‍රහාරය වැඩිවෙමින් පවතින බව දනගන්නට ලැබුණු බැවින් බළඇණියේ අණදෙන නිලධාරීන් විසින් කාලතුවක්කු අණුකණ්ඩය අත්පත්කර ගැනීමට තීරණය කරන ලදී. කාලතුවක්කු අණුකණ්ඩය අත්පත්කර ගැනීමට නම් 'නොච්චිමොඩෙයි' පාලම ද අත්පත්කර ගැනීම අනිවාර්යයෙන් කළ යුතු බව තීරණය කළ අතර, මේ වන විට කාලතුවක්කු අණුකණ්ඩයට ආසන්නයෙන්ම පිහිටි ඉංජිනේරු අණුකණ්ඩය ත්‍රස්ථවාදීන් විසින් අත්පත් කර ගෙන තිබුණි.

කාලතුවක්කු අණුකණ්ඩය සමග ඉදුරා ම පනිවුඩ සම්බන්ධතා නොතිබීම ගැටලුවක් වූ අතර, බලඇණිය සමග සිටි කාලතුවක්කු ඉදිරි නිරීක්ෂණ නිලධාරීන්ගේ මාර්ගයෙන් අපගේ ප්‍රතිප්‍රහාරය පිළිබඳව කාලතුවක්කු අණුකණ්ඩය වෙත දනුම දුන්නෙමු.

'නොච්චිමොඩෙයි' පාලමට උතුරින් සිටි හටපිරිස් වලට පාලම දෙසට ප්‍රහාරයක් එල්ල කරන ලෙස උදෙන් දී කාලතුවක්කු වෙඩි බලය සහ 81 මිමි මෝටාර් වෙඩි බලය සම්බන්ධීකරණය කර මුලු බළඇණියම ප්‍රහාර පෙලක් ලෙස යොදවා කිලෝමීටරයක් පමණ ප්‍රදේශය එනම් 'නොච්චිමොඩෙයි' පාලමේ සිට කාලතුවක්කු අණුකණ්ඩය දක්වා ප්‍රදේශයට ප්‍රධාන මාර්ගයට නැගෙනහිර දිශාවේ සිට ප්‍රහාරයක් ආරම්භ කළෙමු.

ප්‍රධාන මාර්ගයේ සිට මීටර් 800 ක් පමන නැගෙනහිරට වන්නට ස්ථානගත වී ආරම්භකළ මෙම ප්‍රහාරය ප්‍රධාන මාර්ගය දෙසට මීටර් 200 පමණ ලංවන විට ඉතා විශාල ත්‍රස්ථවාදීන් ප්‍රමාණයක් පළමු පෙළ වශයෙන් ප්‍රධාන මාර්ගයේ ද, දෙවන පෙලක් වශයෙන් දුම්රිය මාර්ගයේ ද, තුන්වන පෙලක් වශයෙන් දුම්රිය මාර්ගයට පසු පසින් ඔවුන් විසින් අත්පත්කරගෙන තිබූ ආරක්ෂිත බංකර් වල සිට දවැන්ත ප්‍රහාරයක් අප වෙත එල්ල කිරීම ආරම්භ කරන ලදී. එපමණක් නොව 'නොච්චිමොඩෙයි' පාලමේ සිට ද කාලතුවක්කු අණු කණ්ඩයට පසු පස සිට සහ පාලමට උතුරින් ද ප්‍රබල අවි වලින් මෙම ප්‍රහාරය අප වෙත එල්ල වුනි. සුලු අවි පමණක් නොව ත්‍රස්ථවාදීන්ගේ කාලතුවක්කු වෙඩි උණ්ඩ ද අප බලඇණිය වෙත එල්ල වුණි.

මෙවැනි දවැන්ත සතුරු ප්‍රහාරයක් මධ්‍යයේ නොනවත්වාම ප්‍රතිප්‍රහාර එල්ල කරමින් අප බලඇණියේ හට පිරිස් ඉදිරියට ගමන්ගත් අතර, මාර්ගයට මීටර් 50 ක් පමණ ආසන්නයට එන විට බලඇණියේ සෙබලුන් 100 ක් පමණ තුවාල / මියගිය සිටිය ද ඔවුන් මතින්ම ගොස් ප්‍රධාන මාර්ගය පාලම සහ කාලතුවක්කු අණුකණ්ඩය අත්කර ගැනීමට තීරණය කරන ලදී.

මහා මාර්ගයේ සිට සතුරන් මියයන / තුවාල වන විට ඔවුන්ට පසුපසින් දුම්රිය මාර්ගයේ සිටන සතුරන් ප්‍රධාන මාර්ගයට පැමිණෙන විට බංකර් පේළියේ සිටි සතුරන් දුම්රිය මාර්ගයට පැමිනීම දක්නට ලැබුණි. තවත් පිරිසක් තුවාල / මියගිය ත්‍රස්තවාදීන් රැගෙන ට්‍රැක්ටර් මගින් පසුපසට ගමන් කළ අතර, කාලතුවක්කු අණුකණ්ඩය වටකරගෙන සිටි ත්‍රස්ථවාදීන්ට එය අතහැර ප්‍රධාන මාර්ගයේ සිටි ත්‍රස්ථවාදීන්ගේ සහයට පැමිණෙන අයුරු දක්නට ලැබුණි.

අප බලඇණියේ හට පිරිස් ඉතා දක්ෂ ලෙස සටන් කරමින් ප්‍රධාන මාර්ගයට පැමිණෙන විට ප්‍රධාන මාර්ගයේ සිටි සතුරන් දුම්රිය මාර්ගයෙන් පසුපසට පසුබා යනු දක්නට ලැබුණි. ප්‍රධාන මාර්ගයේ සවිකර තිබූ විදුලි රැහැන් මාර්ගයට කඩාවැටී එයින් කාන්දුවන විදුලියෙන් ප්‍රහාරක පෙලේ සෙබලුන් කිහිප දෙනෙකු පිලිස්සී මියගිය අතර, එමගින් විශාල ප්‍රදේශයක ගින්නක් ඇතිවුණි.

ප්‍රධාන මාර්ගයට පැමිණි සැනින් දකුණු දිසාවට කාලතුවක්කු අණුකණ්ඩය වෙත එක් කණ්ඩායමක් යොදවා ප්‍රහාර ආරම්භ කරන විට 55 සේනාංකය වෙතින් කාලතුවක්කු අණුකණ්ඩයේ සිටි හට පිරිස් ත්‍රස්ථවාදීන් වෙත ප්‍රහාර එල්ල කරනවිට කාලතුවක්කු අණුකණ්ඩය අතහැර දමා පසුබා ගොස් ඇති බව දන්වා සිටින ලදී. ත්‍රස්ථවාදීන් විසින් කාලතුවක්කු අණුකණ්ඩය වටකර තිබුණ ද අපගේ ප්‍රහාර හමුවේ ඔවුනට එහි ඇතුලුවීමට නොහැකිවූ අතර, එහි තිබූ සියලුම අවි ආයුධ එලෙසින්ම තිබූ අතර, ඒවාට කිසිදු හානියක් කිරීමට ඔවුන්ට නොහැකිවී තිබුණි.

මේ වන විට අප බලඇණියේ නිළධාරීන් 01 ක් සහ සෙබලුන් 37 දෙනකු ප්‍රහාරක පෙලේ මියගොස් වැටී සිටි අතර, නිලධාරීන් 04 ක් සහ සෙබලුන් 63 දෙනෙකු තුවාල වී වැටී සිටින ලදී. මොවුන් කිසිවෙකු සම්පූර්නයෙන්ම 'නොච්චිමොඩෙයි' පාලම / ප්‍රධාන මාර්ගය සහ කාලතුවක්කු අණුකණ්ඩය නැවත අත්පත් කර ගන්නා තුරු ආරක්ෂිත ස්ථානයකට ගැනීමට නොහැකි විය. කෙසේ

වුව ද අපගේ දැවැන්ත ප්‍රහාරය හමුවේ මේ වන විට ත්‍රස්ථවාදීන් පසුබාගොස් සිටි අතර, ඔවුන්ගේ කාලතුවක්කු සහ 81 මිමි බෝම්බ ප්‍රහාරයන් පමනක් වරින් වර අප වෙත එල්ල වෙමින් පැවතුණි.

මෙම දැවැන්ත ප්‍රහාරය 1997.06.10 දින සවස 1800 පැය පමණ වන තෙක්ම පැවැති අතර, ප්‍රදේශයේ බලය තහවුරු කර ගැනීමෙන් පසුව මියගිය සෙබලුන් සහ තුවාල කරුවන් නාවික අනුකණ්ඩය වෙත රැගෙන යාම ආරම්භ කලෙමු. ඒ සඳහා පැය තුනක පමණක් මිඩංගු කිරීමට සිදුවූ අතර, පැය ගණනාවක සිට වතුර පොදක් හෝ තොලබා සටන් කල බලඇණියේ සෙබලුන් එකා මෙන් එක්වී තුවාල කරුවන් හැකි ඉක්මනින් වෛද්‍යාධාර ලබාදීම සඳහා රැගෙනයාම දක්නට ලැබුණි.

එදින රාත්‍රි අප විසින් නැවත අත්පත් කරගත් ප්‍රදේශයේ සම්පූර්ණ ආරක්ෂක වලල්ල පරීක්ෂාකර එහි බලය තහවුරු කර ගත් අතර, ත්‍රස්ථවාදීන්ගේ මල සිරුරු විශාල ප්‍රමාණයක්ද අවි ආයුධ පුපුරණ ද්‍රව්‍ය ඇතුලු භාණ්ඩ රාශියක් සොයා ගැනීමට හැකිවිය. ප්‍රධාන සැපයුම් මාර්ගයේ පිහිටි 'තොව්විමොඩෙයි' පාලම ත්‍රස්ථවාදීන් විසින් පුපුරුවා හැර තිබුණි. එයට පිටුපස ප්‍රදේශයේ ඔවුන්ගේ තුවාල කරුවන් විශාල ප්‍රමාණයකට ප්‍රථමාධාරදී තිබූ අතර, මෙම ප්‍රහාරයේ දී සියයකට අධික ත්‍රස්ථවාදීන් පිරිසක් අනිවාර්යයෙන්ම මියයන්ටත් දෙසීයකට අධික ප්‍රමාණයක් මිය යන්නට හෝ බරපතල තුවාලවීම් වලට ලක්වන්නට ඇති බවත්, කීමට පිළිවන.

ශ්‍රී ලංකා යුධ හමුද ඉතිහාසය දෙස ආපසු හැරී බලන විට දැවැන්ත සතුරු ප්‍රහාරයන් හට පිරිස් වෙත නොයක් අවස්ථාවල එල්ල වී තිබුණ ද ක්‍රියාන්විතයක යෙදී සිටි සේනාංකයක මූලස්ථානයට දැවැන්ත ප්‍රහාරයක් එල්ල වූ ප්‍රථම අවස්ථාව මෙය ලෙස හැඳින්විය හැකි අතර, එය මැඩ පැවැත්වීම සඳහා අප බලඇණියට සහභාගීවීමට හැකිවීම සහ විශාල ත්‍රස්ථවාදීන් පිරිසක් විනාශකර සතුරන් විසින් අත්කරගෙන තිබූ කාලතුවක්කු අණුකණ්ඩයක් ඇතලු වැදගත් ප්‍රදේශයක් නැවත අත්පත් කර ගැනීමට හැකිවීම ගැන අපට ඉතා අවංකව ආඩම්බර විය හැකි අතරම මෙම ප්‍රහාරයේ දී මියගිය නිළධාරී 01 ක සහ සෙබලුන් 37 කට ද තුවාල ලැබූ නිලධාරීන් 04 ක් සහ සෙබලුන් 63 ටද, අවංකව රට දැය වෙනුවෙන් සේවය කිරීම පිළිබඳව ආඩම්බරවිය හැක.

එමණක් නොව මෙහි දී අප බළඇණිය දැක්වූ දක්ෂතාවය සහ කැපවීම පිළිබඳව පසු දිනම එම ස්ථානයට පැමිණි ආරක්ෂක නියෝජ්‍ය ඇමති ජෙනරාල් අනුරුද්ධරත්වත්තේ, යුධ හමුදපති, නාවික හමුදපති, ගුවන් හමුදපති, පොලිස්පති සහ ඒකාබද්ධ මෙහෙයුම් ආඥති ඇතුලු සියලුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අණදෙන නිළධාරී වෙත සතුට ප්‍රකාශ කරන ලදී.

**බුද්ධි අංශය**
10 ශ්‍රීලපාහ

# WORTH WORK FOR MORALE

Make no mistake, morale is the first consideration of the commander of the troops. It's the primary factor in war the commander can not afford to forget about morale. He must devote all his energy and resources, to attain. The highest possible state of morale in his men.

As the statements of the masters of the battle morale is a mental rather than a physical quality therefore provisions should be taken up to boost up the morale of your men as much as possible.

According to field marshal slim, the foundation of morale as spiritual intellectual and material needs of any body of men therefore its better to realise that the moral is a blended psychological needs which translate soldiers defeat in to victory.

Due to the monotony of north and east battle morale of our soldier has been discreasing drastically. Because its hopeless and endless there for maintaining of morale is paramount important in present military situation.

Even though it happen such a manner we cant give up the battle since we have paid a lot. Therefore commander's must pay their keen attention to maintain their men's morale.

To maintain the morale commander's don't have to spend money even time but the commander's one word gives unexpected worth for the morale therefore the commander's must have the ability to select the correct word and place that word in to validity in real location. Then problems may arise how we select the suitable word and as to when we place in the real occasion. It completely depends on the leadership. No commander can get to know correct word which helps to boost up soldier's morale without been studied leadership therefore it's essentinal to every commander's to study leadership in deep. If you have become a master of leadership you will be able to find morale boosted unexpensive and worth word which leads to win the battle.

O/62545
**Lt KDLC Wijenayaka SLLI**
D Coy 8 SLLI

# ජයසිකුරු ක්‍රියාන්විතය - කනකරායන්කුලම් ප්‍රහාරය

හැඳින්වීම :-

8 ශ්‍රීලපාහ අලිමංකඩ,, කිලිනොච්චි ප්‍රදේශයන්හි ක්‍රියාන්විත රාජකාරියෙහි නියුතුව සිටි 1997.08.31 වන දින වන්නි ප්‍රදේශය වෙත පැමිණියේ එතෙක් දුරට දියත්වෙමින් පැවැති 'ජයසිකුරු' ක්‍රියාන්විතයට සහභාගී වනු පිණිසය. මේ අවස්ථාව වන විට ද තත් ක්‍රියාන්විතය ආරම්භ කොට සැහෙන කාලයක් ගතවී තිබූ අතර, මෙහි ප්‍රධානතම පරමාර්ථය වූයේ උතුරත් දකුණත් යා කෙරෙන ගොඩබිම මාර්ගයක් විවෘත කර ගැනීමය. මේ වන විට වව්නියාව ප්‍රදේශයන් උතුරට දියත් කෙරුණු 'ජයසිකුරු' ක්‍රියාන්විතය ක්‍රියාවට නැංවී තිබුයේ 55 හා 53 සේනාංක මූලිකකොට ගෙන ය. ප්‍රථමයෙන් අප බලඇණිය 533 බසේමු යටතේ සින්නපුවරසම්කුලම් ප්‍රදේශයේ රාජකාරි කටයුතු කළේය.

'රිවිරැස' ක්‍රියාන්විතයෙන් පසුව ත්‍රස්ථවාදීහු බොහෝ සෙයින්ම වන්නි ප්‍රදේශයේ කැලෑබද ප්‍රදේශ වලට පලා ඇවිත් ඔවුන්ගේ යුධ ක්‍රියාකාරකම් දැඩි කළහ. 'ජයසිකුරු' ක්‍රියාන්විතය ආරම්භවීමත් සමගම සතුරන් පුලියන්කුලම, කනකරායන්කුලම, මාන්කුලම ආදී ස්ථානයන්හි ආරක්ෂිතභාවය තව තවත් දැඩි කරන්නට වූ අතර, කිහිප වරකදීම ඉදිරියට ඇදෙන 'ජයසිකුරු' හමුදවන්ට ප්‍රහාර එල්ල කිරීමට ඔවුන්ගේ මුළු සංඛ්‍යා බලයම යොදා ක්‍රියාකොට ඇති අන්දම මනාව පැහැදිලි වන කරුණකි. එයට හේතුව වශයෙන් සැළකිය හැක්කේ අප බළසේනාවෝ වව්නියාව - කිලිනොච්චිය යාකොට ගොඩබිම් මාර්ගයක් විවෘත කළහොත් ඉන් එල්ටීටීඊ නායකත්වයට හා සංවිධානයට අත්වන යුධමය හා මානසික ව්‍යාකූලත්වය ඔවුන් විසින් පැහැදිලි ලෙස පෙර අධ්‍යයනය කර තිබීමයි. මෙමගින් සිදුවන බලවත් පරාජය හමුවේ එල්ටීටීඊ නායකත්වය ඔවුන්ගේ සටන්කාමීන් හට මරාගෙන මැරී හෝ ආරක්ෂක හමුදවන්ගේ ඉදිරි ගමන නැවැත්වීමට උපදෙස් දී ඇති බව පැහැදිලිව පෙනෙන සාධකයකි.

තත්ත්වය හොඳින් අවබෝධකරගත් එල්ටීටී ත්‍රස්තවාදීන් විසින් 'ජයසිකුරු' හමුදවන් පුලියන්කුලම් සිට ප්‍රධාන මාර්ගයට ප්‍රවිශ්ඨ වීම වළක්වාලනු ලැබීය. කිහිපවරක් ප්‍රයත්න දැරූ ආරක්ෂක හමුදවන් පුලියන්කුලමට නැගෙනහිරින් විකල්ප මාර්ගයක් ඔස්සේ කුරුප්පුකට්ටි දක්වා ගමන් කිරීමෙන් පුලියන්කුලම් හි සතුරු ත්‍රස්ථවාදීන් ව තවත් ව්‍යාකුල තත්ත්වයකට පත් කළේය. එතැනින් නොනැවතුණු ආරක්ෂක හමුදවන් විසින් කුරුප්පුකට්ටි සිට කනකරායන්කුලම් නගරය දෙසට විහිදෙන මාර්ගය අත්පත් කර ගැනීමට සැලසුම් කෙරුනි. (මෙ මාර්ගය පුලියන්කුලමට පසු උතුරුට විහිදෙන විකල්ප මාර්ගය වෙතින් ප්‍රධාන මාර්ගයට ප්‍රවිශ්ඨ විය හැකි කෙටිම දුර මාර්ගයයි.'

කනකරායන්කුලම් ක්‍රියාන්විතය සැලසුම් කිරීම:

'ජයසිකුරු' ක්‍රියාන්විතයේ තවත් පියවරක් ඉදිරියට තබමින් 'කනකරායන්කුලම්' නමැති ක්‍රියාන්විතය දියත් කිරීමට සැලසුම්පත් සකස්කරුණු ලබුයේ 97 සැප්තැම්බරදී මස 15 වැනිද පටන් ය. කනකරායන්කුලම් ප්‍රදේශය වූ කලී උපක්‍රමික වශයෙන් ඉතා වැදගත් ප්‍රදේශයකි. හේතුව වනුයේ ත්‍රස්තවාදීන්හට අප හට පිරිස් වෙත ප්‍රහාර එල්ල කිරීමට සුදුසු වටාපිටාවක් එහි තිබීමයි. යාපනය - නුවර ප්‍රධාන මාර්ගය අප පාලනයට නතුකර ගනිමින් ඉදිරියට ඇදුන අප හට පිරිස් වෙත එම ගමනෙහි මහත් බාධක ඇති කොට එකී ගමන අඩපන කිරීමට හැකියාව ලැබෙනුයේ මෙවන් වූ භූමියක් ත්‍රස්තවාදීන් අත පැවතීමය. ප්‍රධාන වශයෙන් මෙකී භූමිය කැලෑබදව පැවැති අතර, කනකරායන්කුලම ඇළ මෙම ප්‍රදේශය හරාහා වැටී තිබීම ත්‍රස්ථයන්ට උපක්‍රමික වශයෙන් වඩාත් වැදගත් වූ අතර, තැන් තැන්හි පිහිටි පුරන්ව ගිය කුඹුරු බොහොමයක් සතුරන්ගේ මෝටාර් ස්ථානයන් වශයෙන් උපයෝගී කොට ගැනීමට සුදුසු ලෙස සැකසී තිබුණි. ඇත්තෙන්ම කනකරායන්කුලම් ප්‍රදේශය පිළිබඳව ලැබුණු තොරතුරු අනුව එකී ප්‍රදේශය ත්‍රස්ථවාදීන් විසින් ශක්තිමත්ව ඉතා වැඩි හට පිරිසක් යොදවා රැකවල් කොට තිබුණු බැව් දැනගන්නට ලැබිණි. කෙසේ හෝ මෙවන් පසුබිමක් හමුවේ ප්‍රහාරයක් එල්ල කිරීමෙන් ඔවුනට උපරිම වශයෙන් හානිකිරීමට හැකියාව තිබෙනු පමනක් නොව ඉදිරියට දියත් කරන 'ජයසිකුරු' ක්‍රියාන්විතයට ඉන් ලැබෙන මහඟු පිටුවහල භූමිය වශයෙන් අති ඉමහත්ය.


මෙවන් වූ කාරණා අවබෝධයෙන් ත්‍රස්තවාදීන් හට උපරිම වශයෙන් හානිකොට සූන්කර ලබනු වස් කනකරායන්කුලම් ප්‍රහාරය සඳහා අප බලඇණිය සමගින් 4 වන ශ්‍රීලංසිරෙත් 11 වන ගැහේබ බලඇණියත් තෝරා ගැනුණි. ප්‍රහාරය සැලසුම් කිරීම සඳහා අප ඒකකය විසින් ප්‍රදේශය පිළිබඳව තොරතුරු ලබාගැනීම වස් ප්‍රහාරය දියත් කිරීමට මත්තෙන් විමර්ශණ කණ්ඩායම් විටින් විට කිහිපවතාවක්ම තත් ප්‍රදේශයට යවනු ලැබීය. මෙම විමර්ශණයන් සඳහා තවත් උපකාරී වූ සාධකයක් වූයේ අප බලඇණිය විසින් කරුප්පුකුට්ටි මන්සන්ධිය ප්‍රහාරය මගින් අත්පත් කර ගැනීම හා එතැන් පටන් එම ස්ථානයේ ආරක්ෂාව තහවුරු කර ගෙන සිටීමයි. කරුප්පුකුට්ටි ඉදිරි ආරක්ෂක වලල්ලේ සිට කනකරායන්කුලම් ඇළ මාර්ගයට ඇත්තේ කිමි. 1.6 කි. එතැන් පටන් කනකරායන්කුලම් නගරයට ඇත්තේ මි. 800 කි. මේ කරුණු හේතුවෙන් අප බලඇණිය කරුප්පුකුට්ටි ප්‍රදේශයේ ස්ථානගත වීම හුදෙන් ත්‍රස්තවාදීන්ව ප්‍රබල ආරක්ෂක ක්‍රියාමාර්ගයකට ඇදදමීමක් විය. තත්ත්වය හොඳින් අවබෝධකරගත් අප විසින් ඉදිරි භූමිය පිළිබඳව තොරතුරු රැස්කිරීමේ විමර්ශණ ආරම්භ කෙරිණි. එම තොරතුරු වලට අනුව සතුරාට වඩාත් උපක්‍රමික වශයෙන් වාසිදයක වූ භූමියක් වශයෙන් එකී ප්‍රදේශය පෙනීගිය අතර, ප්‍රහාරයට සඳහා සැලසුම් කිරීම එහෙයින් ඉතා තීක්ෂණ අන්දමින් කිරීමට සිදුවිය. විමර්ශණයෙන් ලද තොරතුරු අනුව අප බටපිරිස් හට ප්‍රහාරයට පෙර පුහුණුවීම් වල යෙදෙන්නට ද අවශ්‍ය විය.

ක්‍රියාන්විතය සිදුවීම :-

එක්රැස්කරගත් තොරතුරු ඔස්සේ ප්‍රහාරය සැලසුම් කළ අතර, 1997.09.30 වන දින අරුනළුවෙන්ම අඳුරත් සමගින් ක්‍රියාන්විතය සඳහා අප බලඇණිය පිටත්ව ගියේ ය. (රූපසටහන 1 ට අනුව) මේ ක්‍රියාන්විතයේ ප්‍රහාරාත්මක කණ්ඩායම් වශයෙන් 'සී' හා



"ජයසිකුරු" ක්‍රියාන්විතය කනකරායන්කුලම් ප්‍රහාරයට පෙර අනි විසින් නියෝග ලබාදෙමින්



'ඩී' කණ්ඩායම ද දකුණු පැති ආරක්ෂක කණ්ඩාම වශයෙන් 'ඒ' කණ්ඩායම ද වම් පැති ආරක්ෂක කණ්ඩායම වශයෙන් 'බී' කණ්ඩායම යොදා ගැනුණි. ප්‍රහාරය කුරුප්පුකුට්ටි ප්‍රදේශයේ සිට බටහිර දෙසට දියත් කිරීමට නියමිත වූ අතර ප්‍රහාරය ආරම්භ කිරීමට මත්තෙන් 'ඒ' කණ්ඩායම දුන් මග පෙන්වීම මගින් ග්‍රිඩ් අංක 735276 දක්වා බළඇණිය අවසන් එක්රැස්වෙන ස්ථානය දක්වා සීරුවෙන් යුතුව ගමන් කළ අතර, එතැන් පටන් (රූපසටහනට අනුව) කණ්ඩායම ඉලක්ක ස්ථානය දක්වා ගමන් ගත් අතර, මෙම ස්ථානය දක්වා පැමිණීමේ දී ත්‍රස්ථවාදීන්ගෙන් කිසිදු ප්‍රහාරයකට මුහුණ නොදුන්හ. ක්‍රියාත්මකය ආරම්භ කළ ස්ථානයේ සිට එනම් ග්‍රිඩ් අංක 743280 සිට මී. 1600 ක් $230^0$ කෝණයක් ඔස්සේ කනකරායන්කුලම් ඇළ දක්වා ගමන් කළ යුතුව තිබිණි. කනකරායන්කුලම් ඇළ මාර්ගයට බටහිර දෙසට වන්නට ත්‍රස්තවාදීන් විසින් ඉතා ශක්තිමත්ව ගොඩනංවා තිබූ බංකර් පෙළ වෙත යාම ඉතා හෙමින් මෙන්ම සුපරීක්ෂාකාරීව යා යුතු ගමනක් විය. ප්‍රථමයෙන් සතුරන්ගේ ප්‍රහාරය අප හමුවේ දියත් වන්නට වූයේ 'කඩවත' ස්ථානය දක්වා පැමිණීමේ දීය. මෙහි දී ත්‍රස්තවාදීන්ගේ දරුණු මෝටාර් හා කාලතුවක්කු ප්‍රහාරයන්ට අපට මුහුණ දීමට සිදුවූ අතර, ඒ අතරින් අප බළඇණි සොල්දාදුවෝ ඉතාමත් වික්‍රමාන්විතව ඉදිරියට සටනෙහි නියලූනහ. මෙම ප්‍රහාරයේ බලවත් කම ඇති වූයේ කනකරායන්කුලම් ඇළෙහි නැගෙනහිරට භට පිරිස් පිවිසීමත් සමගය. මීට ප්‍රථමයෙන් දකුණු පැති ආරක්ෂක 'ඒ' කණ්ඩායම් භටපිරිස් වෙත නොනවත්වා දැඩි ප්‍රහාරයක් ඇළ මාර්ගයට උතුරු දෙසින් එල්ල විය. සාර්ථකව මෙය මැඩපවත්වා ප්‍රහාරාත්මක ගුණය වැඩි දියුණු කරගත් සෙබලූ සමූහයෝ තම ඉලක්කය වෙත ලඟා වූයේ ඉතා දැඩි ප්‍රහාර හමුවෙහි. ඇළ මාර්ගය වෙතට පැමිණි භට පිරිස් ඇළෙහි බටහිර කොටසේ සිටි සතුරන් සමග මුහුණට මුහුණලා සටන් කොට එම ප්‍රදේශය සාර්ථක ලෙස අත්පත් කර ගැනිණි. විශේෂයෙන්ම ඇළ මාර්ගය පැන සතුරා වෙත යමේ දී ඇළෙහි උතුරින් ආ ප්‍රහාරය දරුණු වූ අතර, බංකර් වලවුන් සියළුම ත්‍රස්තවාදීන් විනාශ කොට ඔවුන්ගේ අවි වලින්ම ඔවුන්ට ප්‍රහාර එල්ල කිරීමට අප හමුදාවෝ සමත් වූහ. අප බළඇණිය වෙත සතුරු ප්‍රහාරය වැඩිවීමට ප්‍රධානහේතුව වූයේ අපට වමෙන් හා දකුණින් වෙන් වෙන්ව එහෙත් එකම වේලාවට ඇළ මාර්ගය අත්පත් කර ගැනීමට පැමිණි අනිත් බළඇණි දෙකට එම ඉලක්ක ලබාගැනීමට නොහැකි වීමයි. තත්ත්වය හොඳින් අධ්‍යනය කළ සතුරන් ප්‍රධාන ප්‍රහාරය වශයෙන් අප බළඇණියේ ප්‍රහාරය හඳුනා ගත්හ. මේ වන විට අප බළඇණියේ 'සී' හා 'ඩී' කණ්ඩායම් විසින් සතුරු බංකර් පෙළවල් දෙකක් (එකිනෙකට මී. 25-30 පමණ දුරින් පිහිටි ) සාර්ථක ලෙස විනාශ කරමින් ඇලෙන් ඉපිට ඉවුරෙහි හොඳ ස්ථාවරත්වයක් ලබා තිබුණි. මෙසේ පැය $1^1/_2$ ක් - 2 ක් අතර කාලයක් සතුරා සමග ලඟ ලඟ සටන් කරමින් සිටි අප බළඇණියට තව දුරටත් පතුරම් හා පිරිස් බළය නොමැතිව එහි සටන් කිරීමට නොහැකි බව අණදෙන නිලධාරී විසින් වටහාගත්තේය. මේ සමගම ත්‍රස්තවාදීන් විසින් ඔවුන්ගේ අතිරේක භටපිරිස් ගෙන්වා ගෙන එක පිට රළ ප්‍රහාර දෙකක් (Attacks on Waves) එල්ල කරන ලදී.

තව දුරටත් අතිරේක භටපිරිස් හා අවශ්‍ය පතුරම් නොලැබෙන බව තේරුම්ගත් අණදෙන නිලධාරී විසින් එම තත්ත්වයෙන් මිදීම සඳහා උක්‍රමික පසුබැසීමකට ඉදිරි කණ්ඩායම් වෙත අණදුනි. එහි දී අප නොසිතූ පරිදි වියරු වැටී සිටි ත්‍රස්තවාදීන් විසින් අපට වමෙන් හා දකුණින් ඇළ දිගේ පැමිණ දැඩි ප්‍රහාරයක් එල්ල කරන ලදී. ඉතා බිහිසුණු සටනක අඳුරු මතක සටහන් තම මතකයේ දිගු කලක් රඳවා ගැනීම සඳහා කොටි ත්‍රස්තවාදීන්ට නිසි පිළිතුරු දුන් අප බළඇණිය දිගින් දිගටම පහර දෙමින් මීටර් 3000 ක් පමණ පසුපසට පසු බැස්සේය.

යුධ භූමියේ එක් එක් අවස්ථාවල සිදුවන සිදුවීම් වල අවිනිශ්චිතභාවය තවදුරටත් පැහැදිලිව ඔප්පුවන අවස්ථාවකි මෙය. ප්‍රහාරයේ ප්‍රථම පැයේ දී ත්‍රස්තවාදීන්ට එලව එලවා පහර දුන් අප භට පිරිස් භට පතුරම් හා පිරිස් ප්‍රමාණය අඩුවීමෙන් උපක්‍රමිකව පසුබැසීමට සිදුවිය. වරෙක උපහාසාත්මකව හා ජයග්‍රාහීව ත්‍රස්තවාදීන්ගේ මල සිරුරු 18 ක් හා අවි 07 ක් එක්රැස්කර ගෙන අළෙන් එපිට ඉවුරේ බලය තහවුරු කර ගත් අප භට අල්ලාගත් ප්‍රදේශයෙන් ඉවත්වීමට සිදුවීම කණගාටුවකි. වෙඩි බලය හා පිරිස් බලය හීන වූ බව දැනගත් ත්‍රස්තවාදීන් ඔවුන්ගේ ප්‍රහාරය දැඩි කළහ. ප්‍රහාරයක අති ප්‍රබලම මූලධර්මයක් වන (Initiative) රඳවාගත නොහැකවීම අප පසුබැසීමට ප්‍රබලම හේතුව විය. කෙසේ වුවත් කල ක්‍රියාන්විතය දෙස ආපසු හැරී බැලුවහොත් අප ලත් අත්දැකීම් හා සතුරා වූ බලවත් පරාජය (සතුරන් 74 ක් මියගිය බව එල්ටීටීඊ ගුවන්විදුලිය මගින් එදිනම විකාශය විය.) ඉතා විශාල විය.

සමාලෝචනය :-

කනකරායන්කුලම් ක්‍රියාන්විතය අවසානයේ අප බළඇණියට සොල්දාදුවෝ 21 ක් අහිමි වූ අතර, තිදෙනතකු අතුරුදහන් විය. ඊට අමතරව නිළධාරී 4 ක් සෙසු නිල 123 දෙනෙකුට තුවාල සිදුවිය.

**මෙම ක්‍රියාන්විතයෙන් අත් වූ වාසි :-**


1. ත්‍රස්තවාදීන් 70-80 ක් පමණ මරා දමා 100 කට අධික පිරිසකට තුවාල සිදුකිරීමෙන් ඔවුන්ගේ චිත්ත ධෛර්ය පහත හෙළීමට හැකිවීම හා සංවිධානය අඩපන කළ හැකිවීම.
2. ත්‍රස්තවාදීන් එක් ස්ථානයකට එක්රැස් කරවා ගැනීමෙන් ඔවුන්ගේ අනෙක් කටයුතු වලට බාධා ඇතිකළ හැකිවීම.
3. යුධ උපක්‍රම වශයෙන් කනකරායන්කුලම් වැනි ප්‍රබල ස්ථානයක් වුව ද විනාශ කිරීමේ හැකියාව අප සතු බැව් සතුරාට ඒත්තු ගැන්වීම.
4. එම නිසා මෙම ප්‍රහාරයෙන් පසු එල්ටීටීඊ මගින් එම ස්ථානය තව තවත් පරස් යොදා ආරක්ෂා කිරීමෙන් අනෙක් ස්ථාන වල ආරක්ෂක තත්ත්වය ලිහිල් වේ.

සිදුවූ අවාසි :-

1. අප බලඇණියේ භට සංඛ්‍යාව අඩුවීමෙන් නැවත මුල සිටම ප්‍රතිසංවිධානය වීමට සිදුවීම.
2. තියුණු සටනකින් පසු අල්ලා ගත් භූමිය අත්හැරීම.

ඇත්තෙන්ම මෙම ක්‍රියාන්විතයෙන් පසු අප බළඇණි සොල්දාදුවන් සතුරන් සමග මුහුණට මුහුණලා සටන් කිරීමට තරම් පන්නරයක් ලැබූහ. ඉදිරි ක්‍රියාන්විත සිදුකිරීමට වුව ද සැලසුම් කිරීමේ දී ඊට ප්‍රථම කරණු ලබන විමර්ශණයන් ඇත්තෙන්ම ඉතා වැඩදායක මෙන්ම එහි සාර්ථකත්වය නංවාලීමට එය මහඟු අවස්ථාවක් ද වන්නේ ය.

**බුද්ධි අංශය**
**8 ශ්‍රීලපාභ**




## රණවිරු සිතක සාමයේ පැතුම

අම්මා පෙව්ව කිරිවල බල පෙන්වන්න
උතුරට ඇවිත් යුද්ධය ගැන දැනගන්න
සතුරත් නසන්නට ඔබේ ශක්තිය වැඩි වෙන්න
එලෙසින් ඇවිත් මගෙ මවුබිම රැකගන්න

ගින්නේ දැවෙන සිතකට දිය බිඳ වේවා
අඳුරෙන් පිරුණ හදකට පහනක් වේවා
මේ ගිනි අවිය මගෙ දෑතට හුරු වේවා
සතුරත් නසන්නට ශක්තිය වැඩි වේවා

ආසයි අම්මෙ මම අද උතුරට යන්න
උතුරට ආවේ මම කොටියන් පන්නන්න
කිසිද නොදෙමි මගෙ මව් බිම සතු රන්ට
වීර පුතෙකු ලෙස ආවේ·මගෙ මවුබිම රැකගන්න

සෙ/18707975 සාසෙ සෙනාරත්න
එල්ඒඩබ්එම්ඩී
15 ශ්‍රීලපාහ - සී කණ්ඩායම, පලෙයි - යාපනය

## රණවිරු සිතක සිතුවිලි බිඳක්

එඩිතර ලෙසින් ගොස් මවුබිම රැකගන්න
අහිමි විය දෙපා සතුරන්ගේ බට්ටන්ට
අසරණවී සිටින සොහොයුර සෙබලුන්ට
මටමෙන් ආදරෙන් සැමද සලකන්න

රතු සුදු නෙළුම් මල් පොකුරක් අතට ගෙන
බුදු හිමි පිදූ අයුරු සිහිවෙයි වෙසක් දින
රණබිම වෙතට ගොස් මතු ජය ලබා ගෙන
සම්දුට පුදමු අපි සුදු මල් නෙලා ගෙන

අවියක් අතට ගෙන සතුරත් නැසුවාය
මිතුරන් වෙතට නැත අවියක් එල්ල කොට
නංගී මල්ලි එපා අහිතක් හිතන්නට
මල්ලි එන්න උතුරට සතුරත් නසන්නට

සෙ/307972
සාසෙ උපුල් බංඩාර එක්එන්ජේ,
15 ශ්‍රීලපාහ, සී කකණ්ඩායම

## රසින් රස සිව් රසට

රස මවන - රස මාවතකින්
රස මාවතකට අප ගෙන යන - රසින් රස සිව්රසට
පතන්නෙමු දිගාසිරි....

සෝකය අපේ හදේ නිතරම රැව්දෙන්නේ
වැදගත් තරුණ ජීවිත අපෙ නැතිවෙන්නේ
සිංහල දෙමළ කාගෙත් රතු ලේඑන්නේ
ඇයි අද දෙපිළකට අද බෙදිලා ඉන්නේ

මගේ ඒකායන පැතුම ඉරු නැගයනවිටත් හිරු බැස යන විටත් සතුරත් මිතුරන් බවට පත්වී රටට සාමයයි.

සෙ/114722 ආසෙ මහින්ද වීකේපී
ඩී කණ්ඩායම 12 ශ්‍රීලපාහ, යුධහමුද කඳවුර, චාවකච්චේරිය - යාපනය.

## සාපලත් දේශය


කිමද මිනිසුනේ උපන් මේ බිමේ - තැත් කරන්නේ බිම් කඩක් රැගෙන
ඒ නමුදු ඉපදෙන විට මිනිසුනේ - තේරුම් ගන්ට නොහැකිව බල
තන්හාව පොදි බැඳන් අහිංසක ජීවිත - බිලිදෙන මිනිස්සුන්ගේ සිතනු මැන
මොහොතක් යුද්ධයේ සාපයට හසුව - මේ දේශයට උගස් කෙරුෑ තරුණ
ජීවිතවල රතු රුධිරය ගලා - ගිය යුගයකල අධර්මිෂ්ඨ මිනිසුනේ
පලායන මනුෂ්‍යත්වය නැවත මේ - බිමට එක්කර හෙට දින පායන
හිරුට අයුක්තියේ දොර වසා - සිතනු මැන සාමය ගැන

සෙ/309452 සාසෙ සිරිපාල එස්එම්
ඒ කණ්ඩායම 12 ශ්‍රීලපාහ, යුධහමුද කඳවුර,
චාවාකච්චේරිය - යාපනය

## එපා පෙම් කරන්නට මිළ මුදලට

ජීවිතය ජීවත් කරවන්නට - පිදූ සෙනෙහසට පෙම් කලා නම්
සබඳ ඔබ - මොනතරම් සුන්දර වේද
මා දිවිය සොයා ගිය රුපියල් සත නිසා - අතර මං වුනු ඔබ
කිසි දිනක පාවා නුදුන්නෙමි - මගේ අමිල සෙනෙහස
දුප්පත් වුවත් ඔබ සැමට - වඩා මිල මුදලින් මා පොහොසත්
මිනිස් කමින් මා සදකල්

සෙ/305 883 සාසෙ රංජිත් බණ්ඩාර ඩබ්ජීඩී
ඩී කණ්ඩායම 12 ශ්‍රීලපාහ
යුධ හමුද කඳවුර, චාවකච්චේරිය, යාපනය




# රණබිමේ පෙම්වතිය

ඇඳලා සුදු ගවුම බැඳලා ඉන පටිය
දමලා පිට දිගට ගොතලා කෙස් වැටිය
අතකින් පොත් මිටිය අතකින් පොඩි කුඩය
හරි ලස්සනයි මතක ද පාසල් දිවිය.

අවසන් කළෙමි රසබර පාසැල් දිවිය
දැතට ගත්තේ යුධ පිටියේ ගිනි අවිය
රට දැය රකින්නට අප කරනා කෙලිය
දෙනවද අම්මෙ දෙනව ද මට ඔබේ දිරිය

බිරිඳක් ඉඳියි සොයුරිය මට නැත තනිය
මම පෙම් කරමි ඇය හට පනටත් වැඩිය
ඒ කවුදැයි කියා ඔබ අද දැන ගත යුතුය
ඒ ප්‍රිය සොඳුර මා අත රැඳි ගිනි අවිය

2/ලුතිතන් ඩබ්එන්එස්බී වලිසුන්දර ශ්‍රීලපාහ
15 ශ්‍රීලපාහ
සී කණ්ඩායම, පලෙයි - යාපනය

# සෙබල පුතුගෙන් මවට

වින්ද දුක්ගිනි නිමාවක් නැත තවත් එලෙසින් දිවි මගේ
ගෙවන කාලය තෙරක් ගැන නම් මට ද කිසිවක් නොමහැගේ
රටක් වටිනා පුතුන් හැදුවත් ගොමස් කඩමලුයි ඇගේ
ඇයි ද අම්මේ හඩා දැඩිකර යැව්වේ උන්හැම පෙරමගේ

ජීවිතේ අඩ අවයනේ ඔබ ගෙවන කාලය සිත් තුටින්
ගෙවිය යුතු මුත් නොමැති අහලක බලා ගන්නට ඔබ පුතුන්
පෙරත් දිනයක මටත් මතකයි අගය කල හැටි දූ වරුන්
නොමැති ගුණදම් ඔබේ ලඟ මෙන් ඇන කොටාගෙන ඔවුනොවුන්

කොයි එකාටත් 'එකවගේ ඉඳ බෙද බත් පිඩු කැව් හැටි
සිඹා දෙකොපුල් පිරිමැද හිස් කිව් හැටි මගේ රත්කැටි
දුකක් නොමදී කිසිදු දිනයක රකුවේ බැලූවේ වැටි වැටී
සිහිවනා විට නැතත් උනුනට මට නැගේ කඳුලැලි කැටි.

සෙ/13129 ව/සැරයන් බංඩාරනායක අයිඩබ්එම්
"පාලන" කණ්ඩායම 15 ශ්‍රීලපාහ
යුද හමුද කඳවුර
පලෙයි - යාපනය

## යුධ බිමේ ඉන්න ආදර පියා විසින් ආදරණීය තම පුතු වෙතට

අතකින් ගිනි අවිය අතකින් පෑන ගෙන
ලිපියක් ලියන්නට බංකරේ වෙතට යන
සිහිවන විට දී මගේ ආදර පුත් රුවන
හදවත සැලී එයි කඳුලැලි ගලා ගෙන

ආදර පුතේ සිටියත් මම උතුරු කරේ
අම්මා ඉඳියි තනියට මගෙ පුතු අතරේ
මගෙ සිත ඔබළඟයි පුතුනේ මේ සසරේ
සැනසී නිදියාගන්න මව් සෙනෙහස අතරේ

නිවාඩුවක් ලද විට මා පැමිණෙන්නම්
එනවිට පුතුට තෑගිත් අරගෙන එන්නම්
සතුරා දුටුවිට දී පුතු ගැන නොසිතන්නම්
යුද්ධය දිනා ජයපැන් බොන්නට එන්නම්

පුතුහට ලියන්නට දහසක් තිබුනාට
එය සීමිතයි යුධ හමුදවේ අපට
මේ ටික ලියා නිම කෙරුවත් මම නුඹට
ආසිරි පතන්නම් පුතුනේ සැම විට

සෙ/305299 සාසෙ ආරියදස ආර්එම්
1 ශ්‍රීලපාහ "බී" කණ්ඩායම, පරන්තන් - අලිමංකඩ

## යුධ බිමේ සිට පියාණන් වෙත

පියතුම මගේ නිතරම මට සිහිවෙනවා
ඔබේ ගුණකන්ද මහමෙර පරදනවා
උතුරු කරේ සිට මා පැතුමන්ගෙන එනවා
මතුවත් භවයෙත් පියතුමඔබ මගෙ වෙනවා

සුරතල් බස් දොඩා මා සැදූ පියාණෙනි
පොඩිකල සිටත් මා සැදූ මගේ පියාණෙනි
සිහිවෙනවා මගේ ආදර පියාණෙනි
නුඹේ ගුණ ගයන්නෙමි නුඹේ පුතු පියාණෙනි

පාලුව තනිව ඉන්නා මේ වෙලාවට
සිහිවෙනවා පිය ඔබගේ සෙනෙහේ මට
එව්වා නුඹලාගේ පුතුණුත් පෙර මුණට
එම පිණ ඇති පියාණෙනි මතුමට සැනසෙන්න

අම්මා නැතිවුනත් අපි පොඩිකලේ පටන්
හැරගිය නැතේ සැදුවා මව් කෙනෙකු ලෙසින්
මතකයි ඔබ දුන්නා පියකරු සෙනෙහේ වදන්
ලියනෙමි ඔබේ ගුණය අද බංකරයේ ඉඳන්

සෙ/107027 ආසෙ රත්නායක
ආර්එම්ඒකේ
1 ශ්‍රීලපාහ, බී කණ්ඩායම පරන්තන් - අලිමංකඩ

# 2(සෙව්) ශ්‍රී ලංකා පාබළ හමුදා බලඇණිය 116 වන සංවත්සරය සැමරූ වගයි!

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද 23 බලසේනා මූලස්ථානය යටතේ ස්ථාපනය කර ඇති සිංහපුර යුධ හමුද කඳවුර 1997 අප්‍රේල් මස 02 වන දින මෙම කඳවුරේ රාජකාරි කරමින් සිටින සියළුම නිලධාරී, සෙබළ සෙබළියන් සැමටම සුවිශේෂ වූ දිනයක් විය. සිංහපුර යුධ හමුද කඳවුර ඉදිරිපසින් වූයේ මහවැලි 'බී' කලාපීය කොට්ඨාශ ක්‍රීඩාංගනයයි. කඳවුරේ 2(සෙව්) ශ්‍රීලපාහ නිළධාරීන් සහ සෙබලුන් රාජකාරී සඳහා මෙම කඳවුර වෙත යාකර සිටින 2 වන කාන්තා බලකායේ සෙබලියනුත් කඩිසර ගමනින් කඳවුර සිට ක්‍රීඩාංගනය දෙසටත් ක්‍රීඩාංගනයේ සිට කඳවුර දෙසටත් ලහි ලහියේ ඔබ මොබ සැරි සරති. මෙදින විශේෂත්වය වූයේ 2 වන (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුද ඒකකයතම 116 වන සංවත්සරය සැමරීමයි.

මෙදින උදෑසන සිංහපුර ගැමුණු විහාරයේ සංඝයා වහන්සේලා කඳවුර වෙත වැඩම කරවා ආගමික වතාවත් ඉටුකිරීමෙන් අනතුරුව පෙ.ව. 0730 පැයට යෙදුණ සුභ මොහොතින් ඒකක අණදෙන නිළධාරී ලූතිනන් කර්නල් ජීකේ වික්‍රමසිංහ කේඑම්වී ශ්‍රීලපාහ විසින් චාරිත්‍රානුකූලව පොල්තෙල් පහන දල්වීමෙන් පසු සංවත්සරික උත්සවයේ වැඩ සටහන් ආරම්භ කරන ලදී. ඒකකයේ පාලනමය රාජකාරි කටයුතු සර්වප්‍රකාරයෙන් ඉදිරියට කරගෙන යාමට ශක්තිය ධෛර්ය හා ආශිර්වාදය ප්‍රාර්ථනාකර ගතිමින් ඒකකයේ ප්‍රධාන ලිපිකරු විසින් සකස් කරන ලද ලිපියක් අණදෙන නිලධාරී විසින් එම සුභ මොහොතේම අත්සන් තබන ලදී.

උදසන 0800 පැයට එළඹියේ ඒකකයේ අණදෙන නිළධාරී සඳහා සූදනම්කර තිබූ සම්මාන පෙළපාලිය මගින් උත්තමාචාරය පිළිගැන්වීමයි. මෙම සම්මාන පෙළපාලිය අවසන් වීමත් සමගම බළඇණි දින ක්‍රීඩා උත්සව කටයුතු ආරම්භ කරන ලදී. පළමුව බයිසිකල් ධාවන තරගය ද, දෙවනව මැරතන් ධාවන තරගය ද අණදෙන නිළධාරීගේ සංඥවෙන් පසු ආරම්භ කිරීමෙන් අනතුරුව අනිකුත් ක්‍රීඩා තරග ආරම්භ කෙරුණි. මෙහි දී මෙම උත්සවය නැරඹීම සඳහා සිංහපුර මහවැලි ගම්මානයේ වැසියන් ද අවට ගම්මාන වන මුතුවැල්ල, ගල්කන්ද, කුඩාපොකුණ, පැරකුම්යාය, සූරිය වැය යන මහවැලි ගම්මානයන් ඇතුළු විශාල සිවිල් ජනතාවක් ද, අවට අනුඛණ්ඩයන්හි රාජකාරි කරනු ලබන නිලධාරී සහ සෙබළුන් ඇතුළු විශාල පිරිසක් මහවැලි ක්‍රීඩාංගනයට එක්රැස්වී සිටියහ.



2 (සෙව්) ශ්‍රීලපාහ බලඇණි දින උත්සවයේ දි [illegible] ඇදුම් තරගයේ කාගේත් සිත්ගත් රිලා නැටුමේ එක් අවස්ථාවක්

මේ අස්ථාවේදීම ආරාධිත අමුත්තා වූ 23 බලසේනාධිපති තුමා හා 23 බලසේනා මූලස්ථානය යටතේ පාලනය වනු ලබන අනිකුත් ඒකක අණදෙන නිලධාරීන් ද වැලිකන්ද සිංහපුර පොලිස් නිලධාරී මහත්වරුන් ද මහවැලි අධිකාරියේ නිළධාරී මහත්වරුන්ද ක්‍රීඩාංගනය කරා පැමිණ සිටියහ.

කාගේත් ප්‍රීතිඝෝෂා සිනා හඬ හා හාස්‍ය රසය මධ්‍යයේ ක්‍රීඩා තරග අතුරින් ලිස්සන ගසේ නැගීම, අලියාට ඇස තැබීම, කනා මුට්ටිය බිඳීම, කොට්ටාපොරය වැනි තරගයන්හි නිරත වූ තරග කරුවන් හා තරග කාරියන් එම ක්‍රීඩාවන්හි නිරත වනු දක්නට ලැබූ අතර, සෑම තරගයක් අතරතුර දීම 2 (සෙව්) ශ්‍රී ලංකා පාබළ හමුද ඒකකයේ බටහිර සංගීත කණ්ඩායම විසින් මියුරු ගීත හා සත්සර රාව නිකුත් කරනු ඇසිනි.

දිවා කාලය එළඹෙත්ම තද හිරු රැස් ක්‍රීඩාංගනය වෙත පතිත වී දැඩි රශ්මියක් තිබුන ද, සංගීත රාවයත් සමගින් අත්වැල් බැඳ බොහෝ අයවළුන් ප්‍රීතියෙන් නටනු දක්නට ලැබුනි. මෙම කටයුතු මධ්‍යයේ දිවා කාලය සීඝ්‍රයෙන් ඉකුත් වී යන බවත් කාහටත් දැනෙන්නාසේ නොබෝ වේලාවකින්ම දිවා ආහාරය සඳහා උත්සවය මඳකට නවතින ලදී. මෙම දිවා භෝජන සංග්‍රහය සියළුම නිළයින් එකට එක්වී රසවිඳි අතර, සිවිල් ජනයා වෙනුවෙන් ද විශේෂ භෝජන සංග්‍රහයක් සූදනම් කර තිබෙනු දක්නට ලැබුනි.

දිවා භෝජන සංග්‍රහයෙන් පසු නැවතත් උත්සවයේ කටයුතු ආරම්භ වූ අතර, ක්‍රීඩා තරගයන්හි උණුසුමින් නැගුනු ප්‍රීතිඝෝෂා හා සංගීත රාවයන්ගෙන් නැවත ක්‍රීඩාංගනය රැව් පිලිරැව් දෙනු ඇසුනි. සවිභාග්‍ය එළඹෙත්ම දැඩි රශ්මියකින් විඩාබරව තිබූ ක්‍රීඩා පිටිය හරහා සීතල සුළං රැළි හමා යද්දී ක්‍රීඩාංගනයට තවත් විශේෂාංගයක් එකතු විය. 'විකට ඇඳුම් තරගය' මෙහි දී නොයෙකුත් හාස්‍ය රසය පිරි ජවනිකා ඉදිරිපත් වූ අතර, කාගේත් සිනා පිරි විශේෂ රංගනයක් විය. එනම්, 4 ශ්‍රීලපාහ වෙතින් අරෙසේ මත එම ඒකකය වෙත ඇතුලත් කර සිටින සෙ/14945 සාසෙ ජයසිංහ ජේපීආර් සහ 2 (සෙවි) ශ්‍රීලපාහ ඒකකයේ සෙ/22709 සාසෙ බාලසූරිය බීඒඑස් යන දෙදෙනා විසින් ඉදිරිපත් කළ අභිකුන්ටිකයාගේ මහ රිලවාගේ චරිතයයි. ඒ මෙම විකට ඇඳුම් තරගය විනිශ්චය කිරීම සඳහා ඒකක අණදෙන නිලධාරී සමඟ එම මැතිණිය ද, සිංහපුර පොලිස් ස්ථානාධිපති සහ මහවැලි කොට්ඨාශ කළමනාකරු එච්ජී දයානන්ද යන මහත්වරු ද පෙනී සිටින ලදී.

මෙම තරග වාරයෙන් පසුව එළඹී තිබුනේ ත්‍යාග ප්‍රධාන උත්සවය හා මහා සංගීත රාත්‍රියයි. සවස 5.30 පැයට පමණ අණදෙන නිලධාරී තුමා සහ එම මැතිණිය අතින් ද, පැමිණ සිටි අනිකුත් ආරාධිත අමුත්තන් හා කණ්ඩායම් නිලධාරී අණදෙන වරුන් විසින් ක්‍රීඩා උළෙලේ ජයග්‍රාහකයින් සඳහා ජය සංකේත සහ ත්‍යාග ප්‍රධානය කරන දී. කාගේත් සිත් සතන් ඇඳ බැඳ තබමින් ආරම්භ වූ සංගීත රාත්‍රිය පුරා පැය කීපයක් මුළුල්ලේ පැවැත්වීමෙන් පසු හෙළ ජාතික අභිමාන ගීතයේ රාවය දසත පතුරමින් උත්සවයේ වැඩ කටයුතු අවසන් කෙරිනි.

ජාතියට දේශයට මෙහෙවර කරන්නට ශ්‍රී ලංකා යුධ හමුදවට ප්‍රථමයෙන්ම එක්වූ 2 (සෙවි) ශ්‍රී ලංකා පාබළ හමුද වීරෝධාර රණවිරුවන් හා අනිකුත් සෙබළ සෙබලියන්, උදවෙන හෙට දවස වෙනුවෙන් සේවය කරන්නට එක්සිත්ව එක්සත්ව උදරතර අධිෂ්ඨානය සිත්හි දරාගෙන නිරතුරුවම තම සුරත රැඳි ගිනි අවිය තුරුළු කර මහවැලි ක්‍රීඩාංගනයේ සිට කඳවුර කරා පිය නගනු දක්නට ලැබුණි.....'

සකස් කලේ
සෙ/14945 සාසෙ ජයසිංහ ජේ.පී.ආර්
(4 ශ්‍රීලපාහ - නි.කා.ම)
මූලස්ථානය 2 (සෙවි) ශ්‍රීලපාහ
වෙංකල්අඩි - මඩකලපුව

# ශ්‍රී ලංකා ඉතිහාසයේ වැදගත් සිදුවීම් හඳුනාගනිමු

| | |
|---|---|
| 1505 | නොවැම්බර් මස 05 වන දින පෘතුගීසීන් ලංකාවට පැමිණීම |
| 1687 | වර්ෂයේ විමලධර්මසූරිය රජතුමා විසින් දළද මාලිගාව ඉදිකිරීම |
| 1802 | මාර්තු මස 15 වන දින ශ්‍රී ලංකාවේ ප්‍රථම ගැසට් පත්‍රය පළවීම |
| 1814 | මැයි මස 17 වන දින මද්දුමබංඩාර ඇහැලෙපොල ළමා වීරයා මරා දමන ලදී |
| 1815 | මාර්තු මස 02 වන දින වාරියපොල ශ්‍රී සුමංගල හිමියන් විසින් ඉංග්‍රීසි කොඩිය පහත දමා සිංහල කොඩිය එසවීම |
| 1818 | පෙබරවාරි මස 12 වන දින ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට යුද්ධ නීතිය පනවන ලදී |
| 1844 | වර්ෂයේ දී පොලිස් උසාවිය පිහිටුවන ලදී |
| 1848 | ජූලි මස දී උඩරට කැරැල්ල ඇතිවීම |
| 1881 | ශ්‍රී ලංකා පාබල හමුදව ආරම්භ කරන ලදී |
| 1892 | ශ්‍රී ලංකා ගිණි නිවන හමුදව ආරම්භ කිරීම |
| 1942 | අප්‍රේල් මස 02 වන දින ජපනුන් විසින් ත්‍රිකුණාමලයට බෝම්බ හෙලීම |
| 1948 | පෙබරවාරි මස 04 වන දින ශ්‍රී ලංකාව නිදහස් රාජ්‍යයක් බවට පත්වීම |
| 1949 | ඔක්තෝබර් මස 10වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදව පිහිටුවන ලදී |
| 1956 | සැප්තැම්බර් මස 26 වන දින අග්‍රාමාත්‍යව සිටි එස්ඩබ්ආර්ඩී බණ්ඩාරනායක මහතාගේ අභාවය |
| 1960 | ලෝකයේ ප්‍රථම අගමැතිණිය ගරු සිරිමා බණ්ඩාරනායක මැතිණිය අගමැති තනතුරට පත්වීම |
| 1995 | ජූලි මස 08 වන දින සුදු නෙළුම් ව්‍යාපාරය ආරම්භ කිරීම |

**කෝප්‍රල් හෙට්ටිආරච්චි එච්ඒබීපී**
**රෙජිමේන්තු මධ්‍යස්ථානය - ශ්‍රීලපාහ**
**යුධ හමුද ජනපදය - පනාගොඩ**

**ඔබගේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා ඉදිරි සෑම කලාපයක් තුළම ලිපි ඉදිරිපත් කරනු ලබන බැව් දන්වා සිටිමි.**

# අහිමි නිදූනය

තරු ගොන්නකට මදක් ඇතින් අඩ සඳ පායා දිළුනේ ය. පාවී යන වලාවන් අතර විඩෙන් විඩ සැඟවෙන සඳතැන් සිංහපුර ගම් ප්‍රදේශයපුරා පැතිර ගොස් තිබුනේය. සිසිලසක් මුසු කොට හමාගිය පවන් රැලි ඔස්සේ ඝන කළුවලාවන් අහස් කුස සිසිරා පැතිර ගොස්තිබිණි. නිසලත්වයෙන් සුවය ලබමින් තිබූ ස්වාභාවික පරිසරය පුරාම නිසසල බවක් ඇති කරමින් පාළුව ලුහුබඳින කිරලෙකු හඬා වැටුනේය. සුපිපි මල් මෙන් නොපිපි මල් කැකුළු කඩා හැළුනේ කාටත් හොර රහසේමය. කුරිරු ත්‍රස්තවාදීන්ගේ ග්‍රහනයට අසුවුන සිංහපුර ගම එකම අමු සොහොනක් මෙන් දිස්විය. මෙම අමානුෂික සිදුවීම ලැව් ගින්නක් මෙන් රටපුරා පැතිර ගියේ ය. ඕමිටිගල ගමේ විහාරස්ථානයේ ජිනරතන ස්වාමීන් වහන්සේට සවන වැටුන මෙම සිදුවීම පිළිබඳ මහත් කල කිරීමක් වේදනාවක් ඇති වී තිබිණ. පසු දින උදසනින් උන්වහන්සේ සිංහපුර ගම් ප්‍රදේශය බලා වැඩි සේක. ගෙවල් දෙරවල් විනාශ කොට කපා කොටා මරා දමා තැනින් තැන වැටී තිබුණ සිරුර අතර අඬා දොඩන අය මෙන්ම සාමාන්‍ය මිනිසුන් ද පිරී සිටියේ ඉමහත් කලකිරුණු ස්වභාවයෙන් යට. සිංහපුර ගමේ අස්සක් මුල්ලක් නැර ඇවිද ගිය උන්වහන්සේට දෙමාපිය හිතවතුන් කිසිවෙක් නොමැති ත්‍රස්තවාදීන්ගේ ග්‍රහනයට අසුව දිවි ගලවාගත් මළවුන් අතර සොවින් හඬා වැළපෙන ළමයකු දක උන් වහන්සේගේ සිත බොහෝ සෙයින් දුකට පත්වුණි. ඉක්බිති උන්වහන්සේ එම ළමයාගෙන් තොරතුරු අසා තම ගෝලයකු මෙන් ඔහු පුරුදු පුහුණු කර ගැනීමට තම ඕමිටිගල පන්සල් භූමිය වෙත කැටුව ආසේක. ඉගනීමට වැඩි කැමැත්තක් නොදක්වූ ඔහු නමින් සිරිපාල විය. දිනෙන් දින සති මාස ගණන් අවුරුදු වලට පෙරළී සිරිපාල තරුණ වියට ළඟා වුණේය. පන්සලේ නම ගිය උපාසක රාළ කෙනෙක් වන ජයසේකර වෙද මහත්තයා ජිනරතන හිමියන්ගේ හොඳ මිතුරෙක් විය. පන්සලට නිතර එන යන ජයසේකර වෙද මහතා සිරිපාලගේද සුහද මිතුරෙක් විය. මේ අතරතුරේ පන්සලට නිතර යන එන තරුණියකට සිරිපාලගේ සිත තදින් බැඳී තිබුනේය. දවස් කීපයක් ඇය ගැන කල්පනාවෙන් කාලය ගෙවූ සිරිපාල එක් දිනක් ඇය හා කුළුපග වුනේය. ඇය නිතර නිතර හමුවන සිරිපාලට ඔවුන් දෙදෙනාගේ ආදරය බොහෝ දුරදිග ගොස් තිබුණි. සිරිපාලට ඇය අමතක කිරීමට තරම් මානසික ශක්තියක් නොවීය. එක් දවසක් ඇ සිරිපාලගේ ළඟට තුරුළුවී දෙනෙතින් කඳුළු වගුරමින් කියූ වදන් මතකයේ නිබඳවම රැ වි දෙන්නට විය.

˙සිරිපාල අයියේ ඔයාට මං ආදරය කලාට ඔයා වගේම අහිංසක දුප්පත් කෙල්ලෙක් මං. අපේ තාත්තා නැති වෙලා තිබෙන්නේ මං පොඩි කාලෙදීමයි. එද පටං අපේ අම්මා මා වෙනුවෙන් නොවිඳිනා දුක් විඳලයි මං ලොකු මහත් කරල තියෙන්නේ. අපට ජීවත් වන්න ක්‍රමයක් නැති නිසායි මායි අම්මයි ලොකු හාමුදුරුවන් මුන ගැහිලා පන්සල් වත්තේ වැටෙන පොල් අතු එකතු කරලා වියල විකුණ ගන්න මුදල් වලින් පංසලටත් කීයක් හරි දීලා අපිත් ජීවත් වෙන්න ඕන නිසා අවසර ඉල්ල ගත්තේ. ඔයා මට දිවුරා පොරොන්දු වෙන්න ඔයාගේ මේ ... මාලිව කවදවත්ම අමතක කරන්නෙ නෑ කියල....

මාලි පැවසූ ඒ වදන්වැල සිරිපාලගේ හදවතෙහි සද නොමියන මතකයක් සේ රැඳී තිබුණි. සිරිපාලගේ සහ මාලිගේ සම්බන්ධය දළුලා වැඩෙනවාත් සමගම කණකොකා හඬා ගියේ කාට කාටත් නොදනෙන විලසට ය. මෙවන් විට ඔහුගේ ආදර කථාව ගම පුරාපැතිර ගොස් තිබිණ. සියලූ බාධක හමුවේ කාලය ගෙවී ගියේ ය. එක් දිනක් ජයසේකර වෙද මහත්තයා පන්සල වෙත ගමන් අරඹන ආකාරය සිරිපාල බලා සිටියේ ය. බර කල්පනාවක යෙදී සිට ගමන්ගත් ජයසේකර වෙද මහත්තයා සිරිපාලට ළං වනතුරුම දුටුවේ නැත. උන් තැනින් නැගිට ගත් සිරිපාල වෙදමාමා යැයි කියමින් කටහඬ අවදි කළේය. සැනකින් සිරිපාල දෙස බැලූ වෙද මහත්තයා.

˙හා... සිරිපාල ළමයනේ... මං මේ තකහනියක්ම අවෙ උඹ මුරිච්චි වෙන්න බං...˙

˙ ඇයි... වෙද මාමේ කරදරයක්ද?˙... ම්... නෑ... බං උඹට වැදගත් කාරණාවක් තියනවා කියන්ට... මම මේක කීවා කියල මා ගැන වැරදි විදියට හිතන්න ඕන්නෑ ඔන්න... බලපන් සිරිපාල ළමයෝ උඹේ කල වයසත් හරි... ඒත් උඹට කියල කිසි කෙනෙක් නැහැ. කාසි භාගයවත් ඇත්තෙත් නැහැ. ඔහොම රූකඩයක් වගේ පංසලට වෙලා ඉඳල වැඩක් තියෙනවද මං අහන්නේ?˙

˙ඒක නම් ඇත්ත වෙද මාමේ මාත් මේ දහ අතේ කල්පනා කරන්නේ මොනව ද කරන්නෙ කියලා˙

˙ඕ... කට උඹ හිත කලබල කරගන්න කාරියක් නෑ. උඹ කැමති නම් සිරිපාල මා ළඟ තියෙනවා ඉක්මණින් දියුණු වීමට ක්‍රමයක්. හැබැයි රහසක් උඹ විශ්වාස හින්දයි මම මේක කියන්නේ.... මං ළඟ තියෙනවා පුරාණ පුස්කොල පොතක් ඒකේ ලියා තියෙනවා ඕමිටිගල ගලේ පියවර හතක් උතුරු දිසාවෙන් ගමන් කල පසු ගලෙන් නෙලන ලද දේව ප්‍රතිමාවක්. එම සලකුණ ඇති ගල හතරැස් ආකාරයෙන් පිහිටා ඇත්තෙ. ඒ සලකුණු කොට ඇත ගලයට නිධානයක් තියෙනවාළු, උඹ කැමති ද ඒක ගන්න...˙

මද වේලාවක් කල්පනා කරමින් සිටි සිරිපාල

˙වෙද මාමා මං අහලා තියෙනවා ඕව භයානක වැඩ කියල˙

˙අනේ නිකා හිටපන් සිරිපාල මගේ මේ ඉහ නිකට පැහුනෙ අව්වට නොවෙයි. මං දන්නව ඕව ගන්න මන්ත්‍ර සූත්‍ර . මට ඕනෑ උඹේ කැමැත්ත විතරයි.˙

සිරිපාල මුහුන පාල සිටින තත්ත්වෙ අනුව කල්පනා කර බලා එම අදහසට කැමැත්ත ප්‍රකාශ කළේය. එහෙත් ජයසේකර වෙද මහත්තයා ඊළඟට පැවසූ වදන් ඇසූ සිරිපාලගෙ ගත සිත හිරිවැටී ගියේ ය.

˙ හැබැයි සිරිපාල මේ වැඩේට තුන්කුළුදුල් නර බිල්ලක් අවශ්‍ය වෙනවා˙

මොහොතක් ගල් ගැසී සිටි සිරිපාල

˙කොහොම ද වෙද මාමා අපි එහෙම කෙනෙක් හොයන්නේ˙

සිරිපාල උඹ කලබල වෙන්ඩ එපා මම මෙහෙම කියනවාට. අපිට දෙමාපියෝ සහෝදරයෝ කොච්චර හිටියත් වැඩක් ඇද්ද බං ˙තම හිතට තමා අතමය සෙවනැල්ල˙ කියල උපහරනයකුත් තියෙන්නෙ බං... මොකාද බං අපිට කාසි බාගෙ නිකම් අතට දෙන්නෙ... මේ වැඩේට ගැලපෙන නියම සලකුණු තියෙන කෙනෙක් මේ ළඟම ඉන්නවා බං... මේ වැඩේට අත ගහනව නම් පිං පව් බලන්නෙ නැතිව එහෙම තීරණයක් ගනී.

˙ඔව්... වෙද මාමා උඹ කියන කතාවත් ඇත්ත˙ හැබැට කවු ද ඔය වැඩේට ගැලපෙන කෙනා.... වෙන කවුරුත් නොවෙයි බං මගේ මැරිච්ච ලොකු අයියගේ වැඩිමහල් කෙළී. උඹට ආයෙ අමුතුවෙන් තේරුම් කරන්න දෙයක් නෑ. උඹ යාළුවෙලා ඉන්න මාලී.. එය කණ වැටුනු සැනින් සිරිපාලගේ හදවත ගිනියම් යකඩයක් මෙන් උණුසුම් වන්න විය.

දිව ගොත ගැසිනි. ඇස් යට ගිළුනි. හිටි පිළිමයක් මෙන් ඔහු ගල් ගැසිනි. යාන්තමින් කෙඳුරු ඔහු 'ම... මගෙ.... මාලි... මගේ මාලි' කොහොමද දෙවියනේ මම ඒ අහිංසක කෙල්ලට මුළු හදවතින්ම ආදරේ කරල ඒ ආදරය විනාශ කරන්නේ..... සිරිපාලගේ හැසිරීම තේරුම් ගත් ජයසේකර වෙද මහත්තයා.... 'ඈ බං... මම මුලින්ම කීවනේ මේ වැඩ දෙකට නැමිල කරන්න බෑ කියල. උඹ කල්පනා කරල මට තීරණයක් දීපන්' මද වේලාවක් කල්පනා කළ සිරිපාලගේ සිත කෙමෙන් කෙමෙන් ජයසේකර වෙද මහතා වෙත නැඹුරු වන්නට විය. සිරිපාලගේ සිත දමනය කරගත් වෙද මහතා ඔවුනොවුන් සිත තුළ වස්තු තන්හාවෙන් පිරී ගියේ ය. නිදන් වස්තු ගැනීමට උපායක් යොද ගත් ඔවුන් දෙදෙනා සිටි තැනින් නික්ම ගියේ ය. දවස් කීපයක් කල්පනා කරමින් හිඳ සිරිපාල එක් දිනක් මාලි හමුවීමට ගියේ ය. වෙනද මෙන් පෙම්බස් නොදෙඩූ සිරිපාල වැඩි වශයෙන් ගොළු වත රැක්කේය. දවස් කීපයකින් හමු වූ සිරිපාල එක්ක දෙඩවීමට දේ තිබුණත් ඔහු සිටින තත්ත්වයේ වෙනස දුටු මාලි හීන් ස්වරයෙන් ඇමතීය. 'සිරිපාල ඇයි ඔයා ගොළු වෙලා වගේ ඉන්නේ. දවස් කීපයක් මුණ ගැසීමට පෙරුම් පුරලා අද අපි හමු වුන දවසේ වත් වචන දෙකක් ඔයාට කථා කරන්න බැරිද? ඔයාට මොනා හරි ප්‍රශ්නයක් ඇත්නම් මට කියන්න එසේ කියමින් මාලි බිම බලා ගත්තේ ය. දිගු සුසුමක් හෙලූ සිරිපාල 'මම හැමදමත් ඔයාට ආදරෙයි මාලි ඒත් දන් ටික කාලයක ඉඳල මට සනීප නෑ. මම හැමදම හීනෙන් බය වෙනවා. වෙද මාමාට කියල මතුරල නූලක් දගත්තා. ඒත් තවම සුවයක් නෑ වෙද මාමා කියනවා ඕවිටිගලට ගිහින් බාරයක් වෙන්නලූ. එතන හරි හාස්කම් ඇති තැනක්ලූ. මට ග්‍රහ අපලයක් බලපාලලූ' එහෙම නම් අපි වෙදමාමට කියල ඕවිටිගලට ගිහින් භාරයක් වෙමු. සිරිපාල ම්... මාත් හිතන් ඉන්නෙ යන්න කියලයි. ඒත් ඔය මහ කැලෑව මැද්දෙන් පයින් සැතපුම් හතඅටක් යන කොට එපා වෙනවා. අනික වල් සතුන්ගෙන් බේරිලා යන්නත් එපායැ. 'ඔයත් එනව ද යන්න මාලී' 'මම අම්මට කියල එන්න බලන්නම්. නෑ මාලි අම්මට කීවොත් ඔය ගමන ඔයාට කොහොමටවත් එන්න දෙන්නෙ නෑ. මහ කැලෑවේ යන එක භයානකයි. ඔයා අම්මාට හොරෙන් ඉස්කෝලෙ යනව කියල එන්න. අපි උදේම ගිහින් රෑ වෙන්න කලින් ගෙදර එමු. අනික වෙද මාමා පාර දන්නවනෙ යන්න. බය වෙන්න දෙයක් නෑ. යන්න කලින් වෙද මාමා මුණ ගැහිලා අවශ්‍ය දේවල් සලසාගෙන යන දිනය ඔයාට කියන්නම්' එසේ කියූ සිරිපාල ඇයගෙන් සමුගෙන පංසලට පැමිණියේය. පසුව සිරිපාල වෙද මහතා සමග කතා බහ කරගෙන අවශ්‍ය සියළුම දේවල් සකසා ගෙන එක්තරා දිනක පාන්දරින්ම ගමන ආරම්භ කළේය. වෙද මහතාගේ මග පෙන්වීම යටතේ ගමන් ගන්නා අතර වෙද මහතාගේ හිතවතෙක් ද පිටස්තර ප්‍රදේශයකින් එම ගමනට සහභාගී කරගෙන තිබිණි. කැලේ මැදින් යනවිට නොයෙක් බාධක හමු වූ නමුත් ඒවා මැඩ පවත්වා ගෙන ගමන නිම කරන විට හොඳටම සවස් විය. බොහෝ හෙම්බත් වී සිටි ඔවුනොවුන් ගෙන ආ ආහාර පාන කා බී විවේක ගෙන වෙද මහතා පූජාවට අවශ්‍ය කටයුතු සම්පාදනය කළේය.

කිසිම දිනක ගෙදරින් පිට වී රැයක් ගත කර නොමැති මාලිගේ හිත තුළ යම්කිසි බියක් සැහවී තිබිණි. ඇයට විටින් විට තම මව සිහි විය. තම මෑණියන්ට නොකියා මෙහෙම ආ ගමන කොයි තරම් වැරැද්දක්ද කියලා ඇය කල්නා කළේය. නමුදු ආදරය වෙනුවෙන් ඇති විශ්වාසය මත ඔහු වෙනුවෙන් මේ ගමනට ඇය සහභාගී විය. සියලූ වැඩ කටයුතු වෙද මාමා සහ අනිත් හිතවතා කරන අතර මාලි සහ සිරිපාල පසෙකට වී එයට අත් උදව් දුන්නේ ය. පූජාවේ උච්චතම අවස්ථාව වන විට මැදියම් රෑ වෙලා තිබුණේය. ඝණ අන්ධකාරයෙන් ඕවිටිගල ප්‍රදේශය වසාගෙන තිබුණි. ගහකොළ නිසල වුවත් අවට පරිසරය නිසල බවක් ඇති කළේ වන සතුන්ගෙන් පිටවන විවිධ කෑගැසීම් වලින් හා ශබ්ද වලිනි. තම ඉරණම ගැන කිසිත් නොදත් මාලි නිදහස් ගල මත දන නමා වාඩි වී සිටියේ ය. ගල මතුපිට දල්වෙන ගිණි පන්දම් කෙමෙන් කෙමෙන් බොදවෙන දීප්තිමත් කාන්තිය අඳුර හා ගැටෙන බව මාලිට නොතේරුණේය. කන් දෙක දෙපසින් කරල් දෙකට ගෙතූ කොණ්ඩය පිටු පසට වැටී තිබිණි. පාසැල් යාමට ඇඳ සිටි සුදු ගවුම පොඩි වීකිලිටි වී තිබිණි. යක්ෂයෙක් මෙන් කොණ්ඩය කඩා දමාගෙන ආවේශ වූ හිතවත් යකදුරා හිස කරකවමින් දෙඩවන්න විය. ජිවිතේ කවදාවත් මෙවන් අත්දැකීමකට මුහුණ නොදුන් මාලි තැති ගැනීමකින් යුතුව නිහඬව බලා සිටියේ ය. යකදුරා හූ තුනක් කියනවාත් සමගම බහිරව ගොටුව දීමට නියම කර තිබුණේ සිරිපාලටය. සිරිපාල තම ඉනේ සඟවා තිබූ උල්පිහිය තම හුරු අතට ගෙන වමතින් මාලිගේ කට වහනවාත් සමගම හිත්පිත් නොමැති අයුරකින් ඇයගේ ලය පසා කරමින් ඒ පිහිතුඩ කිමිදී ගියේ ය. සිහිසුන් වූ මාලි නිදහස් ගල තුළ කිහිප වාරයක් දඟලා නිහඬ විය. ඇගෙ සිරුරෙන් පිටවන උණුසුම් රුධිරය ගොටුවකට ගෙන යහන මත තැබීය. වෙද මහතා සහ යකදුරා දෙමාරුවට මැතුරූ නමුදු නිදහස් ගල නම් ඇරුනේ නැත. තැති ළමින් සිටි වෙද මහතා ගල් කැබැල්ලක පය පැටලී මල් බුලත් ගොටුව පෙරලාගෙන බහිරව ගොටුවත් කඩාගෙන නහෙන් කටෙන් සෙම පෙරාගෙන බිම පතිත විය. හදිසියේ මැතිරීම නැවැත්වූ යකදුරා සේරම සූත් කියාගෙන වෙද මහතා බද ගත්තේය. මොහොතක් ගල් ගැසී සිටි සිරිපාල යකදුරාගෙන් කෝපයෙන් කරුණු විමසීය. යහන කිල්ලකට හසු වී ඇති බවත් නර බිල්ලට මාස් ශුද්ධිය එම මොහොතේ හැදී ඇති බවත් ප්‍රකාශ කළේය. නිදනය ගැනීමට නම් තව නරබිල්ලක් අවශ්‍ය බවද ඔහු පැවසූවේ ය. ඒ බස් සවන් වැටුන සිරිපාල යක්ෂා වේශයෙන් තම අතේ ඇති උල්පිහියෙන් හිටල්ලා මම එකට දෙකක් දෙන්නම් කියා යකදුරාටයි වෙද මහතාටයි ඇනගෙන ඇනගෙන ගියේ ය. යකදුරා සහ වෙදරාළ සදහටම දස් පියා ගත්තේ ය. අතේ ඇති පිහිය පසෙක තැබූ සිරිපාල මාලිගේ සීතල සිරුර තම දතින් ඔසවා තුරුළට ගත්තේ ය. සිරිපාල උන්මත්තෙකු විලසින් එම සිරුර සිප ගනිමින් හඬා වැලපෙන්න විය. සුළු මොහොතක් එසේ රැඳුන සිරිපාල කොළ අතු කීපයක් කඩා ඇගේ සිරුර වසා අහස හිස හමත කඩා වැටුන මිනිසෙකු පරිද්දෙන් පියවරවල් කීපයක් ගල මත තබමින් සැනෙකින් නතර විය. මුළු අහස් කුසම කළුවර වී හඬක් පිපිරුනේය. ගස්වැල් අඹරවමින් මහ චන්ඩ මාරුතයක් හැමීය. සිරිපාලගේ ඇස් ගිණි පුපුරු මෙන් දිළිසුණේය. මහ කැලෑවම විදුලි පංකාවක් වගේ කැරකෙනවා සේ සිරිපාලට දැනිණ. සිරිපාල තුස්නිම්භූත විය. ඒ සමගම මනෝමය මායාවක් සිරිපාල කියා කීප වරක් සිරිපාල අමතනවා ඇසීය. ඔහු තිගැස්සී පිටුපසට නෙත් යොමු කළේය. ඔහුට එක වරටම පෙනුනේ මාලිගේ සිරුර වසා තිබූ කොළ අතු ඉවත් වන ආකාරයයි. වැතිරී සිටිය තැනින් නැගිට ගත් මාලි කොණ්ඩය කඩා ඉහිරවාගෙන 'අනේ සිරිපාල ඔයා යන තැනකට මාත් එනවා කියමින් අඬාගෙන සිරිපාල වෙත ඇදී ආවේය.' සිරිපාල මානසික කම්පනයෙන් විකෘති වී නිදහස් ගල දිගේ දිවුවේය. නිමේශයක් ගත විය. ඕවිටිගල නිදහස් ගල පහලට ඔහුගේ සිරුර මරහඬ නගමින් පා වී ගියේ ය.

'මිල මුදලට මිනිස් බව යටවුන ලෝකයේ බල තන්හාවෙන් වස්තු තන්හාවෙන් මිනිස් බව කෙලසන මිනිසාට කුමන නිවනක් ද?


සැකසුම -
සෙ/00281
ලාකෝ රණවීර දීසානායක ඩීඑම්
9 ශ්‍රීලපාහ හමුදාව, ඩී බණ්ඩායම
ර්වතයි - පලාලි



















1 1997-09-07 දින රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ හි ආබාධිත රණවිරුවන් වෙනුවෙන් පවත්වා ලද සංගීත ප්‍රසංගයට ආරාධිත අමුත්තා වශයෙන් **AK** ජයවර්ධන මැතිනිය පැමිණි අවස්ථා

2 1997-09-07 දින රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ ආබාධිත රණවිරුවන් වෙනුවෙන් පවත්වා ලද සංගීත ප්‍රසංගයේදී චන්දිමාල් ප්‍රනාන්දු විසින් සංගීතය සපයන අයුර

3 සොඳුරු අතීතය ගී සරණිය සංගීත ප්‍රසංගයේදී ගායක **TM** ජයරත්නයන්ගේ ගීතයක් යු හමුදා තූර්ය වාදක කණ්ඩායම විසින් සංගීතවත් කරන අයුරු

4 1997-09-24 දින රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහහි ආබාධිත රණවිරුවන් වෙනුවෙන් පැව සංගීත ප්‍රසංගය සඳහා ගායක **TM** ජයරත්න සහ එම මහත්මිය පැමිණි අවස්ථාවේදී මල් කළඹක් දී පිළිගන්නා ලද අවස්ථාව

5 රෙජිමේන්තු විධායක අධිකාරී ආබාධිත රණවිරුවන්ගේ චිත්ත ධෛර්‍යය වර්ධනය කිරී සඳහා ගීතයක් ගායනා කරන අවස්ථාව

6 1997-09-24 දින රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ හි පැවති සොඳුරු අතීතය ගී සරණිය සංගී ප්‍රසංගයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් පැමිණි බ්‍රිගේඩියර් **TTR** ද සිල්වා **RWP RSP psc** විසින් ගායක **TM** ජයරත්නයන් හට සමරු පළකයක් ප්‍රදානය කරන අවස්ථා




1



2



3



4



5

1 1997-07-25 දින 1035 ට යෙදුන සුභ මොහොතින් පොල් තෙල් පහන දල්වා වැඩ භාර ගැනීම (1 ශ්‍රීලපාහ)

2 15 ශ්‍රීලපාහ ඒකකය නගා සිටුවීම - 1997-04-02 දින 09-45 පැයට යෙදුන සුභ මොහොතින් ඒකක අණදෙන නිළධාරි විසින් පොල්තෙල් පහන දල්වන අයුරු

3 හිටපු ඒකක අණදෙන නිළධාරින් සමුගැනීම (1 ශ්‍රීලපාහ)

4 15 ශ්‍රීලපාහ අණදෙන නිළධාරි විසින් 1997-04-02 දින යෙදුන සුභ මොහොතින් වැඩ භාර ගැනීම

5 7 ශ්‍රීලපාහ අණදෙන නිළධාරි සම්මාන මුරය පිළිගන්නා අයුරු